# ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමයන් කළමනාකරණය



**වාර්තා අංකය : සීඒඑස්/සී/පීර්ආර්/ඒ/ඒආර්සී/2019**

**ජාතික විගණන කාර්යාලය**

# පටුන


| අනු අංකය | විස්තරය | පිටු අංකය |
| --- | --- | --- |
| .1 | විධායක සාරාංශය | 1 |
| .2 | හැඳින්වීම | |
| 2.1 | පසුබිම | 3 |
| 2.2 | පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර හා පරමාර්ථ | 4 |
| 2.3 | විගණනය සඳහා අධිකාර බලය | 4 |
| 2.4 | විගණනය සඳහා මාතෘකාව තෝරා ගැනීමට හේතුව | 4 |
| 2.5 | විගණන ප්‍රවේශය | 5 |
| 2.6 | විගණන අරමුණ | 5 |
| 2.7 | විගණන නිර්ණායක | 5 |
| 2.8 | විගණන විෂය පථය | 6 |
| .3 | විස්තරාත්මක විගණන සොයාගැනීම් | |
| 3.1 | පුරාවස්තු උරුමය සුරක්ෂිත කිරීමට අදාළ නෛතික හා ආයතනික පසුබිම | 7 |
| 3.2 | ගවේෂණය, ලේඛනගත කිරීම හා ප්‍රකාශයට පත් කිරීම | 12 |
| 3.3 | පුරාවිද්‍යා කැණීම් කටයුතු | 23 |
| 3.4 | සංරක්ෂණය | 30 |
| 3.5 | ඛනිජ හා පාෂාණ නිස්සාරණ කටයුතු සඳහා නිර්දේශ ලබා දීම | 40 |
| 3.6 | අනාරක්ෂිත හා විනාශ වීමේ අවධානමට මුහුණ දී ඇති පුරාවිද්‍යා ස්ථාන | 47 |
| 3.7 | ප්‍රශස්ථ කාර්යමණ්ඩලයක අවශ්‍යතාවය | 62 |
| .4 | නිර්දේශ | 65 |
| 5. | ඇමුණුම් | 66 |

## 1. විධායක සාරාංශය

ශ්‍රී ලංකාවේ සමස්ත පුරාවිද්‍යාත්මක උරුමය සමන්විත වන්නේ වර්ෂ 1815 ට පෙර සමයට අයත් ස්ථාන, ස්මාරක සහ චංචල පුරාවස්තු සහ වසර සියයකට වඩා පැරණි වූ ද, පුරාවස්තු ආඥාපනත යටතේ "ආරක්ෂිත" යනුවෙන් ප්‍රකාශයට පත් කොට ඇත්තා වූ ද, ස්ථාන සහ ස්මාරකවලිනි. ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක වෙත පුරාසක්තවාදීන්ගේ ක්‍රමානුකූල උනන්දුව මතුවන්නට පටන් ගන්නේ දහනව වන සියවසේ මැද භාගයේදීය. එසමයේදී දිවයිනේ ප්‍රධාන පැරණි ස්ථාන ක්‍රමානුකූල ලෙස ගවේෂණය කිරීමට රජය පෙළඹිණි. 1890 වර්ෂයේදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලද්දේ එම කටයුතු පවත්වාගෙන යාම හා නියාමනය කරන උපරිම ආයතනය ලෙසය.

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය ජාතියේ අතීතයට අයත් භෞතික අවශේෂ දහස් ගණනක් වූ පුරාවිද්‍යා ස්ථාන, පුරාණ ස්මාරක සහ චංචල පුරාවස්තුවලින් සමන්විත වන අතර, මෙම උරුමයන් මනා ලෙස කළමනාකරණය කොට මතු පරපුරට දයාද කිරීම ජාතික අවශ්‍යතාවයක් වේ. වර්තමානයේදී සිදුවන විවිධ නීති විරෝධී ක්‍රියාකාරකම් හා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වැනි විවිධ ක්‍රියාදාමයන් හේතුවෙන් මෙම උරුමයන්හි පැවැත්මට තර්ජනයක් මතුව තිබීම හා ඒ පිළිබඳව සමාජය තුළ කතිකාවට ලක්ව තිබීම විගණනය සඳහා මෙම මාතෘකාව තෝරා ගැනිමට හේතු විය. මෙම විගණනයේ අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා උරුමයන් මනා ලෙස කළමනාකරණ කිරීම සම්බන්ධයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඇගයීම විය.

පුරාවස්තු මනා ලෙස කළමනාකරණය සඳහා අවශ්‍ය වන නෛතික පසුබිම ශක්තිමත් කිරීම සඳහා වැදගත් වන පුරාවස්තු ආඥාපනත හා ජාතික ප්‍රතිපත්තිය කාලීනව සංශෝධනය වී නොතිබීම, නිසි සැලැස්මක් මත දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම, පුරාවස්තු කළමනාකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් ඉලක්ක කල කාලය තුළ සම්පූර්ණ කර නොතිබීම, හඳුනාගත් පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරක, පැරණි ස්මාරක, පුරාවිද්‍යා රක්ෂිත ආදිය රජයේ ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම ප්‍රමාදවීම, මානව ක්‍රියාකාරකම් මගින් සිදු කරන පුරාවස්තු විනාශයන් හේතුවෙන් පුරාවස්තු වල ආරක්ෂාව සම්බන්ධයෙන් ගැටලු මතුවී තිබීම, අරමුදල් සම්පාදනය කර ගැනීමේදී පවතින අපහසුතා, සංරක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සපයා ගැනීමේ පැවති ප්‍රමාදවීම්, පුරාවිද්‍යාත්මක සම්පත් කළමනාකරණය සහ පර්යේෂණ සඳහා ඊට ප්‍රවීනතාවයන් හා නිපුණතාවයන් ඇති පලපුරුදු වෘත්තිකයන් හා පුරාවස්තු ආරක්ෂාවට ප්‍රමාණවත් මානව සම්පත සහ අනෙකුත් සම්පත් දෙපාර්තමේන්තුව සතුව ප්‍රමාණවත්ව නොමැතිවීම යන කරුණු ප්‍රධාන වශයෙන් නිරීක්ෂණය විය.

ඉහත නිරීක්ෂණ සඳහා පිළියම් ලෙස පුරාවස්තු ආඥාපනත හා ජාතික පුරාවිද්‍යා ප්‍රතිපත්තිය සංශෝධනය කිරීමට අවශ්‍ය කඩිනම් පියවර ගැනීම, ජාතික මට්ටමින් පුරාවිද්‍යා ස්ථාන වාර්තා කිරීම සඳහා දීර්ඝකාලින වැඩසටහනක් සකස් කිරීම, ගවේෂණය, ලේඛනගත කිරීම, ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම, රක්ෂිත කිරීම, කැණීම්, සංරක්ෂණය හා නඩත්තුව යන සෑම කටයුත්තකදීම එම කටයුතු නෛතික රාමුවක් තුල සිදුවීම හා එම කටයුතු අධීක්ෂණය, මෙහෙයවීම, සමාලෝචනය හා පසුවිපරම යන සෑම කාර්යයක්ම සැලසුමකට අනුව යාවත්කාලීනව සිදු කිරීම, පුරාවිද්‍යාත්මක සම්පත් කළමනාකරණය සහ පර්යේෂණ සඳහා ඊට ප්‍රවිනතාවයක් ඇති පුද්ගලයන් බඳවා ගැනීම හා ඔවුන් අදාළ කාර්යයන්හි නියුක්ත කරවීම යන නිර්දේශ මෙහිදී ඉදිරිපත් කරනු ලැබේ.

## 2. හැඳින්වීම

### 2.1 පසුබිම

ඉතා දියුණු ශිෂ්ඨාචාරයක් පැවති හා අභිමානවත් ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකාව, අමිල වටිනාකමකින් යුත් පුරාවිද්‍යා භූමි භාගවලින්ද අපරිමිත පුරාවස්තු ප්‍රමාණයකට උරුමකම් කියන්නාවූද අභිමානවත් දේශයක් වේ.

වර්ෂ 1815 මාර්තු 02 දිනට පූර්වයෙහි වූ කාලසීමාවක සිට පැවත එන්නා වූ හෝ පැවත එතැයි යුක්ති සහගතව විශ්වාස කළ හැකි හා අවුරුදු සියයකට නොඅඩු කාල පරිච්ඡේදයක් පැවතී තිබෙන හෝ පැවතී තිබෙන්නේ යැයි විශ්වාස කරනු ලබන ශ්‍රී ලංකාවේ පිහිටා තිබෙන හෝ පවතින හෝ සොයා ගනු ලබන හෝ මනුෂ්‍ය වර්ගයාගේ භෞතික උරුමයේ යම් කොටසක් පිළිබඳ ප්‍රාථමික තොරතුරු, පුරාවිද්‍යාත්මක ක්‍රමවලින් සැපයෙන මානව පැවැත්මේ සියළු ශේෂ, ලාංඡන සහ මානව ක්‍රියාකාරීත්වයේ සියළු ලක්ෂණවලට අදාළ ස්ථාන, අත්හැර දමන ලද ව්‍යුහ, පොළොව යට හා දිය යට ස්ථානද ඇතුළත්ව සියළු වර්ගවල නශ්ටාවශේෂ සහ ඒවා ආශ්‍රිත පහසුවෙන් ගෙන යා හැකි සියළු සංස්කෘතික ද්‍රව්‍ය හා ද්‍රව්‍යාත්මක සාධකයන් පුරාවිද්‍යාත්මක උරුමය ලෙස සැලකේ.

යම් නිශ්චිත පැරණි ස්මාරක සහ විනාශවීමේ හෝ ඉවත් කරනු ලැබීමේ හෝ අනතුරකට මුහුණ පා ඇතැයිද, පොදු යහපත සඳහා ආරක්ෂා කළ යුතු ආරක්ෂිත ස්මාරක යනාදී ප්‍රකාශයට පත් කළ පුරාවිද්‍යාත්මක ස්මාරක, ස්ථාන සුරක්ෂිත කිරීම පුරාවිද්‍යාත්මක උරුමයන් කළමනාකරණය කිරීමේ ක්‍රියාවලිය වශයෙන් හැඳින්විය හැකිය.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව 1890 වර්ෂයේදී ආරම්භ කර ඇති නමුත් පුරාවිද්‍යාත්මක කටයුතු පිළිබඳ මූලික වැඩ ඊට වසර ගණනකට පෙර ආරම්භ කර තිබේ. මෙසේ ආරම්භ කරන ලද පුරාවිද්‍යාත්මක කටයුතු වලින් දිවයිනේ පිහිටි බොහෝ පුරාවිද්‍යාත්මක උරුමයන් හඳුනා ගැනීම මෙන්ම ජාතියට දයාද කිරීමද සිදු වී තිබේ.

මෙවැනි පුරාවිද්‍යාත්මක උරුමයන් ආරක්ෂා කරමින් මතුපරපුරට දයාද කිරීම ජාතික වැදගත්කමකින් යුත් කාර්යයක් වන අතර, එහි විශාල වගකීම් භාරයක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සතුව පවතී.

## 2.2 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර හා පරමාර්ථ

**දැක්ම**

**------**

ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ දැක්ම වනුයේ ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය පිළිබඳ නිසි කළමනාකරණය ප්‍රවර්ධනය කිරීමයි.

**මෙහෙවර**

**----------**

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මෙහෙවර වනුයේ මෙරට පුරාවිද්‍යාත්මක උරුමය කළමනාකරණය කිරීමේ අග්‍රගණ්‍ය ආයතනය වශයෙන් සහ ප්‍රදාන නියාමන ආයතනය වශයෙන් ක්‍රියා කිරීමයි.

**පරමාර්ථ**

**----------**

සිය මෙහෙවර සපුරාලීම අරභයා ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පරමාර්ථ වී ඇත්තේ පහත සඳහන් කරුණුය.

- සංවර්ධන සම්පත්
- මානව
- ආයතනික
- සමස්ත ශ්‍රී ලංකා පුරාවිද්‍යාත්මක උරුමය පිළිබඳ ජනතාවගේ දැනුවත්භාවය වර්ධනය කිරීම.
- වැඩබිම්/ස්මාරක සහ චංචල පුරාවස්තු සංරක්ෂණය කිරීම.
- පර්යේෂණ

## 2.3 විගණනය සඳහා අධිකාරබලය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව හා 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 3(1)ඇ, 5(2), 12(ඍ) වගන්ති අනුව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 2.4 විගණනය සඳහා මාතෘකාව තෝරා ගැනීමට හේතුව

විශිෂ්ඨ ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකාවේ එම ඓතිහාසික උරුමයන් මතු පරපුර සඳහාද එලෙසම දයාද කළ යුතුව පවතී. වර්තමානයේදී සිදුවන විවිධ සාමාජීය, ආර්ථික හා වෙනත් අනීතික ක්‍රියා මෙන්ම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වැනි විවිධ ක්‍රියාදාමයන් හේතුවෙන් මෙම උරුමයන්හි පැවැත්මට තර්ජනයක් මතුව තිබීම  විගණනය සඳහා මෙම මාතෘකාව තෝරා ගැනීමට හේතු විය.

## 2.5 විගණන ප්‍රවේශය

(අ) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමග සාකච්ඡා කිරීම හා දෙපාර්තමේන්තුවේ කාර්යපටිපාටි අධ්‍යයනය කිරීම.

(ආ) 1940 අංක 09 දරණ පුරාවස්තු ආඥාපනත, 1998 අංක 24 දරණ පුරාවස්තු (සංශෝධන පනත), ජාතික පුරාවිද්‍යා ප්‍රතිපත්තිය - 2006, 2005 අංක 02 දරණ දඩමුදල් වැඩි කිරීමේ (සංශෝධන පනත), 1979 අංක 07 දරණ රජයේ සන්තකය ආපසු ලබා ගැනීමේ පනත, 2000 ඔක්තෝබර් 04 දිනැති අංක 1152/14 දරණ ගැසට් නිවේදනය, 2011 පෙබරවාරි 02 දිනැති අංක 11/0169/555/001 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය, ආයතනික කාර්යපටිපාටි හා අභ්‍යන්තර චක්‍රලේඛ අධ්‍යයනය කිරීම.

(ඇ) පුරාවිද්‍යාත්මක උරුමයන් මනා ලෙස කළමනාකරණය සඳහා ක්‍රියාත්මක වැඩ පිළිවෙල හා ඊට අදාළ විවිධ ව්‍යාපෘති වල කාර්යසාධනය පරීක්ෂාව

(ඈ) තර්ජනයට ලක්ව ඇති පුරාවස්තු පිහිටා ඇති ස්ථාන භෞතිකව නිරීක්ෂණය කිරීම.

## 2.6 විගණන අරමුණ

"ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා උරුමයන් මනා ලෙස කළමනාකරණ කිරීම සම්බන්ධයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඇගයීම."

එහිදී පුරාවිද්‍යා උරුමයන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ බලපැවැත්වෙන නෛතික ප්‍රතිපාදන හා එම කාර්යයන් ඉටු කරන ප්‍රධානතම ආයතනය වන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය පිළිබඳ මෙහිදී ගැඹුරින් සාකච්ඡා කෙරේ.

එමෙන්ම නියැදි පදනමෙන් තෝරාගත් පුරාවිද්‍යා ස්ථාන ගණනාවක හානිවීම් හඳුනාගැනීම හා මෙම සමස්ත නිරීක්ෂණ සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම මෙම විගණනයේ අරමුණ විය.

## 2.7 විගණන නිර්ණායක

(අ) 1940 අංක 09 දරණ පුරාවස්තු ආඥා පනත

(ආ) 1998 අංක 24 දරණ පුරාවස්තු (සංශෝධන පනත)

(ඇ) ජාතික පුරාවිද්‍යා ප්‍රතිපත්තිය - 2006

(ඈ) 2005 අංක 02 දරණ දඩමුදල් වැඩි කිරීමේ (සංශෝධන පනත)

(ඉ) 1979 අංක 07 දරණ රජයේ සන්තකය ආපසු ලබා ගැනීමේ පනත

(ඊ) 2000 ඔක්තෝබර් 04 දිනැති අංක 1152/14 දරණ ගැසට් නිවේදනය

(උ) 2011 පෙබරවාරි 02 දිනැති අංක 11/0169/555/001 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය

(ඌ) ආයතනික කාර්යපටිපාටි හා අභ්‍යන්තර චක්‍රලේඛ

## 2.8 විගණන විෂය පථය

පහත සඳහන් සීමාවන් තුළ මෙම විගණන කාර්යය ඉටු කරන ලදී.

(අ) මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 3000-3200) අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි.

(ආ) මෙම විගණනයේදී පුරාවිද්‍යා උරුමයන්ට දැඩි බලපෑමක් ඇතිකර ඇති උතුරු නැගෙනහිර හා උතුරු මැද පළාත් වල තෝරාගත් ප්‍රදේශ වල දැනට හඳුනාගෙන ඇති, හඳුනාගෙන නොමැති වශයෙන් හා එම උරුමයන් විනාශ වූ ස්ථාන නියැදි පදනමින් භෞතික පරීක්ෂාවට ලක්කරන ලදි.

## 3. විස්තරාත්මක විගණන සොයා ගැනීම්

### 3.1 පුරාවස්තු උරුමය සුරක්ෂිත කිරීමට අදාළ නෛතික හා ආයතනික පසුබිම

#### 3.1.1 ජාතික ප්‍රතිපත්තිය

**(අ) ජාතික ප්‍රතිපත්තිය යටතේ වූ කාර්යය**

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජාතික පුරාවිද්‍යා ප්‍රතිපත්තිය - 2006 " මැයෙන් 2008 ඔක්තෝබර් 20 දිනැති අංක 1572/4 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ජාතික ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කර තිබුණි.

ශ්‍රී ලංකාවේ සමස්ත පුරාවිද්‍යාත්මක උරුමය මනා ලෙස කළමනාකරණයේ අභිවෘද්ධිය සඳහා ක්‍රියාකාරී සැලසුමට රාමුවක් සැකසීම ජාතික පුරාවිද්‍යා ප්‍රතිපත්තියේ දැක්ම වශයෙන් හඳුන්වා දී තිබුණි.

මේ යටතේ පහත අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක ගත කර තිබුණි.

i. ආයතනික හා මානව සම්පත් ප්‍රවර්ධනය
ii. සමස්ත පුරාවිද්‍යාක්මක උරුමයේ ආරක්ෂණය
iii. පුරාවිද්‍යාත්මක ස්ථාන, ස්මාරක සහ චංචල පුරාවස්තු ලේඛනගත කිරීම.
iv. පුරාවිද්‍යාත්මක උරුමය පිළිබඳ මහජන දැනුම ප්‍රවර්ධනය කිරීම.
v. පුරාවිද්‍යාත්මක ස්ථාන, ස්මාරක සහ චංචල පුරාවස්තු සංරක්ෂණය සහ නඩත්තුව.
vi. පුරාවිද්‍යාත්මක පර්යේෂණ සිදු කිරීම.

**(ආ) ජාතික ප්‍රතිපත්තිය යාවත්කාලීන වීම**

ජාතික පුරාවිද්‍යා ප්‍රතිපත්තිය හඳුන්වාදී මේ වන විට වර්ෂ 10 කට වැඩි කාලයක් ගත වී තිබුණද, එහි වූ අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අවධානය යොමු කර නොතිබුණි. ඊට අදාළ පුරාවිද්‍යාත්මක උරුමයන් කළමනාකරණය කිරීමට අපොහොසත් වී තිබූ බවට වූ නිරීක්ෂණ මෙම වාර්තාවේ පසු ඡේද වල දැක්වේ. මෙහිදී විශේෂයෙන් නිරීක්ෂණය වූයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව 1890 වර්ෂයේදී ස්ථාපිත කර ජාතික පුරාවිද්‍යා ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කිරීම සඳහා වර්ෂ 118 ක කාලයක් ගත වී තිබුණි. නමුත් මේ දක්වා එය ඉටුවී නොමැති බව මෙන්ම වර්තමානයට ගැලපෙන අයුරින් ජාතික ප්‍රතිපත්තිය යාවත්කාලීන වී නොතිබුණි.

### 3.1.2 1998 අංක 24 දරන පුරාවස්තු (සංශෝධන) පනතින් සංශෝධිත 1940 අංක 09 දරන පුරාවස්තු ආඥා පනත

**(අ) නෛතික ප්‍රතිපාදන ඇතුලත්වීමේ ප්‍රමාණවත් බව**

1940 අංක 09 දරන පුරාවස්තු ආඥා පනතේ වූ විධිවිධාන ශක්තිමත් කිරීම වෙනුවෙන් 1998 අංක 24 දරන පුරාවස්තු (සංශෝධන) පනතින් මුල් ආඥාපනතේ වගන්ති සංශෝධනය හා නව වගන්ති ඇතුළත් කර බල ගන්වා තිබුණද, මුල් ආඥාපනතට සිදු කළ එම සංශෝධනයන් තුළින්ද පුරාවිද්‍යාත්මක උරුමයන් මනා කළමනාකරණය සඳහා ප්‍රමාණවත් මට්ටමක නෛතික ප්‍රතිපාදනයන් ඇතුළත් වී නොතිබුණි.

මේ හේතුවෙන් පහත සඳහන් පරිදි පුරාවිද්‍යා උරුමයන් රැක ගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට නොහැකි වී තිබුණි. තවද, මේ පිළිබඳ යම් යම් ක්‍රියාමාර්ග ගෙන ඇති බවට පැහැදිලි කර ඇති නමුත් පුරාවිද්‍යා උරුමය විනාශ වීමේ නැඹුරුව වැඩි වී ඇති නිසා එම පියවරයන් පුරාවිද්‍යා උරුමයන් සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් දායකත්වයක් ලබා දී නොතිබුණි.

- i. අවිධිමත් මානව ක්‍රියාකාරකම් තුළින් පුරාවස්තුවලට සිදුවන හානි නිසා පුරාවස්තු විනාශය වළක්වා ගැනීම හා පාලනය කිරීම
- ii. පුරාවස්තු සොරකම් අවම කිරීම හා පුරාවස්තු සුරක්ෂිත කිරීම
- iii. පුරාවස්තු සෙවීම සඳහා අනවසර කැණීම් හා ඉඳි කිරීම් වළක්වා ගැනීම
- iv. පුරාවස්තු සොරකම් හා විනාශ කරනු ලබන තැනැත්තන් නීතියේ රැහැනට හසුකර ගැනීම
- v. පෞද්ගලික පාර්ශවයන් සන්තකයේ පවතින පුරාවස්තු කළමනාකරණය
- vi. ගවේෂණ හා පර්යේෂණ කටයුතු ඉටු කිරීම
- vii. පුරාවිද්‍යා භූමි කඩිනමින් වෙන් කර ගැනීම හා ලේඛනගත කිරීම විධිමත් කිරීම
- viii. පුරාවිද්‍යා ස්මාරක සංරක්ෂණයේදී නිලධාරීන්ට සිදුවන අවහිරතා මඟ හරවා ගැනීම

**(ආ) පුරාවස්තු උරුමයන් සම්බන්ධ හානිවීම් ඉහළ යාම**

පුරාවිද්‍යාත්මක උරුමයන් මනා කළමනාකරණය සඳහා ප්‍රමාණවත් මට්ටමක නෛතික ප්‍රතිපාදනයන් ඇතුළත් වී නොතිබීම, මානව සම්පත හා අනෙකුත් සම්පත් වල හිඟතාවය ඉහළයමින් පැවතීම මෙහිදී නිරීක්ෂණය විය. ඒ අනුව පසුගිය වසර කිහිපය තුළදී සිදු වී ඇති පුරාවස්තු හානිවීම් සහ අදාළ පාර්ශව වෙතින් ඒ සඳහා අයකර ඇති දඩ මුදල් සැලකිය යුතු මට්ටමකින් වැඩිවීමක් සිදුවී තිබීම මෙම තත්ත්වය තවදුරටත් සනාථ කරයි.

| | වර්ෂය |  |  |  |
|---|---|---|---|---|
| | 2019 ජූනි 30 දිනට | 2018 | 2017 | 2016 |
| පුරාවස්තු පනත කඩකර සිදුකළ වැරදි සංඛ්‍යාව | 163 | 332 | 290 | 203 |
| පුරාවස්තු විනාශය පිළිබඳ වැරදි සඳහා පැවරූ අධිකරණ නඩුවලට අදාළව සැකකරුවන්/ වැරදිකරුවන්ගේ සංඛ්‍යාව | 464 | 824 | 631 | 565 |
| පුරාවස්තු වැරදි සඳහා අධිකරණ මගින් අයකර ගත් දඩ මුදල (රු.) | 7,628,500 | 21,884,000 | 18,983,000 | 21,295,800 |

(ඇ) මෙම තත්ත්වය මත නැවතත් පුරාවස්තු ආඥාපනත සංශෝධනයන් සඳහා දෙපාර්තමේන්තුවේ අවධානය 2019 වර්ෂයේදී යොමු වී තිබුණු අතර, එම සංශෝධනයන් ඉතුක් කාලපරිච්ඡේදයන්වල සිදු කළේ නම් වඩාත් කාලෝචිත බවත්, ඒ සඳහා දීර්ඝ කාල ප්‍රමාදයන් සිදු වී ඇති බවත්, නිරීක්ෂණය විය.

(ඈ) කෙසේ වෙතත් පුරාවස්තු පනතේ පවතින අඩුපාඩු මගහරවා ගැනීම සඳහා යාවත්කාලීන කිරීම වෙනුවෙන් නව විධිවිධානයන් ඇතුළත් කිරීමට මේ වන විට ආඥාපනතට සංශෝධනයන් කෙටුම්පත් කර තිබුණි.

### 3.1.3 පුරාවිද්‍යාත්මක උරුමය කළමණාකරණයේ උපරිම ආයතන

**(අ) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයින්ගේ සභාව**

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා උරුමයන් කළමනාකරණ ක්‍රියාවලියේ ප්‍රතිපත්ති සම්පාදනය හා ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධ උපරිම ආයතනය ලෙස 1940 අංක 9 දරන පුරාවස්තු ආඥාපනත මගින් බල ගන්වා ඇත්තේ පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් තනතුර හොබවන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවයි.

ඒ අනුව ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමයන් කළමණාකරනය කිරීමේ ක්‍රියාවලියේ ප්‍රතිපත්ති සම්පාදනය හා ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධ උපරිම ආයතනය ලෙස පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කටයුතු කරයි.

**(ආ) අනෙකුත් ආයතන හා ක්‍රියාත්මක ඒජන්සි**

ද්විතියික ක්‍රියාත්මක ඒජන්සි වශයෙන් මධ්‍යම සංස්කෘතික අරමුදල, පුරාවිද්‍යාව පිළිබඳ ගෞරව උපාධි හා පශ්චාත් උපාධි පිරිනමන විශ්ව විද්‍යාල, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව සහ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලැබේ.

විශ්ව විද්‍යාල, සංස්කෘතික උරුමය පිළිබඳව කටයුතු කරන පදනම්, භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව, පූජා භූමි සංවිධාන, දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම් හා ග්‍රාම නිලධාරී, පොලිස් දෙපාර්තමේන්තුව, භූවිද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය, වනජීවී දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, නීතිපති දෙපාර්තමේන්තුව, සංචාරක මණ්ඩලය යනාදී රාජ්‍ය ආයතන සහ පුරාවිද්‍යා ස්වේච්ඡා සංවිධාන, පන්සල්, වෙනත් ආගමික ආයතන, වෘත්තීය නොවන පුරාවිද්‍යාඥයන් ඇතුළු පෞද්ගලික අංශ තෘතියික ක්‍රියාත්මක ඒජන්සිවලට අයත් වේ.

**(ඇ) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව අයත් අමාත්‍යාංශයේ කාර්යභාරය**

පුරාවිද්‍යා උරුමය කළමනාකරණයේදී පුරාවස්තු ආඥාපනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හා බලගැන්වීමේ කාර්යය සඳහා නියෝග සෑදීම, ඒවායේ ක්‍රියකාරී තත්ත්වය අධීක්ෂණය, පුරාවිද්‍යාත්මක කටයුතු සඳහා රජයේ වාර්ෂික ප්‍රතිපාදන ලබාදීම, භෞතික හා මානව සම්පත් සහ යටිතල පහසුකම් ලබාදීම යනාදී කාර්යභාරයන් ඉටු කිරීමේ වගකීම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව අයත් අමාත්‍යාංශයට පැවරී ඇත. එසේ වුවද අදාල ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම, මානව සම්පත් පිළිබඳ ගැටලු හේතුවෙන් දෙපාර්තමේන්තුවේ කාර්යය ඉටුකිරීමට බාධාවන් පැවතුණි.

### 3.1.4 මධ්‍යම සංස්කෘතික අරමුදල

**(අ) අරමුදල් සම්පාදනය සඳහා දායකත්වය**

1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 8 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සංස්කෘතික ස්මාරක සංවර්ධනය කිරීමේදි දරන ලද වියදම් පියවීම සඳහා මුදල් යෙදවීම මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රධාන කාර්යයන් අතර විය. මේ අනුව පුරාවිද්‍යාත්මක උරුමයන් කළමනාකරණයේදී අරමුදල් සම්පාදනය කරදීම සඳහා දායකත්වය ලබා දී තිබුණි.

එම දායකත්වය නෛතික වශයෙන් නිශ්චිත කරලීම වෙනුවෙන් පුරාවිද්‍යාත්මක ස්ථානවල නඩත්තුව හා කළමනාකරණය සඳහා "පුරාවිද්‍යා උරුම කළමනාකරණ භාරය නමින් අරමුදලක් පිහිටුවීම" යන මැයෙන් 2011 ජනවාරි 18 දිනැති අංක 11/0169/555/004 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර තිබුණු අතර, ඒ සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් උපයා ගනු ලබන ආදායමින් සියයට 25 ක් පුරාවිද්‍යා ස්ථාන පවත්වාගෙනයාම හා පුරාවිද්‍යාත්මක උරුමය කළමනාකරණය සඳහා එවකට පැවති ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය ලබා දිය යුතු බව අමාත්‍ය අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණි. එසේ වුවත් එම අරමුදල පිහිටුවීමට

කටයුතු නොකර පුරාවිද්‍යාත්මක නඩත්තු හා කළමනාකරණ ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමට පමණක් කටයුතු කර මධ්‍යම සංස්කෘතික අරමුදල අනුමත කරන ලද ව්‍යාපෘති සඳහා පමණක් අරමුදල් ලබා ගැනීමට කටයුතු කර තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂ 04 කට අදාළව ලබා ගත යුතු හා ලබා ගත් මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | 2018 රු. මිලියන | 2017 රු. මිලියන | 2016 රු. මිලියන | 2015 රු. මිලියන |
|---|---|---|---|---|
| මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රවේශ පත්‍ර ආදායම | 4,253.64 | 3,829.26 | 3,445.93 | 2,751.06 |
| පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත ලැබිය යුතු සියයට 25 මුදල | 1,063.41 | 957.32 | 861.48 | 687.77 |
| අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි පුරාවිද්‍යාත්මක උරුම කළමනාකරණයට අඩුවෙන් ලබා ගත් මුදල | 571.28 | 764.26 | 756.99 | 547.93 |

මේ අනුව පුරාවිද්‍යාත්මක උරුම කළමනාකරණ කටයුතු වෙනුවෙන් පසුගිය වර්ෂ 04 කට අදාළව එකතුව රු.මිලියන 2,640.46 ක මුදලක් මධ්‍යම සංස්කෘතික අරමුදලින් ලබා ගැනිමට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණු බව නිරීක්ෂණය විය.

**(ආ) අරමුදල් උපයෝජනය**

පුරාවිද්‍යාත්මක උරුමය කළමනාකරණය කිරීම සඳහා ලබා දුන් අරමුදල්වලට අදාළ ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය, කටයුතු අවසන් නොකිරීම, භෞතික කාර්යසාධනයේ දුර්වල ප්‍රගතිය, නෛතික ප්‍රතිපාදන පරිදි ලැබිය යුතු මුදල් නොලැබීම ඉහත තත්ත්වයන්ට හේතු වී තිබුණු බව නිරීක්ෂණය විය. ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීමේදී කාර්යසාධනයේ ප්‍රගතිය දුර්වලවීම මත මධ්‍යම සංස්කෘතික අරමුදලින් ලැබී තිබුණු මුදල්ද උපයෝජනය නොකර දීර්ඝ කාලයක් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණු බව නිරීක්ෂණය විය. 2018 දෙසැම්බර් 31 දිනට උපයෝජනය නොකර දීර්ඝ කාලයක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණු මුදල් වර්ෂ 1-3 දක්වා කාල පරාසයට අයත් රු.මිලියන 83.66 ක්ද වර්ෂ 3-5 දක්වා කාල පරාසයට අයත් රු.මිලියන 16.20 ක්ද විය.

### 3.2 ගවේෂණය, ලේඛනගත කිරීම හා ප්‍රකාශයට පත් කිරීම

#### 3.2.1 පුරාවිද්‍යාත්මක උරුමයන් හඳුනා ගැනීම

ගොඩබිම හෝ සමුද්‍රයේ පිහිටා ඇති නිශ්චල හා චංචල පුරාවිද්‍යාත්මක උරුමයන් හඳුනා ගැනීම, වාර්තාගත කිරීම, පුරාවිද්‍යා ස්ථානයන්ට සිදුවන බලපෑම් තක්සේරු කිරීම, පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක ප්‍රකාශයට පත් කිරීම, පුරාවස්තු විනාශය, සොරා ගැනීම්, අවභාවිතය වැළැක්වීම, අහඹු ලෙස අනාවරණය වන පුරාවස්තු පිළිබඳව ආඥාපනතේ විධිවිධාන ක්‍රියාවට නැගීම, භූගෝලීය දත්ත පද්ධතිය සැකසීම හා යාවත්කාලීනව පවත්වාගෙන යාම, ඛණිජ හා පාෂාණ නිස්සාරණ කටයුතු සඳහා නිර්දේශ ලබාදීම වැනි පුරාවිද්‍යා උරුමයන් මනා ලෙස කළමනාකරණය සඳහා අවශ්‍ය වන කාර්යය ගණනාවක් පුරාවිද්‍යා ගවේෂණ අංශය විසින් ක්‍රියාත්මක කළ යුතුය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ.

**(අ) විවිධ හේතූන් යටතේ හඳුනාගත් පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක පිළිබඳ වාර්තා කිරීම**

කළමනාකරණ අරමුණු සඳහා ජාතික මට්ටමින් දිවයින පුරා ක්‍රියාත්මක කරනු ලබන ගවේෂණ සඳහා පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක හඳුනා ගැනීම හා වාර්තාගත කිරීම, ජනාවාසකරණය හේතුවෙන් බලපෑමට ලක්ව ඇති, පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් පුරාවස්තු කෙරෙහි තර්ජනයක් එල්ල වී ඇති හා මිනිසා විසින් සවිඥානිකව සිදු කරන පුරාවස්තු විනාශයන් අධික ප්‍රදේශ සහ රාජ්‍ය ප්‍රමුඛතා යනාදී නිර්ණායක ඉවහල් කර ගත යුතුවේ.

එසේ හඳුනා ගත් ඉඩම් විධිමත් ගවේෂණයකට ලක් කර එම භූමියට ප්‍රේරණ කලාපයක් අවශ්‍ය වේ නම් එයද ඇතුළත් කර දළ සැලැස්මක් සහ සීමාවන්ට අදාළ GPS කාණ්ඩාංකයක්ද සහිත විස්තරාත්මක වාර්තාවක් ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂකගේ නිර්දේශයෙන් ගවේෂණ හා ලේඛනගත කිරීම් අධ්‍යක්ෂවරයා විසින් ලබා ගෙන භූමිය සඳහා මැනුම් නියෝගයක් නිකුත් කරන ලෙස අදාළ ප්‍රාදේශීය ලේකම්ට දැනුම්දිය යුතුය.

**(ආ) පුරාවිද්‍යා උරුමයන්ට සිදුවී ඇති බලපෑම මත ප්‍රමුඛත්වය ලබාදීම**

යම් නිශ්චිත භූමි ප්‍රදේශයක් හෝ ස්ථානයක් ආවරණය වන පරිදි ශාස්ත්‍රීය ප්‍රතිඵල ලබා ගැනීම සඳහා හෝ ප්‍රදේශයේ හෝ ස්ථානයේ පවතින පුරාවිද්‍යාත්මක උරුමය හා පාරිසරික දත්ත හඳුනා ගැනීමේ සහ විස්තීර්ණ ලෙස වාර්තාගත කිරීමේ අරමුණින් විස්තීර්ණ ගවේෂණ සිදු කළ යුතු වේ. භූමි ප්‍රදේශ හා ස්ථාන තෝරා ගැනීමේදී නූතන ජනාවාසකරණය තුළින් පුරාවිද්‍යා උරුමයට සිදුවී ඇති බලපෑම පිළිබඳව ප්‍රමුඛත්වය දක්වා ව්‍යාපෘති මෙහෙයුම් හා අධීක්ෂණ කාර්යය පටිපාටිවල රීති ප්‍රකාරව විස්තීර්ණ

ගවේෂණ නිර්ණය කළ යුතුව තිබුණි. එසේ වුවත් ඉකුත් කාලපරිච්ඡේදවලදී ක්‍රියාත්මක කර තිබුණු පුරාවිද්‍යා ගවේෂණවලදී විධිමත් පරිදි භූමි ප්‍රදේශ හා ස්ථාන පිළිබඳ පූර්ව නිර්ණයන් සිදු කර නොතිබුණි.

### 3.2.2 පුරාවිද්‍යාත්මක උරුමයන් හඳුනා ගැනීම සඳහා සැලසුම් කිරීම

ජාතික මට්ටමින් පුරාවිද්‍යා ස්ථාන වාර්තා කිරීම සඳහා දීර්ඝකාලීන වැඩසටහන් පිළියෙල කළ යුතු අතර, එහි එක් එක් වර්ෂය තුළ ගවේෂණය කරනු ලබන ප්‍රදේශ හා වර්ග කිලෝමීටර් ප්‍රමාණය, එම එක් එක් ප්‍රදේශය තෝරා ගැනීමට හේතුව, ගවේෂණය සිදු කරන කාල රාමුව, යනාදී තොරතුරු අන්තර්ගත විය යුතුය. නමුත් විධිමත් වැඩසටහන් අනුව පුරාවිද්‍යා ගවේෂණ කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 3.2.3 පුරාවිද්‍යා ස්මාරක, ස්ථාන හා වෙන් කළ තහනම් ඉඩම් වාර්තාගත කිරීම හා ප්‍රකාශයට පත් කිරීම.

**(අ) ආකෘති සම්පූර්ණ කිරීම, අවශ්‍ය තැන් වලට යොමු කිරීම හා ලේඛන පවත්වා ගැනීම**

ආරක්ෂිත ස්මාරක හා තහනම් ඉඩම් වශයෙන් ප්‍රකාශයට පත්කිරීමට අවශ්‍ය වන්නා වූ උරුමයන් සම්බන්ධයෙන් ගලේ. 15,16 ආකෘති පත්‍ර සම්පූර්ණ කොට ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂ/ විෂය භාර සහකාර අධ්‍යක්ෂ මගින් ගවේෂණ හා ලේඛනගත කිරීම් අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතුය.

ගවේෂණ හා ලේඛනගත කිරීමේ කාර්ය පටිපාටියේ විධිවිධාන පරිදි ස්ථාන සහ ස්මාරක වාර්තාගත කිරීම් පිළිබඳ තොරුතුරු ඇතුළත් කිරීම සඳහා ප්‍රාදේශීය කාර්යාල හා ප්‍රධාන කාර්යාලයේ ගවේෂණ හා ලේඛනගත කිරීම් අංශය මඟින් දිස්ත්‍රික් ලේඛනයක් විෂයභාර නිලධාරියා විසින් (ගලේ. 02 ලේඛනය) පවත්වාගෙන යා යුතුය.

පුරාවස්තු සහිත රජයේ ඉඩම් හඳුනා ගෙන, ගවේෂණ හා ලේඛනගත කිරීම් ගලේ.17 ආකෘතිය මගින් ප්‍රධාන කාර්යාලයේ ගවේෂණය හා ලේඛගත කිරීමේ අංශය වෙත යොමු කළ යුතු අතර, එය ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂවරයාගේ වගකීම වේ.

**(ආ) විධිමත් දත්ත ගොනුවක් පවත්වාගෙන යාම**

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය හඳුනා ගැනීම වෙනුවෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ස්ථාපනය කළ 1890 වර්ෂයේ සිට මේ දක්වාම ගවේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණු අතර, එම ගවේෂණ පිළිබඳ විධිමත් දත්ත ගොනුවක් හෝ පද්ධතියක් පිළියෙල කර නොතිබුණි.

**(ඇ) පුරාවිද්‍යා රක්ෂිතයන්**

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ස්ථාපනය කළ 1890 වර්ෂයේ සිට මේ දක්වා වර්ෂ 128 ක කාලයක් තුළ ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 ට අදාළ රජයේ ගැසට් මඟින් ප්‍රකාශයට පත් කළ පැරණි හ ආරක්ෂිත ස්මාරක, වෙන් කළ පුරාවිද්‍යා තහනම් ඉඩම් හා පුරාවිද්‍යා රක්ෂිත පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | |
|---|---|
| පුරාවිද්‍යා පැරණි හා ආරක්ෂිත ස්මාරක | 2,712 |
| වෙන් කළ පුරාවිද්‍යා තහනම් ඉඩම් | 227 |
| පුරාවිද්‍යා රක්ෂිත | 174 |

පුරාවිද්‍යා රක්ෂිතය ප්‍රකාශයට පත්වීමෙන් පසු එම ගැසට් නිවේදනයේ පිටපත් අදාළ දිස්ත්‍රික් ලේකම්ට, ප්‍රාදේශීය ලේකම්ට, ග්‍රාම නිලධාරීට, යොමු කිරීමට විෂය භාර සහකාර අධ්‍යක්ෂවරයා විසින් කටයුතු කළ යුතුය.

**3.2.4 පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වූ ගවේෂණ කටයුතු**

විස්තර පහත පරිදි විය.

**(අ) ගවේෂණ කටයුතු හඳුනා ගැනීම**

පොළොන්නරුව දිස්ත්‍රික්කය පුරා ස්මාරක, ආරක්ෂිත ස්මාරක, පුරාවිද්‍යා රක්ෂිත යනාදී පුරාවිද්‍යාත්මක සාධක පවතින ස්ථාන හා ප්‍රදේශ හඳුනා ගැනීම වෙනුවෙන් ගවේෂණ කටයුතු 2018 වර්ෂය තුළ ක්‍රියාත්මක වී නොතිබුණි.

2018 අයවැය ප්‍රතිපාදන මගින් "ගවේෂණ අංශයේ කාර්යයභාරය" යනුවෙන් පොළොන්නරුව දිස්ත්‍රික්කය සඳහා රු.300,000 ක මුදලක් පමණක් වෙන්කර තිබුණු අතර එම ප්‍රතිපාදන උපයෝජනය කිරීමට අදාළ ගවේෂණ කටයුතු නිශ්චිතව හඳුනා ගෙන නොතිබුණි. එසේම 2019 වර්ෂය සඳහා ප්‍රතිපාදන, වෙන් කිරීම් කර නොතිබුණු හෙයින් ගවේෂණ කාර්යයභාරය වෙනුවෙන් ප්‍රමුඛතාවය ලබා දී නොතිබුණු බව නිරීක්ෂණය විය.

**(ආ) භෞතික ප්‍රගතිය**

2018 වර්ෂයේ ප්‍රතිපාදන වලට අදාළ සියයට 54 ක මූල්‍ය ප්‍රගතියක් හා සියයට 95 ක භෞතික ප්‍රගතියක් සාක්ෂාත් කරගෙන ඇති බව විගණනයට ඉදිරිපත් කර තිබුණද, ඛනිජ හා පාෂාණ නිස්සාරණ බලපත්‍ර නිර්දේශ ලබා දීම, අනවසර කැණීම් පරීක්ෂාව යනාදී කටයුතු වෙනුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කර එය ගවේෂණය අංශයේ මූල්‍ය ප්‍රගතිය ලෙස දක්වා තිබුණි. එසේම ලබා තිබුණු භෞතික ප්‍රගතිය ඉහත කටයුතු

ක්‍රියාත්මක කිරීම තුළින් ලබාගෙන තිබුණු නමුත් ගවේෂණ කටයුතු ක්‍රියාත්මක කිරීම තුළින් ලබා ගත් භෞතික ප්‍රගතියක් නොවන බව නිරීක්ෂණය විය.

**(ඈ) හඳුනාගත යුතුව තිබූ සාපේක්ෂ තත්ත්වය**

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පිහිටි ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 07 කට අයත් භූමි ප්‍රමාණය හෙක්ටයාර් 346,659.29 ක් වුවද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ස්ථාපිත කර ගතවූ වර්ෂ 128 ක කාලය තුළ එම ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශ ආශ්‍රිතව පිහිටුවා තිබුණු පුරාවිද්‍යා කලාප කාර්යාල බල ප්‍රදේශ 04 හි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 7 ක පුරාවිද්‍යාත්මක සාධක පවතින බවට හඳුනාගත් පුරාවිද්‍යා රක්ෂිත භූමි ප්‍රමාණය හෙක්ටයාර් 1,335.61 ක් පමණක් විය. එය මුළු ප්‍රමාණයෙන් සියයට 0.38 ක අවම ප්‍රතිශතයක් විය. 2016 හා 2017 වර්ෂ වලදී හඳුනාගත් පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක ගණන පිළිවෙලින් 73 ක් හා 21 ක් විය.

**(ඇ) තොරතුරු පද්ධතියක අවශ්‍යතාවය**

2016 වර්ෂයට පෙර කාලයේදී හඳුනාගත් පුරාසාධක පවතින ප්‍රදේශ පිළිබඳ වාර්තා කිරීම පිළිබඳව තත්ත්වය ඉතා දුර්වල බව නිරීක්ෂණය විය. මේ හේතුවෙන් මෙතෙක් හඳුනාගෙන ඇති ස්ථාන හා ප්‍රදේශ ඇතුළත් තොරතුරු පද්ධතියක් පිළියෙළ කිරීමට අපොහොසත් වී තිබුණි.

**(ඉ) ගවේෂණ වලින් අනාවරණය කෙරෙන විනාශවීම්**

එසේම පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව, දිඹුලාගල, වැලිකන්ද, ලංකාපුර, ඇලහැර- බකමූණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බලප්‍රදේශ වල 2017 වර්ෂයේදී ගවේෂණය කළ ප්‍රදේශ හා ස්ථාන 21 අතුරින් ස්ථාන 08 කම පුරාවිද්‍යාත්මක ස්මාරක හා පුරා සාධක වල විනාශ වීම හා විකෘති වීම සිදු වී තිබුණු බව 2017 වර්ෂයේදී අනාවරණය කර තිබුණි. නිදන් හොරුන්ගේ අනවසර කැණීම්, ප්‍රදේශවාසී ජනතාව ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම්, යාබද පදිංචිකරුවන් ස්මාරකයන්හි ගල්පුවරු හා ගඩොල් ගලවා තම පෞද්ගලික කාර්යයන්ට යොදා ගැනීම, කුඹුරු හා හේන් වගාවන්, මහවැලි අධිකාරිය විසින් වගාකිරීම සඳහා ඉඩම් ලබා දීම, රජයේ සංවර්ධන කටයුතු යනාදී කරුණු එම පුරාවස්තු විනාශයන්ට හේතු වී තිබුණු බව ගවේෂණවලින් අනාවරණය කර ගෙන තිබුණි.

**(ඊ) හඳුනා ගැනෙන පුරාවිද්‍යා ස්ථාන ගැසට් කිරීම**

2019 ජුනි 30 දින වන විට රජයේ ගැසට් මගින් ප්‍රකාශයට පත් කර තිබුණේ ආරක්ෂිත හා පැරණි ස්මාරක 21 ක් සහ පුරාවිද්‍යා රක්ෂිත 03 ක් පමණකි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අනුව ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ආරක්ෂිත හා පැරණි ස්මාරක | පුරාවිද්‍යා රක්ෂිත |
|---|---|---|
| තමන්කඩුව | 08 | 02 |
| මැදිරිගිරිය | 04 | - |
| හිඟුරක්ගොඩ | 01 | - |
| වැලිකන්ද | 04 | - |
| දිඹුලාගල | 03 | 01 |
| ලංකාපුර | 01 | - |
| ඇලහැර - බකමූණ | - | - |
| එකතුව | 21 | 03 |

මේ අනුව පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරක, පැරණි ස්මාරක, පුරාවිද්‍යා රක්ෂිත රජයේ ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම සිදු වී තිබුණේ අවම වශයෙන් විය.

ඒ අනුව පොළොන්නරුව දිස්ත්‍රික්කයේ 2016 හා 2017 වර්ෂ වලදී පමණක් හඳුනාගත් පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරක, පැරණි ස්මාරක හා පුරාවිද්‍යා රක්ෂිත 94 රජයේ ගැසට් මගින් ප්‍රකාශයට පත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. එම පුරාවිද්‍යාත්මක ස්ථාන හා ප්‍රදේශ හඳුනා ගෙන තිබුණේ 2016 හා 2017 වර්ෂයේදී වුවත් ඒ සඳහා වර්ෂ 02 කට වැඩි කාලයක් ගතවී තිබුණද ඒවා ප්‍රකාශයට පත් නොකිරීම තුළින් පුරාවිද්‍යා ස්මාරක වලට හානි වීම හා බලපෑම් බහුලව සිදු වී ඇති බවත් නිරීක්ෂණය විය.

**3.2.5 අම්පාර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වූ ගවේෂණ කටයුතු**

**(අ) පුරාවිද්‍යා උරුමයන් හඳුනාගැනීම**

2019 වර්ෂය හා ඉකුත් වර්ෂ හතරක කාලය තුළ අම්පාර දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යා ස්මාරක, ආරක්ෂිත ස්මාරක, පුරාවිද්‍යා රක්ෂිත හා පුරාවිද්‍යාත්මක සාධක පවතින ස්ථාන හා ප්‍රදේශ හඳුනා ගැනීම සඳහා ගවේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ආ) මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනය**

ගවේෂණ අංශයේ ව්‍යාපෘති සඳහා වාර්ෂික ප්‍රතිපාදන වෙන්කිරීම හා උපයෝජනය පිළිබඳව 2018 හා 2019 වර්ෂයන් හි කාර්යය භාරය පරීක්ෂාවේදී පහත තත්ත්වයන් නිරීක්ෂණය විය.

i. ස්ථාන පරීක්ෂාව හා ක්ෂේත්‍ර කටයුතු වෙනුවෙන් 2018 වර්ෂය සඳහා රු.315,000 ක මුදලක් වෙන්කර තිබුණද එම මුදල් උපයෝජනයට අවශ්‍ය ගවේෂණ කටයුතු හඳුනා ගැනීමක් සිදුකර නොතිබුණි. එසේම අදාළ මුදලින් රු.307,109 ක් වර්ෂය තුළ වැයකර ඇති අතර එම වියදම් දරා තිබුණේ කැණීම් සහ ඛනිජ නිස්සාරණ

බලපත්‍ර නිකුත් කිරීමට අදාළ ක්ෂේත්‍ර පරීක්ෂාවන්ට යාම සඳහා ගමන් වියදම් වෙනුවෙනි. එහෙත් එම වියදම් ගවේෂණ අංශයේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය වශයෙන් දක්වා තිබුණි.

ii. 2019 වර්ෂය සඳහාද ඉහත පරිදිම ස්ථාන පරීක්ෂාව හා ක්ෂේත්‍ර කටයුතු සඳහා රු.200,000 ක මුදලක් වෙන්කර තිබුණු අතර සැප්තැම්බර් මාසය වනවිට රු.60,694 ක් වැය කර තිබුණි. එම වැය කිරීම්ද අනවසර කැණීම් පරීක්ෂාව සඳහා සහ ඛනිජ නිස්සාරණ බලපත්‍ර නිකුත් කිරීමට අදාල ක්ෂේත්‍ර පරීක්ෂාවන් සඳහා ගමන් වියදම් වෙනුවෙන් වැය කිරීමකි.

iii. 2019 වර්ෂයේ අම්පාර ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාල මගින් දිශා වැව් බැම්ම සහිත ප්‍රදේශය හා නුවරගල කන්ද අදියර - 1 ගවේෂණ කටයුතු ක්‍රියාත්මක කිරීමට අනුමැතිය සඳහා ප්‍රධාන කාර්යාලයට යොමුකර තිබුණද ඊට අවශ්‍ය අනුමැතිය නොලැබීම මත එම ගවේෂණ කටයුතු ක්‍රියාත්මක කිරීමද කර නොතිබුණි.

**(ඇ) ගවේෂණයට අදාල සැලසුම්**

පුරාවිද්‍යා සාධක පවතින ප්‍රදේශ හා ස්ථාන ගවේෂණය කිරීම මගින් හඳුනාගෙන රක්ෂිත කිරීම, පුරාවස්තු කළමනාකරණයේ ප්‍රධානතම හා මූලික සාධකයකි. එසේ වුවද අම්පාර දිස්ත්‍රික්කයේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 ක් ඇතුලත් පුරාවිද්‍යා කලාප කාර්යාල 05 තුළ පවතින පුරාවස්තු හඳුනා ගැනීම් හා රක්ෂිත කිරීම් මායිම් තීරණය කිරීම්, කැණීම් හා සංරක්ෂණය කිරීම් නිශ්චිත කාල රාමුවක් තුළ අඛණ්ඩව හා ක්‍රමවත් සැලැස්මකට අනුව ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ඈ) ගවේෂණ සැලසුම් ක්‍රියාත්මක කිරීම**

අම්පාර දිස්ත්‍රික්කයේ 2013 වර්ෂයේදී විශේෂ ගවේෂණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණු අතර එහිදී පහත මූලික අරමුණු ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇතිබව දක්වා තිබුණි.

- පුරාවිද්‍යා ස්ථාන හඳුනා ගැනීම සහ වාර්තාගත කිරීම.
- පුරාවිද්‍යා ආරක්ෂිත / පැරණි ස්මාරක ප්‍රකාශයට පත් කිරීම.
- පුරාවිද්‍යා රක්ෂිත භූමි ප්‍රකාශයට පත් කිරීම.
- අවශ්‍ය පුරාවිද්‍යා ස්ථාන සඳහා මායිම් කණු හා දැන්වීම් පුවරු යෙදීම.

ඉහත අරමුණු කොතෙක් දුරට සම්පූර්ණ කර ගැනීමට හැකි වූයේද යන්න පසුවිපරම් කිරීමක් සිදුකර නොතිබුණු අතර අදාළ ගවේෂණ ක්‍රියාවලියේ වාර්තාවට අනුව භෞතික ප්‍රගතිය පරීක්ෂාවේදී පහත තත්ත්වයන් නිරීක්ෂණය විය.

i. ව්‍යාපෘති කටයුතු මාස 06 ක කාලයක් තුලදී සම්පූර්ණ කිරීමට ඉලක්ක ගත කර තිබුණි. මේ සඳහා රු.මිලියන 11.81 ක් පිරිවැය ඇස්තමේන්තු ගත කර තිබුණු අතර ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය රු.මිලියන 6.67 ක් හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව රු.මිලියන 5.14 ක මූල්‍ය ප්‍රතිපාදන සලසා දී තිබුණි.

ii. ව්‍යාපෘති කටයුතු මාස 06 ක් තුළ එනම් 2013 සැප්තැම්බර් 19 දිනට සම්පූර්ණ කළ යුතුව තිබුණද පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක හඳුනාගැනීමේ ගවේෂණ කටයුතු 2013 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක වෙමින් පැවති බව නිරීක්ෂණය විය. එම කටයුතු සම්පූර්ණ කර තිබුණේ කවදාද යන්න පිළිබඳව තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

iii. 2013 වර්ෂයේ ක්‍රියාත්මක කළ ගවේෂණ තුළින් හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන 40 ක ආරක්ෂාව සඳහා රු. මිලියන 1.88 ක පිරිවැය ඇස්තමේන්තුවක් යටතේ මායිම් කණු ස්ථාපිත කිරීමට 2018 වර්ෂයේදී සැලසුම් කර 2018 මාර්තු 31 දිනට නිම කිරීමට ඉලක්ක කර තිබුණි. එසේ වුවද එහි කටයුතු මෙතෙක් ආරම්භ කර නොතිබුණි. (ඇමුණුම 01)

iv. ගවේෂණ කටයුතු සිදු කළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 14 හි පුරාවිද්‍යාත්මක ස්ථාන 259 ක්, ප්‍රකාශයට පත් කිරීමට යෝජිත රක්ෂිත ස්ථාන 54 ක් හා ස්මාරක 170 ක් 2013 ඔක්තෝබර් 17 දින වන විටත් හඳුනාගෙන තිබුණු බව වාර්තා කර තිබුණද එදින සිට ව්‍යාපෘති කටයුතු අවසන් කළ දින දක්වා සිදු කළ ගවේෂණ කටයුතුවලින් හඳුනා ගත් පුරාවිද්‍යාත්මක ස්ථාන, ස්මාරක හා රක්ෂිත වාර්තා ගත කිරීමට හෝ ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කර නොතිබුණි. (ඇමුණුම 02)

v. මෙම ගවේෂණයේදී ප්‍රකාශයට පත් කිරීමට යෝජිත රක්ෂිත භූමි අතරින් අම්පාර දිස්ත්‍රික්කයේ 2019 වර්ෂය දක්වාම රක්ෂිත භූමි ලෙස ගැසට් කර ඇති ස්ථාන සංඛ්‍යාව 02 කි. එම ස්ථාන ලෙස මුහුදු මහා විහාරය හා නුවරගල රක්ෂිතය හඳුනා ගෙන තිබුණද ඒවායේ මායිම් ගැටලු වර්තමානය වන විටද නොවිසඳී පැවතුණි. මුහුදු මහා විහාරයට අයත් රක්ෂිත ඉඩම් 2002 වර්ෂයේදී එවක සිටි ප්‍රාදේශීය ලේකම් විසින් ජනතාවට බලපත්‍ර මඟින් බෙදා දී ඇත. තවද ඉඩම් බෙදා දීම තුලින් පුරාවිද්‍යා ආඥාපනත උල්ලංඝනය වීමක් සිදුව ඇත.

(ඉ) **වනජීවී කලාප වල ගවේෂණ කටයුතු**

අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 14 හි සිදු කර තිබුණු ගවේෂණ කටයුතුවලදී එම කොට්ඨාශවල පැවති වනජීවී කලාපවල ගවේෂණ කටයුතු ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණු බව විගණනයේදී අනාවරණය විය. වනජීවී දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබීම හා එම දෙපාර්තමේන්තුවේ ගවේෂණ කටයුතු සඳහා දායකත්වය ලබා දෙන නිලධාරීන් හට දීමනා ලබා දීමට ප්‍රතිපාදන සලසා නොමැති වීම වනජීවී කලාපවල ගවේෂණ කටයුතු අත්හැර දැමීමට හේතු වී තිබුණි. වනජීවී කලාපවල පිහිටි පුරාවිද්‍යා ස්ථාන පිළිබඳව සැලසුම් සහගතව වනජීවී දෙපාර්තමේන්තුව සමඟ නිසි සම්බන්ධීකරණය පවත්වා නොතිබුණු බවත්, ඒ සඳහා ගවේෂණ අංශයේ වගකීම ඉටු කර නොතිබුණු බවත් නිරීක්ෂණය විය.

(ඊ) **පුරාවිද්‍යා ස්ථාන සුරක්ෂිත කිරීම**

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 14 අතුරින් කොට්ඨාශ 08 ක ශිලා ලේඛන සහිත පුරාවිද්‍යා ස්ථාන 47 ක් හඳුනාගෙන වාර්තාකර තිබුණද, එම ශිලා ලේඛන පිටපත් කර සුරක්ෂිත කිරීමට පියවර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. (ඇමුණුම 03)

(උ) **පුරාවිද්‍යා ස්ථාන හඳුනා ගැනීම සඳහා නාමපුවරු සකස් කිරීම**

අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් දිස්ත්‍රික්කයේ පෞරාණික ස්ථාන සඳහා නව වටිනාකමක් ලබා දී සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, එම ස්ථාන පහසුවෙන් හඳුනාගත හැකි වන පරිදි නාම පුවරු සකස් කර ස්ථාපිත කිරීම සඳහා පුරාවිද්‍යාත්මක ස්ථානවල තොරතුරු අම්පාර දිස්ත්‍රික් ලේකම්වරයා වෙත ඉදිරිපත් කරන ලෙස ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අංක NH/4/14/OR දරන 2013 සැප්තැම්බර් 20 දරන ලිපියෙන් උපදෙස් දී තිබුණි. එසේ වුවත් ඊට ප්‍රතිචාරයක් දක්වා තිබුණු බව නිරීක්ෂණය නොවීය. මේ හේතුවෙන් අම්පාර දිස්ත්‍රික් ලේකම් වරයා මගින් පුරාවිද්‍යා ස්ථානවල නාමපුවරු ස්ථාපිත කිරීමේ කාර්යයද නතර වී තිබුණි.

### 3.2.6 මඩකලපුව හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්ක වල පුරාවිද්‍යාත්මක උරුමයන් ආරක්ෂා කිරීම

මානව ක්‍රියාකාරකම් තුළින් නැගෙනහිර පළාතේ පුරාවිද්‍යා ස්ථාන රැසක් විනාශයට පත් වීම සිදුව ඇති බැවින් එම පුරාවිද්‍යාත්මක ස්ථාන හා පුරාවස්තු ආරක්ෂා කිරීම පිළිබඳව 2016 දෙසැම්බර් 22 දින පැවති සාකච්ඡාවේදී ජනාධිපතිවරයා විසින් ලබා දී තිබුණු නියෝග පරිදි නැගෙනහිර පළාත තුළ ඇති පුරාවිද්‍යාත්මක ස්ථාන හඳුනා ගැනීම හා ලේඛන ගත කිරීම, හඳුනාගත් ස්ථානවල භූගෝලීය හා ස්ථානීය දත්ත ඇතුළත් නාමාවලියක් පිළියෙල කිරීම, නාමපුවරු සවි කිරීම, මැනුම් කටයුතු කිරීම, රක්ෂිත හෝ ස්මාරක ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම ප්‍රමුඛ අවධානය යොමු කර නියමිත දිනට කටයුතු ඉටු කරන ලෙස අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයා විසින් 2016 දෙසැම්බර් 23 දිනැති අංක ED/10/NH/09/84 දරන ලිපියෙන් පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාට උපදෙස් දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) හඳුනාගත් ප්‍රදේශ ප්‍රකාශයට පත්කිරීමේ ක්‍රියාවලියට අදාල මූල්‍ය ප්‍රතිපාදන**

ඒ අනුව පුරාවිද්‍යා ස්ථාන හඳුනා ගැනීම හා වාර්තා ගත කිරීම සඳහා කඩිනම් ගවේෂණ ක්‍රියාත්මක කිරීම, හඳුනාගත් සියළු පුරාවිද්‍යා ස්ථාන මායිම් කණු හා දැන්වීම් පුවරු ස්ථාපිත කිරීම, හඳුනාගත් ස්ථාන සිතියම් ගත කිරීම හා මැනුම් කිරීම, හඳුනාගත් ස්ථාන රක්ෂිත හෝ ස්මාරක වශයෙන් ප්‍රකාශයට පත් කිරීම යනාදී කාර්යයන් සඳහා ව්‍යාපෘති යෝජනාව හා රු.මිලියන 7 ක පිරිවැය ඇස්තමේන්තුව අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතියට පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2016 දෙසැම්බර් 26 දින ඉදිරිපත් කර තිබුණි. එම පිරිවැය ඇස්තමේන්තුවට අමතරව මධ්‍යම සංස්කෘතික අරමුදලින් ව්‍යාපෘති කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා ගැනීම වෙනුවෙන් රු.මිලියන 29.27 ක් වූ අමතර පිරිවැය ඇස්තමේන්තුවක් 2017 පෙබරවාරි 07 දින අනුමත කර ගෙන තිබුණි. මේ අනුව ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා එකතුව රු.මිලියන 36.27 ක මූල්‍ය ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි.

**(ආ) හඳුනා නොගත් ප්‍රදේශ වල ගවේෂණ කටයුතු**

මඩකලපුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 14 වෙනුවෙන් ගවේෂණ කණ්ඩායම් 04 ක හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ තඹලගමුව හා සේරුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 02 හි මේ වන විට ගවේෂණ කටයුතු සිදු කර පුරාවිද්‍යා ස්ථාන හඳුනාගෙන, වාර්තා ගත කර ඇති හෙයින් ඉතිරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 09 වෙනුවෙන් ගවේෂණ කණ්ඩායම් 02 ක් පත් කර තිබුණි.

**(ඇ) ගවේෂණ වාර්තා පිළියෙල කිරීම**

මඩකලපුව දිස්ත්‍රික්කයෙහි ගවේෂණ කටයුතු 2017 මාර්තු 15 දින ආරම්භ කර 2017 අගෝස්තු 30 දින දක්වා සිදු කර තිබුණු අතර ගවේෂණ වාර්තාව පිළියෙල කිරීමේ කටයුතු සම්පූර්ණ කර තිබුණේ 2019 ඔක්තෝබර් 28 දිනදීය. ගවේෂණ ව්‍යාපෘති කටයුතුවලට අදාළ වාර්තාව ඉදිරිපත් කිරීමට පෙර ව්‍යාපෘති භාර නිලධාරීනිය ස්ථාන මාරු කිරීම හා වාර්තාව පිළියෙල කිරීමේ කටයුතු සඳහා ප්‍රධාන කාර්යාලයේ ගවේෂණ අංශයේ නිලධාරීන් ප්‍රමාණවත් සහයෝගයක් හා දායකත්වයක් නොදැක්වීම වාර්තාව ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයට හේතු වී තිබුණි. මේ අනුව ගම්‍ය වන්නේ ගවේෂණ කටයුතු ක්‍රියාත්මක කිරීමේදී ගවේෂණ අංශයේ නිලධාරීන් වගකීමෙන් යුතුව කටයුතු කර නොතිබුණු බවයි.

**(ඈ) චංචල පුරාවස්තු සුරක්ෂිත කිරීම කඩිනම් කිරීම**

කෙසේ වෙතත් මඩකලපුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 14 තුළ පුරාවිද්‍යා ස්ථාන 528 ක් හා චංචල පුරාවස්තු සහිත ස්ථාන 120 ක් වශයෙන් එකතුව 648 ක් වූ පුරාවිද්‍යාත්මක ප්‍රදේශ හඳුනාගෙන තිබුණි. හඳුනාගෙන තිබුණු පුරාවිද්‍යාත්මක ස්ථාන, ස්මාරක හා චංචල පුරාවස්තු කඩිනම් ලෙස සුරක්ෂිත කිරීම කළ යුතුව තිබුණද ඒ සඳහා කිසිදු වැඩ පිළිවෙලක් සැලසුම් කර නොතිබුණි. මේ හේතුවෙන් මඩකලපුව දිස්ත්‍රික්කය තුළ විසිරි පවතින පුරාවස්තු වර්තමාන මිනිස් ක්‍රියාකාරකම් තුළින් විකෘති වීම, විතැන් වීම හා විනාශ වීම සිදුවෙමින් පැවතිණ.

**(ඉ) හඳුනාගත් පුරාවස්තු වල තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීම**

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 09 ක් ආශ්‍රිතව සිදු කළ ගවේෂණවලින් හඳුනාගත් පුරාවිද්‍යා ස්ථාන, ස්මාරක හා චංචල පුරාවස්තු පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර අදාළ ගවේෂණ වාර්තාව පිළියෙල කර ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ඊ) ගවේෂණ අංශයේ කටයුතු කළමනාකරණය**

ගවේෂණ කටයුතු සිදු කර වර්ෂ 02 කට වැඩි කාලයක් ඉකුත් වී තිබුණද, ගවේෂණ වාර්තා ඉදිරිපත් නොකිරීම සම්බන්ධයෙන් ගවේෂණ අංශයේ අවධානය යොමු වී නොතිබුණු අතර පසුවිපරම් කටයුතු ද සිදු කර නොතිබුණි. මේ අනුව ගවේෂණ අංශයේ නිලධාරීන් විසින් ගවේෂණ කටයුතු කළමනාකරණය කිරීමට නිසි සැලකිල්ලක් දක්වා නොතිබුණු බවත්, එය කළමනාකරණ අකාර්යක්ෂමතාවයක් බවත් නිරීක්ෂණය කරනු ලැබේ.

(උ) **ලේඛනගත කිරීමේ ව්‍යාපෘතිය**

නැගෙනහිර පළාතේ මඩකලපුව හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවල පුරාවිද්‍යා ස්ථාන ලේඛනගත කිරීමේ ව්‍යාපෘතිය 2017 ක්‍රියාකාරී සැලැස්ම අනුව මාස 06 ක් තුළ ගවේෂණ කටයුතු සිදු කර පුරාවිද්‍යා ස්ථාන හඳුනා ගැනීමෙන් අනතුරුව ලේඛන ගත කිරීම, භූගෝලීය හා ස්ථාන දත්ත නාමාවලිය පිළියෙල කිරීම, හඳුනාගනු ලබන ස්ථානවල පුරාවිද්‍යා නාමපුවරු ස්ථාපිත කිරීම හා මැනුම් කටයුතු සිදු කිරීම සහ මැනුම් කළ ස්ථාන පුරාවිද්‍යා ස්මාරක හෝ රක්ෂිත ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම යන කටයුතු කළ යුතුව තිබුණද ව්‍යාපෘති කාලය අවසන් වී වසර 02 ක කාලයක් ගත වුවත් එම කටයුතු ක්‍රියාත්මක කිරීමට හෝ කටයුතු ආරම්භ කිරීමේ සූදානමක් හෝ ඒ සඳහා වැඩපිළිවෙලක් හෝ නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඌ) **අතිගරු ජනාධිපතිතුමාගේ අවධානය යොමුවීම**

මේ අනුව පුරාවිද්‍යාත්මක ස්ථාන හා පුරාවස්තු ආරක්ෂා කිරීම පිළිබඳව 2016 වර්ෂයේදී ජනාධිපතිවරයා ලබා දුන් නියෝග පරිදි ප්‍රමුඛ අවධානය යොමු කර කඩිනමින් එය ඉටු කිරීමේ වගකීම පැහැර හැර තිබුණු බවත් මේ පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වා නොතිබුණු බවත් නිරීක්ෂණය විය.

එසේම මෙම ව්‍යාපෘතියෙන් ඉලක්ක ගත කර තිබුණු අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපොහොසත් වී තිබුණු අතර කටයුතු ක්‍රියාත්මක කිරීමේ බොහෝ කාල ප්‍රමාදයන් පැවතීම හේතුවෙන් නැගෙනහිර පළාතේ පුරාවිද්‍යා ස්ථාන හා පුරාවස්තු ආරක්ෂා කිරීම පිළිබඳ ජනාධිපතිවරයාගේ අරමුණු ව්‍යර්ථ වී තිබුණි.

(එ) **වෙනත් රාජ්‍ය ආයතන යටතේ ප්‍රකාශිත ප්‍රදේශ**

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ අනාරක්ෂිතව පවතින බොහෝ පුරාවිද්‍යා ස්ථානවල මතු ආරක්ෂාව උදෙසා විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ මූලික අභිප්‍රාය මත 2016 වර්ෂයේදී සේරුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ඇති පුරාවිද්‍යා ස්ථාන හඳුනාගැනීමේ ගවේෂණය ක්‍රියාත්මක කර තිබුණි. වර්තමානයේදී සේරුවිල, සුමේධංකරපුර, කාවන්තිස්සපුර, මහින්දපුර, සේරුනුවර, මහවැලිගම, සෝමපුර, ලිංගපුරම්, සිවපුරම්, දෙහිවත්ත, නීලපොල, සමගිපුර, නාවක්කේනිකාඩු, අරියමංකේනි, තංගනගර් සහ සිරිමංගලපුර යන ග්‍රාම නිලධාරී වසම් 16 කට බෙදා වෙන් කර ඇත. සේරුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ජනාවාසකරණයට ලක්ව ඇත්තේ එම ප්‍රදේශයෙන් අඩකටත් වඩා අඩු ප්‍රදේශයක් වන අතර වැඩි භූමි ප්‍රමාණයක් අභයභූමි, ජාතික උද්‍යාන සහ වනජීවී හා වනසංරක්ෂණ භූමි ලෙස ප්‍රකාශිතව පවතී.

**(ඒ) හඳුනාගත් පුරාවිද්‍යා ස්ථාන හා චංචල පුරාවස්තු**

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සේරුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2016 වර්ෂයේදී සිදු කළ ගවේෂණ කටයුතු තුළින් පුරාවිද්‍යා ස්ථාන 58 ක ඇති ස්මාරක හා චංචල පුරාවස්තු හඳුනාගෙන තිබුණි. (ඇමුණුම 04)

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සේරුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හඳුනාගත් පුරාවිද්‍යා ස්ථාන, ස්මාරක හා චංචල පුරාවස්තු අතරින් අළුතින් හඳුනාගත් හා විකෘති වීමේ හෝ විතැන් වීමේ හෝ විනාශ වීමේ අවධානමට පත්ව ඇති හා හඳුනා ගත් අවස්ථාව වන විට පුරාවිද්‍යාත්මක උරුමය සුරක්ෂිත කිරීමට කටයුතු නොකළ ස්ථාන හා ස්මාරක ගවේෂණ සිදු කර වර්ෂ 03 ක කාලයක් ඉකුත් වී තිබුණද ඒවා ආරක්ෂා කිරීම වෙනුවෙන් පියවර ගෙන නොතිබුණි.

**(ඔ) හඳුනාගත් ස්ථාන විනාශයට පත්වීම**

මේ හේතුවෙන් නිදන් සෙවීමේ අරමුණින් අනවසර කැණීම් සිදු කිරීම, ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම, නිවාස ඉදි කිරීම හා වගා කටයුතු සිදු කිරීම, රජයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ඛනිජ හා පාෂාණ නිස්සාරණ කටයුතු කිරීම යනාදී මානව ක්‍රියාකාරකම් අවිධිමත් ලෙස ක්‍රියාත්මක කිරීම තුළින් පුරාවිද්‍යාත්මක උරුමය විනාශයට පත් වී තිබුණි. (ඇමුණුම 05)

## 3.3 පුරාවිද්‍යා කැණීම් කටයුතු

පුරාවිද්‍යා ස්මාරක, ස්ථාන භූ දර්ශනයක් හා පුරාවස්තු සංරක්ෂණය වෙනුවෙන් පුරාවිද්‍යා ස්මාරක පාදා ගැනීම නිරාවරණය කර ගැනීම හා මතු කර ගැනීම කැණීම් සිදු කිරීමේ ප්‍රධානතම අරමුණ විය. ඊට අමතරව ප්‍රාග් ඓතිහාසික, පූර්ව ඓතිහාසික, මූල ඓතිහාසික වශයෙන් පුරාවිද්‍යා ක්ෂේත්‍රය තුළ පවතින පර්යේෂණමය ගැටළු නිරාකරණය කර ගැනීමේ අරමුණු සහිතව පර්යේෂණ කැණීම් හා සංවර්ධන ව්‍යාපෘති හෝ වෙනත් හේතුමත පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත භූමි ප්‍රදේශයකට බලපෑම් එල්ලවන අවස්ථාවන්හිදී භූමි ප්‍රදේශය අවබෝධ කර ගැනීම, පුරාවිද්‍යා ස්මාරක බේරා ගැනීම හා වාර්තා ගත කිරීම අරමුණු සහිතව හානි බලපෑම් ඇගයුම් කැණීම් යනාදී ලෙස කැණීම් කටයුතු සිදුකෙරෙන බව නිරීක්ෂණය විය. එම කැණීම් කටයුතු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් උතුරු හා නැගෙනහිර පළාතේ නියැදි පරීක්ෂණයට ලක්වූ ප්‍රදේශ කිහිපයකට අදාළව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.3.1 කැණීම් බලපත්‍ර ලබාදීම හා කැණීම් කටයුතු

**(අ) කැණීම් බලපත්‍ර නිකුත් කිරීම**

මධ්‍යම සංස්කෘතික අරමුදලේ එක් මහාචාර්යවරයෙකුට 2017 ජනවාරි 01 දින සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා කැණීම් බලපත්‍ර කාලය ඇතුළත් ව්‍යාපෘති 35 ක් වූ විශාල සංඛ්‍යාවක් සඳහා කැණීම් බලපත්‍ර නිකුත් කර තිබුණි. කැණීම් බලපත්‍ර ලබාදීමේදී ලබාදෙනු ලබන කැණීම් බලපත්‍ර වල ප්‍රගතිය පරීක්ෂා කිරීමක් සිදු නොවන බව නිරීක්ෂණය විය.

**(ආ) කැණීම් බලපත්‍ර පෙරදාතම් කිරීම**

2006 වර්ෂයේ සිට 2018 වර්ෂයේ ජනවාරි මස දක්වා කාලය තුළ නිකුත් කළ කැණීම් බලපත්‍ර, නිකුත් කළ දිනට පෙර දිනක සිට බලපැවැත්වෙන පරිදි පෙර දාතම් කර බලපත්‍ර 34 ක් නිකුත් කර තිබුණු බව නිරීක්ෂණය විය. (ඇමුණුම 06)

**(ඇ) බාහිර පාර්ශව විසින් කෙරෙන කැණීම්**

කැණීම් දත්ත ඇතුළත් වාර්තාවේ දැක්වෙන තොරතුරු අනුව බාහිර පාර්ශවයන් විසින් සිදු කර තිබුණු කැණීම්, පර්යේෂණ කැණීම් හෝ බලපෑම් ඇගයුම් කැණීම් හෝ වන බවත් ඒ තුළින් පුරා ස්මාරක, ස්ථාන නිරාවරණය කර සංරක්ෂණය කිරීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අවකාශ මග හැරී යන බවත් නිරීක්ෂණය විය.

**(ඈ) කැණීම් වලදී හමුවන පුරාවස්තු ලේඛනගත කිරීම**

1940 අංක 9 දරන පුරාවස්තු ආඥා පනතේ 10 වගන්තිය විධිවිධාන ප්‍රකාරව කැණීම් කරගෙන යද්දී සොයා ගනු ලැබූ සියලු පුරාවස්තු පිළිබඳ වාර්තා පැවැත්වීම, සොයා ගත් පුරාවස්තු පිළිබඳ පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාට වාර්තා කිරීම හා භාර දීම සිදු කළ යුතුව තිබුණද 2006 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා සිදුකළ කැණීම් ව්‍යාපෘති 121 ක් සඳහා කැණීම් බලපත්‍ර ලබා ගත් බාහිර පුද්ගලයන් විසිදෙදෙනෙකු විසින් ඊට පටහැනිව කැණීම් කටයුතු කර තිබුණි. එම තත්ත්වය 2019 ජුනි 30 දින වන විටත් නිරවද්‍ය කිරීමට කටයුතු කර නොතිබුණි. (ඇමුණුම 07)

### 3.3.2 පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කැණීම් කටයුතු

**(අ) කැණීම් තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීම**

පොළොන්නරුව දිස්ත්‍රික්කය සඳහා වෙනම ප්‍රාදේශීය කාර්යාලයක් ස්ථාපිත කර තිබුණේ 2016 වර්ෂයේදී වූ අතර 2016 වර්ෂයට පෙර කාලවලදී අනුරාධපුර උතුරුමැද ප්‍රාදේශීය කාර්යාලය මගින් කටයුතු මෙහෙයවා තිබුණි. ඒ හේතුවෙන් 2016 වර්ෂයට පෙර කාලවලට අදාළ කැණීම් පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇති බව අදාළ නිලධාරීන් විගණනයට කරුණු ඉදිරිපත් කෙරිණි.

**(ආ) මූල්‍ය ප්‍රතිපාදන හා භෞතික ප්‍රගතිය**

පොළොන්නරුව ප්‍රාදේශීය කාර්යාලය මගින් එම බලප්‍රදේශය තුල 2016 වර්ෂයේ සිට 2019 ජුනි 30 දින දක්වා වර්ෂ 03 මාස 06 ක කාලය තුළ ක්‍රියාත්මක කර තිබුණේ කැණීම් ව්‍යාපෘති 04 ක් වූ අවම සංඛ්‍යාවකි. ඒ අනුව 2016 වර්ෂයේ ආරම්භ කල එක් කැණීමක් හා 2018 හා 2019 වර්ෂ වල කැණීම් ව්‍යාපෘති 4 කට පමණක් වෙන්කල ප්‍රතිපාදන මුදල රු. 9,489,010 ක් විය. විස්තර පහත පරිදි විය.

| කැණීම් ව්‍යාපෘතිය ආරම්භ කළ වර්ෂය | කැණීම් ව්‍යාපෘතිය පිළිබඳ විස්තරය | ප්‍රතිපාදන සැපයූ ආයතනය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන වෙන් කිරීම් |
|---|---|---|---|
| ------------ | -------------------------------------- | -------------------- | ------------------------ |
| | | | රු. |
| 2016 | වැලිවතුර රජමහා විහාර පුරාවිද්‍යා ස්ථානය (පිළිමගෙය) | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | (ප්‍රතිපාදන වටිනාකම විගණනයට ඉදිරිපත් නොකෙරුණි) |
| 2018 | 28 කණුව පුරාවිද්‍යා ස්ථානය (පිළිම ගෙවල් 02 ක, චෛත්‍ය හා ප්‍රකාර බැම්ම) | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | 4,143,820 |
| 2018 | නාගලකන්ද පුරාවිද්‍යා ස්ථානයේ ස්තූපය 1 වන අදියර | බුද්ධ සාසන අමාත්‍යාංශය | 2,000,000 |
| 2019 | නාගලකන්ද පුරාවිද්‍යා ස්ථානයේ ස්තූපය 2 වන අදියර | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | 3,208,790 |
| 2019 | ඇතුමල්පිටිය පුරාවිද්‍යා ස්ථානයේ නෙළුම් පොකුණ අංක 03 | මධ්‍යම සංස්කෘතික අරමුදල | 136,400 |
| | | | ------------- |
| | | | 9,489,010 |
| | | | ======== |

මෙම කැණීම් ව්‍යාපෘති අතුරින් නාගලකන්ද පුරාවිද්‍යා ස්ථානයේ ස්තූපය කැණීම් කටයුතු සම්පූර්ණ කර නොතිබුණු අතර 2019 ජුනි 30 දිනටද ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

**(ඈ) හඳුනාගත් ස්ථාන සියල්ල කැණීම් කිරීම**

එසේම 2016 වර්ෂයේදී හා 2017 වර්ෂයේදී ගවේෂණ වලින් හඳුනාගත් පුරාවිද්‍යා ස්මාරක හා ස්ථාන 94 ක කැණීම් කටයුතු ක්‍රියාත්මක කිරීමට අවධානය යොමු වී නොතිබුණි. මේ හේතුවෙන් පුරාවිද්‍යා ස්මාරක හා ස්ථානවලට නිදන් හොරුන්, මානව ක්‍රියාකාරකම් හා රජයේ සංවර්ධන ව්‍යාපෘති යනාදිය මඟින් පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත භූමි ප්‍රදේශයන්ට එල්ලවන බලපෑම් වලින් පුරාවස්තු හා ස්මාරක ආරක්ෂා කර ගැනීමට නොහැකි වී තිබුණි. කැණීම් මගින් පුරාවිද්‍යාත්මක ස්මාරක, ස්ථාන, භූ දර්ශන මතුපිට නිරාවරණය කර වාර්තාගත කිරීමට හා අනතුරුව සංරක්ෂණය කිරීමට කටයුතු කරන්නේ නම් එවැනි බලපෑම් මත සිදුවන හානිවලින් පුරාවස්තු, ස්මාරක බේරා ගැනීමට අවකාශ සැලසෙන බව විගණනයේදී නිරීක්ෂණය විය.

**(ඈ) පුරාවිද්‍යා උරුමයන් හෙළිදරව් කිරීම**

තවද පොළොන්නරුව දිස්ත්‍රික්කය පුරා විසිරී පවතින දැනට හඳුනා ගැනීමට කටයුතු නොකල පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ප්‍රදේශ, ස්ථාන හා පුරාවිද්‍යා ස්මාරක රැක ගැනීම සහ පුරාවිද්‍යා උරුමය හෙළිදරව් කිරීමට කිසිදු සැලැස්මක් නොතිබුණු අතර ඒ සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදලේ දායකත්වය ලබා ගෙන අදාල කටයුතු මනාලෙස කළමනාකරණය කිරීමට පියවර ගෙන නොතිබුණි.

**(ඉ) රක්ෂිත කර නොමැති පුරාවිද්‍යා ස්ථාන**

කැණීම් කටයුතු ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් සැලසුම් සහගත වැඩ පිළිවෙළක් නොතිබීම හේතුවෙන් 2016 වර්ෂය හා 2019 ජුනි 30 දින කාලය තුළ මධ්‍යම සංස්කෘතික අරමුදලේ අභිමතය පරිදි ආලාහන පිරිවෙන ව්‍යාපෘතිය මගින් දැනට පුරාවිද්‍යා ස්ථාන, ස්මාරක ලෙස රක්ෂිතව පවතින පුරාවිද්‍යා ස්ථාන වල තවදුරටත් කැණීම් ව්‍යාපෘති 14 ක කටයුතු සිදු කර තිබුණි. නමුත් දැනට රක්ෂිත කර නොමැති පුරාවිද්‍යා ස්ථාන, පුරාවිද්‍යා ස්මාරක ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් මධ්‍යම සංස්කෘතික අරමුදලෙහි දායකත්වය ලබා ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

### 3.3.3 අම්පාර දිස්ත්‍රික්කයේ කැණීම් කටයුතු වල කාර්යසාධන මට්ටම

අම්පාර ප්‍රාදේශීය කාර්යාලය මගින් අම්පාර දිස්ත්‍රික්කය තුළ 2016 වර්ෂයේ සිට 2019 සැප්තැම්බර් 24 දින දක්වා අවු.03 මාස 09 ක කාලය තුළ ක්‍රියාත්මක කර තිබුණේ කොත්මලේ පුරාණ විහාරස්ථානයේ (පුංචි සීගිරිය) කැණීම පමණි. එහිදී 2016 වර්ෂයේ පැරණි දාගැබ, කැණීම් සිදුකර වාර්තාව ලබා දී ඇති බව සඳහන් කර තිබුණු අතර, 2019 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ ස්ථූප මළුව කැණීම් කටයුතු ආරම්භ කර තිබුණි. එහිදී පැරණි දාගැබ කැණීම සඳහා රු.69,644 ක ඇස්තමේන්තු අගයක් මත රු.42,832 ක වියදමක් දරා තිබුණි. දෙවන අදියර යටතේ ස්ථූප මළුව කැණීම සඳහා රු.626,925 ක ඇස්තමේන්තු අගයක් මත ක්‍රියාත්මක කරමින් රු.16,500 ක මුදලක් මධ්‍යම සංස්කෘතික අරමුදල් ප්‍රතිපාදන යටතේ වැයකර තිබුණි.

කොත්මලේ පුරාණ විහාරස්ථානයේ (පුංචි සීගිරිය) ඓතිහාසික පසුබිම පරීක්ෂාවේදී අනුරාධපුර යුගයට අයත් සේ සැලකිය හැකි පුරාවිද්‍යාත්මක සාධක සහිත පුරාවිද්‍යාත්මක ස්ථානයක් වන මෙහි සෙල්ලිපි 04 ක්, වැදි චිත්‍ර, ගල්කණු, පියගැට, පැරණි පොකුණු ආදිය සහිත පුරාවිද්‍යා වටිනාකම් සහිතව පවතින ස්ථානයන් ලෙස වාර්තාගත කර ඇත.

### 3.3.4 මඩකලපුව දිස්ත්‍රික්කයේ කැණීම් කටයුතු

**(අ) කැණීම් කටයුතු කඩිනම් කිරීම**

අම්පාර ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය මගින් මඩකලපුව දිස්ත්‍රික්කයේ 2016 වර්ෂයේ සිට 2019 සැප්තැම්බර් මාසය වන විට හඳුනාගත් ස්ථාන 02 ක ව්‍යාපෘති 03 ක් යටතේ කැණීම් කටයුතු සිදුකර තිබුණි. අවශ්‍ය ප්‍රතිපාදන ලබාදීම මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් සිදුකර තිබුණි. ඒ අනුව ව්‍යාපෘති 3 ක් සඳහා වැය කර ඇති මුදල රු.3,184,315 ක් වූ අතර ඉන් කිසිවකට අවසන් වාර්තා ලබා දී නොතිබුණි. විස්තර පහත පරිදි විය.

| ව්‍යාපෘතියේ නම | කැණීම ආරම්භ කළ වර්ෂය | ඇස්තමේන්තු මුදල | වියදම |
|---|---|---|---|
| | | රු. | රු. |
| i. කරදියනාරු දාගැබ සලපතල මළුව කැණීම | 2017 | 2120,500 | 1,564,494 |
| ii. කරදියනාරු පැරණි නටඹුන් සහිත භූමිය කැණීම | 2018 | 1,535,802 | 1,145,998 |
| iii. කෝවිල් කුලම් නිවාස සංකීර්ණයේ භූමිය පරීක්ෂණ කැණීම් කිරීම | 2019 | 500,000 | 473,823 |
| | | | 3,184,315 |

මඩකලපු දිස්ත්‍රික්කය තුළ ඉහත කැණීම් හැරුණු විට වෙනත් කැණීම් කටයුතු මේ දක්වාම සිදුකර නොතිබුණු අතර අදාළ කැණීම් සම්බන්ධයෙන් පහත තත්ත්වයන් නිරීක්ෂණය වේ.

**(ආ) කරදියනාරු කැණීම් කටයුතු**

i. කැණීම් කටයුතුවල පළමු අදියර යටතේ 2017 වර්ෂයේ ජනවාරි 26 දින සිට පෙබරවාරි 28 දින දක්වා පරීක්ෂා කිරීම් සිදුකර මූලික කැණීමක් සිදුකර තිබුණු අතර ඒ අනුව කැණීම් වලවල් 17 ක් යටතේ එම කැණීම් සිදුකර තිබුණි. එහිදී කැණීම හා සංරක්ෂණය යන කටයුතු දෙකම සඳහා රු.2,120,500 ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණද දාගැබ මළුව කැණීම සඳහා පමණක් රු.1,564,494 ක මුදලක් වැයකර තිබුණි. එම කැණීමට අදාල සංරක්ෂණ කටයුතු මේ දක්වාම සිදුකර නොතිබුණි.

ii. ඉහත කැණීම් වලදී ලැබුණු පුරාවස්තු, ලැයිස්තුවකට අනුව අම්පාර ප්‍රාදේශීය කාර්යාලය වෙත භාර දී තිබුණි. ඒ අනුව ප්‍රාදේශීය කාර්යාලය මගින් පුරාවිද්‍යා ප්‍රධාන කාර්යාලයේ කෞතුකාගාර අංශය වෙත ඒවා වර්ග කිරීම් කර ලේඛනගත කිරීම සඳහා දැනුම් දී තිබුණද 2019 සැප්තැම්බර් මාසය වන විටත් වර්ග කිරීම් කර ලේඛනගත කිරීමක් කර නොතිබුණු බව විගණනයේදී තහවුරු විය.

iii. කරදියනාරු පැරණි නටඹුන් සහිත විනාශ කර ඇති භූමියෙහි කැණීම් කටයුතු 2018 ඔක්තෝබර් 27 ආරම්භකර 2018 නොවැම්බර් 30 දිනෙන් අවසන් කර තිබුණි. එම කැණීමට අදාළව කැණීම් වාර්තාවක් ලබා දී නොතිබුණු අතර, කැණීම් වලදී සොයාගනු ලැබූ පුරාවස්තු සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ගද වාර්තා කර නොතිබුණි.

iv. පුරාවිද්‍යා ස්ථානයක් ලෙස ගැසට්කර නොමැති මෙම පුරාවිද්‍යා භූමිය හරහා කරදියනාරු අධිවේගී මාර්ගය ඉදිකිරීමට යෝජනා වී තිබුණි. එම තත්ත්වය යටතේ සිදුවිය හැකි පුරාවස්තු විනාශ වීම් මෙන්ම පුරාවිද්‍යා භූමියට සිදුවිය හැකි බලපෑම පිළිබඳව කැණීම් නිලධාරීන් විසින් ප්‍රාදේශීය කාර්යාලය දැනුවත් කිරීම් කළ බව සඳහන් වුවද ඒ සම්බන්ධයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ වගකිව යුතු පාර්ශවයන්ගේ මැදිහත් වීමක් සිදු වී නොතිබුණු බැවින් එම පුරාවිද්‍යා ස්ථාන විනාශ වීමේ අවදානමක් පැවතුණි.

v. කරදියනාරු පුරාවිද්‍යා ස්ථානයේ කටයුතු සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් 2019 වර්ෂයේ දී කොන්ත්‍රාත් පදනම මත කාර්යය මණ්ඩලයට අටදෙනෙකු පත්කර තිබුණද එම ප්‍රදේශයේ නවාතැන්, ප්‍රවාහන පහසුකම් ඇතුළු පවතින අනෙකුත් අපහසුතාවයන් මත ඔවුන් සියළුම දෙනා සේවය හැරගොස් තිබුණි. එවැනි තත්ත්වයක් යටතේ මෙම පුරාවිද්‍යා භූමිය හා පවතින පුරාවස්තු ආරක්ෂා කර ගැනීම පිළිබඳ ගැටළු සහගත තත්ත්වයක් ඇති වී තිබුණි.

**(ඇ) කෝවිල්කුලම් කැණීම් කටයුතු හා එහි වැදගත්කම අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම**

ක්‍රි.ව.370 දී ඉදිකරනු ලැබූ දර්ශනීය කෝවිලකි. ඒ ආසන්නයේ වැවක් තිබීම නිසාත් මෙම ස්ථානය කෝවිල් කුලම ලෙස හඳුන්වා තිබුණු අතර පෘතුගීසි පාලනයත් සමඟ 1627 වසරේදී මෙම කෝවිල විනාශයට පත්කර කෝවිලට අයත් ගල්කණු වෙනත් ස්ථාන කරා රැගෙන ගොස් තිබුණි. 1980 වර්ෂයේ පොල්ගස් සිටුවීමේ අරමුණින් වලවල් කපන අවස්ථාවේ කුඩා ශිවලිංගයක්, පෙන පහේ නාග රූපයක් යට වැඩ සිටින බුදු පිළිමයක් ඇතුළු පුරාවස්තු විශාල ප්‍රමාණයන් හමුවී තිබුණි.

i. කාත්තන්කුඩි මුස්ලිම් පල්ලි සම්මේලනයට අයත් මෙම ඉඩම 2014 ජූනි මස 24 දින ඉඩම් කොටස් 31 කින් යුත් සැලැස්මක් සකස්කර ජනතාවට බෙදී දී තිබුණි. 2014 සැප්තැම්බර් 20 දින විගණන පරීක්ෂාව සිදුකරන අවස්ථාව වන විට ස්ථිර ඉදිකිරීම් 17 ක් හා කැණීම් වලින් පසුව 2019 වර්ෂයේ විගණන පරීක්ෂාව සිදුකළ ආසන්න මාස තුලදී තාවකාලික ඉදිකිරීම් 10 ක් සිදුකර තිබුණි. කැණීම් සිදුකර තිබූ අංක 16,13,17 හා 20 ඉඩම් කැබලි පමණක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට ඉතිරිව පැවතුණි. එහෙත් ඉඩම් කොටස් 16 කම නිශ්චල හා චංචල පුරාවස්තු තිබෙන බව අනාවරණය කර ගෙන තිබුණි.

ii. කෝවිල්කුලම් කැණීම් වාර්තාවට අනුව 2019 වර්ෂයේ මාර්තු 05 දින සිට අප්‍රේල් 24 දින දක්වා කැණීම් කටයුතු සිදුකර තිබුණි. එහිදී ඉඩම් කට්ටි 14 හා තාවකාලික ඉදිකිරීම් පැවති ඉතිරි ඉඩම් කොටස්වල අහඹු ලෙස තෝරාගත් ස්ථාන වලද කැණීම් සිදුකර සඳකඩ පහනක්, අනුරාධපුර යුගයට අයත් බැම්වල කොටස්, පුරාණ මැටිබඳුන් අවශේෂ, උළුකැට, පැරණි යකඩ ඇණ, කොතක උඩ කොටස්, පැරණි කාසි, පැරණි ගඩොල්, පැරණි කළුගල් පාදම් ගල් ඇතුළුව පුරාවස්තු රාශියක් හඳුනාගෙන තිබුණද ඒවා සංරක්ෂණය කිරීමක් හෝ කැණීම් තුලින් හඳුනාගත් පුරාවස්තු සඳහා සුදුසු ආරක්ෂිත වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

iii. කැණීම් තුළින් මතුකරගත් පුරාවස්තු මතු පිටට නොපෙනෙන සේ තාවකාලිකව පස්වලින් වසා දමා තිබුණු අතර කැණීම් සිදුකළ මුළු භූමියම හා සැලසුමේ සඳහන් ඉඩම් කට්ටි 16 ක්ද පවරා ගැනීමටත්, කැණීම් සිදුකළ ප්‍රදේශයට යාබදව ඇති අනෙකුත් ඉඩම් හා වැව පිහිටා ඇති ප්‍රදේශයේ තවදුරටත් කැණීම් සිදුකිරීමටත් ඉඩම් කොටස් 01,02,03 ප්‍රදේශවල මායිම් ගැසට් කිරීමටත්, පුරාවිද්‍යා මුර යෙදවීම්, සිවිල් ආරක්ෂාව හා පොලිස් මුර යෙදවීම් යෝජනා කර ඇතත් එම කටයුතු විගණන පරීක්ෂාව සිදුකළ දිනය වන විටත් සිදුකර නොතිබුණි.

**(ඈ) කැණීම් ස්ථාන හඳුනා ගැනීම**

2016 වර්ෂයේ සිට මේ දක්වා අම්පාර හා මඩකලපුව දිස්ත්‍රික්කයන්හි කැණීම් කටයුතු ව්‍යාපෘති 03 කට පමණක් සීමා වී තිබුණු අතර එම කටයුතු ඉටුකිරීම තුළින් කැණීම් කටයුතු කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට සැලසුම් සහගත වැඩපිළිවෙලක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. එම තත්ත්වය යටතේ දිස්ත්‍රික්ක දෙකෙහි හඳුනාගනු ලැබූ පුරාවිද්‍යා ස්මාරක හා ස්ථාන 726 ක් අතරින් කැණීම් කටයුතු කළ යුතු ස්ථාන මොනවාද යන්න හඳුනාගෙන කැණීම් කටයුතු ක්‍රියාත්මක කිරීමට අවධානය යොමු වී නොතිබුණි. එවැනි තත්ත්වයන් තුළ පුරාවිද්‍යා ස්මාරක හා ස්ථානවලට නිදන් හොරුන්, මානව ක්‍රියාකාරකම් හා රජයේ සංවර්ධන ව්‍යාපෘති යනාදිය මත පුරාවිද්‍යා වටිනාකමක් සහිත භූමි ප්‍රදේශයන්ට එල්ලවන බලපෑම් වලින් පුරාවස්තු හා ස්මාරක ආරක්ෂා කර ගැනීමට නොහැකි වී තිබුණි.

## 3.4 සංරක්ෂණය

හඳුනා ගන්නා ලද පුරාවස්තු සංරක්ෂණය කිරීම සම්බන්ධයෙන් නියැදි පරීක්ෂාවට ලක් වූ ප්‍රදේශ කිහිපයකට අදාල නිරීක්ෂණ පහත පරිදි වේ.

### 3.4.1 මින්නේරිය නාගලකන්ද පුරාවිද්‍යා ස්ථානය

පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ 2016 වර්ෂය සිට 2019 ජුනි 30 දක්වා කාලය තුළ ක්‍රියාත්මක කළ කැණීම් ව්‍යාපෘති වල නියැදියකට අනුව සිදුකළ මහාසේන ආරණ්‍ය සේනාසනය, පුරාණ රජමහා විහාරය මින්නේරිය, නාගලකන්ද පුරාවිද්‍යා ස්ථානයේ දාගැබ කැණීම් හා සංරක්ෂණ කටයුතු ක්‍රියාත්මත කිරීම පිළිබඳව විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) පුරාවිද්‍යා ස්ථානයක් ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීම**

මෙම ආරණ්‍ය සංකීර්ණය හා දාගැබ මහසෙන් රාජ්‍ය පාලන කාලයේ කර වූ බව හා එකල මින්නේරිය විහාරය ලෙස හැඳින් වූ බව ඓතිහාසික තොරතුරු වල හා ජනප්‍රවාදවල සඳහන්වන බව පැවසේ. එහි සේනාසනයේ පැවති පිළිම ගෙය සංරක්ෂණ කටයුතු 2004 වර්ෂයේ සිදුකිරීමෙන් අනතුරුව සේනාසන භූමිය ආශ්‍රිතව පවතින පුරාවිද්‍යාත්මක ස්මාරක මතුකර පාදාගැනීම සඳහා කැණීම් හා සංරක්ෂණ කටයුතු සිදුකර නොතිබුණි. එසේම පුරාවිද්‍යා ස්ථානයක් ලෙස නම්කර රජයේ ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීමටද මේ දක්වා පියවර ගෙන නොතිබුණි.

**(ආ) විනාශයට පත්වන ස්ථාන පිළිබඳ ප්‍රමුඛත්වය ලබාදීම**

නාගලෙකන්ද මහාසේන ආරණ්‍ය සේනාසනයේ වැඩ විසූ සේනාසනාධිපති ස්වාමීන් වහන්සේ විසින් ඓතිහාසික පුදබිමේ විනාශයට පත්වන චෛත්‍ය සංරක්ෂණය කර දෙන ලෙස ජනාධිපතිවරයාගෙන් කළ ඉල්ලීමට අනුව ජනාධිපති ලේකම්වරයා විසින් 2010 දෙසැම්බර් 10 දින චෛත්‍යයේ සංරක්ෂණ කටයුතු කරන මෙන් පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත උපදෙස් දී තිබුණි. නමුත් සරක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන නොතිබුණි.

**(ඇ) ස්ථානීය පරීක්ෂාවන්**

චෛත්‍ය සංරක්ෂණය සඳහා ස්ථානීය පරීක්ෂාකර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස වාස්තුවිද්‍යා සංරක්ෂණ අංශයේ වැඩබලන අධ්‍යක්ෂවරයාගේ 2011 ජනවාරි 11 දිනැති ලිපිය පරිදි උතුරුමැද පළාතේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයාට උපදෙස් දී තිබුණු නමුත් එම ස්ථානීය පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**(ඈ) පිරිවැය වාර්තාවන් ලබාදෙන තෙක් පැවතිය යුතු ආරක්ෂාව**

අනතුරුව බුද්ධසාසන අමාත්‍යාංශ ලේකම්වරයා හා හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් දාගැබ සංරක්ෂණය සඳහා වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස 2018 වර්ෂයේදී කළ ඉල්ලීමට අනුව එම වාර්තාව 2018 සැප්තැම්බර් 01 දින හා සංරක්ෂණය සඳහා රු.1,977,500 ක් වූ පිරිවැය ඇස්තමේන්තුවක් 2018 නොවැම්බර් 28 දින ඉදිරිපත් කර තිබුණි. එම වාර්තාව ඉදිරිපත්කරන අවස්ථාව වන විට නිදන් හොරුන් විසින් අනවසර කැණීම් කිරීම හේතුවෙන් දාගැබට හානි සිදු වී තිබුණු බව නිරීක්ෂණය විය.

**(ඉ) අරමුදල් සපයා ගැනීම**

පිරිවැය ඇස්තමේන්තුව අනුව විගණනයේදී හඳුනාගත් වැය විෂයයන් යටතේ සාරාංශ කළ පිරිවැය විස්තර පහත දැක්වේ. එහි සමස්ත අමුද්‍රව්‍ය, කාර්යමණ්ඩල දීමනා හා උපකරණ පහසුකම් සැපයීමේ අරමුණින් රු.1,977,500 ක මුදලක් ඉල්ලුම් කර තිබුණි.

| වැය විෂයයන් විස්තරය | ඒකකය | ප්‍රමාණය | ඒකක මිල | පිරිවැය |
|---|---|---|---|---|
| | | | රු. | රු. |
| කැණීම් හා සාදා ගැනීම සඳහා පුරාවිද්‍යා නිලධාරී හා සහයක සංයුක්ත දීමනා හා ගමන් වියදම් | 1 දින | 342 | 1,200 | 324,000 |
| ගඩොල් (12"*8"*2.25" ) | කැට | 20,000 | | |
| සිමෙන්ති (කි.ග්‍රෑ.50) | මිටි | 720 | 1,050 | |
| වැලි | කියුබ් | 96 | 13,500 | 1,400,000 |
| අළුහුණු | බුසල් | 1,450 | 350 | |
| කැණීම් සඳහා ආයුධ, උපකරණ ද්‍රව්‍ය, පහසුකම් සැපයීම | | | | 253,500 |
| | | | | 1,977,500 |

මේ අනුව රු.2,000,000 ක බුද්ධ ශාසන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ අරමුදල් සම්පාදනය කරදීම සඳහා ප්‍රතිපාදන මුදල් 2008 වර්ෂයේදී හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම්වරයාට ලබා දීමට සහ වියදම් දැරීම ප්‍රාදේශිය ලේකම්වරයාගේ පාලනයට යටත් කිරීමට කටයුතු කර තිබුණි.

**(ඊ) කැණීම් කටයුතු සංරක්ෂණය**

කැණීම් කටයුතු 2018 නොවැම්බර් 20 දින ආරම්භ කර දාගැබ හඳුනා ගැනීමේ සීමිත කැණීමක් සිදුකර 2018 දෙසැම්බර් 31 දින වන විට කැණීම් කටයුතු නතර වී තිබුණි. එම කාලය තුළ කැණීම් කටයුතු වෙනුවෙන් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය 08 දෙනෙකු හා මධ්‍යම සංස්කෘතික අරමුදලේ පුරාවිද්‍යා සහායක සේවකයින් 10 දෙනෙකු සේවයේ නියුක්තව සිටි නමුත් එකී කාලය තුල ප්‍රමාණවත් ලෙස කැණීම් කටයුතු ඉටුකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**(උ) කාර්යමණ්ඩල වියදම් අවම කර ගැනීම**

වෙනත් පුරාවිද්‍යා ස්ථානවල සේවයේ නියුක්තව සිටි සේවකයන් සංචාරක සේවය සඳහා නාගලකන්ද පුරාවිද්‍යා ස්ථානයට සේවයේ යොදවා ගෙන තිබුණු බැවින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සේවකයින් වෙනුවෙන් සංයුක්ත දීමනා හා ගමන් වියදම් සඳහා 2018 නොවැම්බර් මස එකතුව රු.11,985 ක් හා 2018 දෙසැම්බර් මස එකතුව රු.196,285 ක් ගෙවීම් කර තිබුණි. ඊට අමතරව 2018 දෙසැම්බර් මාසයේ සේවකයන්ගේ සංයුක්ත දීමනා හා ගමන් වියදම් වෙනුවෙන් රු.108,000 ක මුදලක් ඉල්ලා තිබුණද, මුදල් නිදහස් නොකර හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම්වරයා එම ගෙවීම් අත්හිටුවා තිබුණි. මෙහිදී අදාල කාර්යයයෙන් පසු සංචාරක සේවයේ නොයොදවා නාගලකන්ද පුරාවිද්‍යා ස්ථානයට ව්‍යාපෘති ක්‍රියාත්මක කරන කාලය පදනම්ව නිශ්චිත කාලයකට අනුයුක්ත කලේ නම් සංයුක්ත දීමනා හා ගමන් වියදම් සඳහා වියදම් අවම කර ගැනීමට හැකියාව තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

**(ඌ) මාස 3 ක කාලකට වඩා වැඩිවන ව්‍යාපෘති සඳහා කාර්යමණ්ඩල දීමනා**

2018 දෙසැම්බර් 31 දිනැති අංක 05/2018 දරන පුරාවිද්‍යා දෙපාර්තමේන්තු චක්‍රලේඛ විධිවිධාන පරිදි මාස 03 කට වැඩි කාලයක් ගතවන ව්‍යාපෘතීන් සඳහා කාර්යය මණ්ඩලය ස්ථාන ගත කළ යුතු වුවත් ඊට පටහැනිව සේවකයන් සංචාරක සේවයේ යොදවා ගමන් වියදම් ගෙවීම් කිරීමට කටයුතු කර තිබුණු බව නිරීක්ෂණය විය.

**(එ) ගිණුම් වර්ෂය අවසානයේ ඉතිරිව ඇති ප්‍රතිපාදන**

ව්‍යාපෘති කටයුතු වෙනුවෙන් වූ රු.2,000,000 ප්‍රතිපාදනයෙන් උපයෝජනය කර තිබුණේ සේවක සංයුක්ත දීමනා හා ගමන් වියදම් සඳහා වූ රු.208,270 ක් පමණකි. රු.1,791,730 ක් වූ ඉතිරි ප්‍රතිපාදන හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම්වරයා භාරයේ පැවති අතර ගිණුම් පියවන 2018 දෙසැම්බර් 31 දිනට එම මුදල් රඳවා ගන්නේද, ඉදිරි ව්‍යාපෘති කටයුතු සඳහා මුදල් නිදහස් කරන්නේද යන්න පිළිබඳව ප්‍රාදේශිය ලේකම්වරයා මගින් තහවුරු කර ගැනීමට හා ඒ පිළිබඳව පසුවිපරම් සිදුකිරීමට කටයුතු නොතිබුණු බව නිරීක්ෂණය විය.

**(ඒ) ඇස්තමේන්තු ප්‍රතිපාදන වැඩිකිරීම**

2019 වර්ෂයේ නැවත ආරම්භ කරන ලද ව්‍යාපෘති කටයුතු වෙනුවෙන් මුල් ඇස්තමේන්තුව අනුව ස්ථූපයේ කැණීම් හා සංරක්ෂණ කටයුතු වෙනුවෙන් මුළු පිරිවැය රු.1,977,500 ක් වුවද, පසුව ඉදිරිපත් කළ ඇස්තමේන්තුව අනුව රු.3,208,740 ක් වූ බැවින් ව්‍යාපෘති කටයුතු සඳහා පිරිවැය රු.5,186,240 දක්වා වැඩි වී තිබුණු බව නිරීක්ෂණය විය. එසේ පිරිවැය වැඩිවීමට තුඩුදුන් හේතූන් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**(ඔ) කාර්යමණ්ඩල දීමනා වෙනුවෙන් නැවත නැවත ප්‍රතිපාදන වෙන්කිරීම**

එසේම මුල් ඇස්තමේන්තු අනුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සේවකයින්ගේ සංයුක්ත දීමනා හා ගමන් වියදම් රු.410,400 ක් වෙන්කර ගෙන ඉන් රු.393,480 ක් ගෙවීම් කිරීමට කටයුතු කිරීමෙන් අනතුරුව නැවතත් එම කටයුතු සඳහාම නව ඇස්තමේන්තුවෙන් තවත් රු.644,300 ක් වෙන්කර ගෙන තිබීම තුළින් 2018 දෙසැම්බර් 31 දිනැති අංක 05/2018 දින පුරාවිද්‍යා දෙපාර්තමේන්තු චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව කටයුතු කර තිබුණු බව නිරීක්ෂණය කරනු ලැබේ.

**(ඕ) ව්‍යාපෘතිය අවසන් කරන දිනය හඳුනා ගැනීම**

ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීම පිළිබඳව ක්ෂේත්‍ර විගණන පරීක්ෂණ අවස්ථාව වන 2019 ජුනි 15 දින වන විට කැණීම් කටයුතු සිදුකෙරෙමින් පැවතියද කැණීම් කටයුතු හා සංරක්ෂණ කටයුතු සම්පූර්ණ කර ව්‍යාපෘති අවසන් කළ යුතු දිනය පිළිබඳව නිශ්චිත ඉලක්කයන් ඉදිරිපත් නොකෙරුණි.

### 3.4.2 පොත්ගුල් වෙහෙර රක්ෂිතය

පුරාවිද්‍යා ස්මාරක ආරක්ෂා කිරීමේ කාර්යය යටතේ පුරාවිද්‍යා රක්ෂිතයක් ලෙස හඳුනාගෙන තිබුණු පොළොන්නරුව පරාක්‍රම සමුද්‍රය ඉස්මත්තේ පොත්ගුල් වෙහෙර රක්ෂිතය වටා දැල් ආවරණයක් සහිත ආරක්ෂිත යකඩ වැටක් ඉදිකිරීම, රු.මිලියන 2.3 ක ඇස්මේන්තු ගත පිරිවැය යටතේ මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් ආරම්භ කර කටයුතු ක්‍රියාත්මක කිරීමේ අවසන් අවස්ථාවේ පවතින බව ක්ෂේත්‍ර විගණන පරීක්ෂාවේදී අනාවරණය විය.

මේ සම්බන්ධයෙන් විගණන නිරීක්ෂණයන් පහත දැක්වේ.

(අ) රක්ෂිතයේ සීමා මායිම් නිශ්චිතව හඳුනා නොගෙන යකඩ වැට ඉදිකිරීම් කර තිබුණි. තවද මිනින්දෝරු සැලැස්ම/ පිඹුර මත මායිම් හඳුනාගෙන නොතිබුණි.

(ආ) පොත්ගුල් වෙහෙර මාවත අවසන්වන කෙලවර පුරාවිද්‍යා රක්ෂිතයට අයත් බිම් තීරුවේ අනවසර පදිංචිකරුවන් විසින් නිවාස හා තමන්කඩුව මහනගර සභාව මගින් ගල් අතුරන ලද මාර්ගයක්ද ඉදිරිකිරීමට කටයුතු කර තිබුණි. කිසිඳු පරීක්ෂාවකින් තොරව එම බිම් තීරුව අත්හැර යකඩවැට ඉදිකිරීම් කර තිබූ නමුත් මේ සම්බන්ධයෙන් පොළොන්නරුව ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලයේ වගකිව යුතු නිලධාරීන් විසින් කිසිඳු පියවරක් ගෙන නොතිබුණි.

(ඇ) තවද ඉදිකර ඇති මාර්ගය, අනවසර පදිංචිකරුවන්ගේ පෞද්ගලික අවශ්‍යතාවයන් සඳහා බිම්තීරු හා රක්ෂිතයේ ගස් අත්හැර යකඩ මායිම් වැට ඉදිකර තිබුණු අතර මේ නිසා මායිම සරල රේඛාවක් ලෙස කෙලින් නොවීය. මෙම අවිධිමත් තත්ත්වය ක්ෂේත්‍ර පරීක්ෂාව තුලදී පෙන්වා දීමෙන් අනතුරුව, අනවසර පදිංචිකරුවන්ගේ පෞද්ගලික අවශ්‍යතාවයක් සඳහා අත්හරින ලද බිම්තීරු නැවත රක්ෂිත ඇතුළට ගෙන ඉදිකර තිබුණු යකඩ වැට ගලවා මායිම කෙලින් කර නැවතත් ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

(ඇ) මේ අනුව පුරාවිද්‍යා රක්ෂිතයේ මායිම් වැට ඉදිකිරීමේදී පුරාවිද්‍යා පොළොන්නරුව ප්‍රාදේශීය කාර්යාලයේ නිලධාරීන්ගෙන් ප්‍රමාණවත් අධීක්ෂණයක් සිදු වී නොමැති බවත්, ඒ සඳහා විධිමත් මාර්ගෝපදේශයන් ලබා දී නොමැති බවත් නිරීක්ෂණය විය.

(ඉ) තවද මායිම් යකඩ වැට ඉදිකිරීමේදී මධ්‍යම සංස්කෘතික අරමුදල හා අදාල කොන්ත්‍රාත්කරු විධිමත් පිළිවෙත් අනුව කටයුතු කර නොතිබුණු බවත්, පුරාවිද්‍යා රක්ෂිතයට අයත් ඉඩම් අනවසර පදිංචි කරුවන්ගේ පරිහරණය සඳහා අවකාශ සලසා තිබුණු බවත් නිරීක්ෂණය විය.

### 3.4.3 වැලිවතුරේගම රජමහා විහාරය

ඓතිහාසික වශයෙන් වැදගත් වන වැලිවතුරේගම රජමහා විහාරයේ කැණීම් කළ පිළිමගෙය, චෛත්‍ය හා ගොඩනැගිලි අංක 02 සහ සෝමාවතිය පුරාවිද්‍යා ස්ථානයේ ප්‍රාකාර බැම්ම සංරක්ෂණ කටයුතු 2017 වර්ෂයේදී ඉටු කිරීමට සැලසුම් කර තිබුණද ඒවා ආරම්භ කිරීමට මේ දක්වාම කටයුතු කර නොතිබුණි.

### 3.4.4 28 කණුව පුරාවිද්‍යා ස්ථානය

තවද 2018 වර්ෂයේ පොළොන්නරුව 28 කණුව පුරාවිද්‍යා ස්ථානයේ කැණීම් වලින් මතුකර හඳුනාගෙන තිබුණු පිළිම ගෙවල් 02, චෛත්‍ය හා ප්‍රාකාර බැම්ම සංරක්ෂණ කටයුතු ඉටුකර නොතිබුණි. මෙම සියළුම සංරක්ෂණ කටයුතු අඩාල වීමට, සංරක්ෂණ අමුද්‍රව්‍ය සපයා ගැනීමේදී සිදු වූ ප්‍රමාදයන් හා අකාර්යක්ෂමතාවයන් හේතු වී තිබුණු බව නිරීක්ෂණය විය.

### 3.4.5 දෙමළ මහා සෑය, පැරණි නගරයේ නැගෙනහිර - බටහිර පැරණි වීදිය, ධනංජය පුරාණ විහාරයේ ස්ථූපය

මධ්‍යම සංස්කෘතික අරමුදල මගින්ද සංරක්ෂණ කාර්යය ඉටුකර තිබුණු අතර 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළ ක්‍රියාත්මක කළ සංරක්ෂණ ව්‍යාපෘති 09 ක් අතුරින් ඉහත ව්‍යාපෘති 03 හි කටයුතු වල ඉතා දුර්වල ප්‍රගතියක් පවතින බව නිරීක්ෂණය විය. මෙම ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු සකස් කිරීම පමණක් ඉටුකර තිබුණි.

කැණීම් කටයුතු කර පුරා ස්මාරක පාදා නිරාවරණය අවසන් කළ වහාම සංරක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීමට කටයුතු නොකිරීම මත එම පුරා විද්‍යාත්මක ස්මාරක වල කල් පැවැත්ම තහවුරු නොවීම හේතුවෙන් ඒවා හානියට පත්වීමේ අවදානමක් ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

### 3.4.6 සෝමාවතී පුරාවිද්‍යා ස්ථානය

පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කළ ඉහත පුරාවිද්‍යා ස්මාරකයන්හි නියැදියන් මත සිදුකළ විගණන පරීක්ෂාවේදී සෝමාවතී පුරාවිද්‍යා ස්ථානයේ ප්‍රාකාර බැම්ම සංරක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු හා ප්‍රමාද දෝෂයන් පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) හානිවී තිබූ ප්‍රාකාර බැම්ම නැවත ආරම්භ කිරීම**

සෝමාවතී පුරාවිද්‍යා ස්ථානයේ ප්‍රාකාර බැම්ම සංරක්ෂණය කිරීම 2014 වර්ෂයේදී ආරම්භකර නැගෙනහිර කෙලවර සිට බටහිර දිසාව දක්වා මීටර් 100 ක් දුරට සංරක්ෂණයෙන් පසු නතර කර තිබුණි.

ප්‍රාකාර බැම්මේ සංරක්ෂණ කටයුතු නතර කර තිබුණු ස්ථානයේ සිට බටහිර දිසාවේ මීටර 350 ක දිග දුරකට සංරක්ෂණය කිරීම සඳහා 2017 වර්ෂයේ නැවත ආරම්භ කර තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දින වන විට කටයුතු අවසන් කිරීමට ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කර තිබුණි.
ව්‍යාපෘති යෝජනාව අනුව රු.2,786,545 ක පිරිවැයක් දැරීමට ඇස්තමේන්තු ගත කර තිබුණු අතර ඒ සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදලෙන් මූල්‍ය ප්‍රතිපාදන සලසා ගැනීමට සැලසුම් කර තිබුණි.

**(ආ) ව්‍යාපෘති කටයුතු සඳහා අමුද්‍රව්‍ය සපයා ගැනීම**

සැපයුම් කොන්ත්‍රාත්තු ප්‍රදානය කර තිබුණද, සංරක්ෂණ කටයුතු ආරම්භ කර නොතිබීම මත සිමෙන්ති හා අළුහුණු සපයාගෙන නොතිබුණු අතර නියමිත ප්‍රමිතියෙන් නොවීම නිසා ගඩොල් මිලදී ගැනීමටද කටයුතු කර නොතිබුණි. වැලි කියුබ් 21.5 ක් හා පස් කියුබ් 165 ක් අදාළ සැපයුම්කරු 2017 නොවැම්බර් මාසයේදී සපයා තිබුණු අතර ඒ වෙනුවෙන් රු.701,125 ක් සැපයුම්කරු හට 2017 වර්ෂය තුළ ගෙවීම් කර තිබුණි.

**(ඇ) මිලදී ගනු ලැබූ අමුද්‍රව්‍ය වෙනම කාර්යයන් වලට යෙදවීම**

සෝමාවතිය ප්‍රාකාර බැම්ම සංරක්ෂණ ව්‍යාපෘති පරිශ්‍රයට මිලදී ගත් වැලි හා පස් පිලිබඳව 2019 ජුනි 15 දින ක්ෂේත්‍රයේ සිදුකල විගණන පරීක්ෂාවේදී සැපයුම් කළ ද්‍රව්‍ය එම පරිශ්‍රයේ නොමැති බව නිරීක්ෂණය විය. වැලි තොගය සෝමාවතිය පුදබිමේ ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා යොදාගෙන ඇති බවත්, පස් තොග පුදබිමේ ජලය රැදෙන පහත් ස්ථාන ගොඩකිරීමට යොදවා ගෙන ඇති බවත්, එය සිදුකලේ කලින් ව්‍යාපෘතිය භාරව කටයුතු කළ මධ්‍යම සංස්කෘතික අරමුදලේ නිලධාරියා බවත් ව්‍යාපෘතියට අනුයුක්ත කර සිටින පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ වැඩ මූලික සේවකයා විසින් විගණනයට ප්‍රකාශ කෙරුණි. එම කාලයේදී පුදබිමේ සංරක්ෂණ කටයුතු භාරව කටයුතු කළ මධ්‍යම සංස්කෘතික අරමුදලෙහි නිලධාරියා 2018 වර්ෂයේදී විශ්‍රාම ගොස් සිටි බව හා ඔහු විශ්‍රාම ගැනීමෙන් පසු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පොළොන්නරුව ප්‍රාදේශීය කාර්යාලයේ කාර්මික නිලධාරීවරයෙකු සෝමාවතී පුදබිමේ ප්‍රාකාර බැම්ම සංරක්ෂණ කටයුතු භාරව කටයුතු කරන බව විගණනයේදී නිරීක්ෂණය වූයෙන් මිලදී ගත් ද්‍රව්‍ය පිළිබඳව ඔහුගෙන් විමසීමේදී ප්‍රකාශකර සිටියේ මිලදී ගත් ද්‍රව්‍ය තමාට භාර දී නොමැති බවත්, පොළොන්නරුව කලාපභාර නිලධාරියා භාරයේ පවතින බවත්ය. මිලදී ගත් වැලි හා පස් තොග අවිධිමත් ලෙස උපයෝජනය කිරීම සම්බන්ධයෙන් මාස 18 කට වැඩි කාලයක් ඉකුත් වී තිබුණද පොළොන්නරුව ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂවරයා විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

**(ඈ) අමුද්‍රව්‍ය සපයා ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු වල ප්‍රමාදයන්**

සංරක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය ඉංජිනේරු ගඩොල් සැපයීම සඳහා අඩුම ලංසුව ඉදිරිපත් කළ සැපයුම්කරු සපයා තිබුණු ගඩොල් අපේක්ෂිත ප්‍රමිතියෙන් යුක්ත නොවීම හේතුවෙන් මිලදී ගැනීමට කටයුතු කර නොතිබුණි. එම ලංසුව ප්‍රතික්ෂේප කිරීමෙන් අනතුරුව මාස 18 ක් පමණ කාලයක් ඉකුත් වී තිබුණද ඉංජිනේරු ගඩොල් මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු මෙතෙක් සම්පූර්ණ කර ගැනීමට අපොහොසත් වී තිබුණි. මේ තත්ත්වය මත ප්‍රාකාර බැම්මේ සංරක්ෂණ කටයුතු 2017 දෙසැම්බර් 31 දින වන විට සම්පූර්ණ කළ යුතුව තිබුණද 2019 ජුනි 30 දින වන විටත් කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ඉ) **පෞරාණික වටිනාකම ආරක්ෂා වන පරිදි සංරක්ෂණ කටයුතු ඉටුකිරීම**

ඉංජිනේරු ගඩොල් භාවිතා කර ප්‍රාකාර බැම්මේ සංරක්ෂණ කටයුතු කිරීමට සැලසුම් කිරීම තුළින් ප්‍රාකාර බැම්මේ පුරාවිද්‍යාත්මක වටිනාකමට හානියක් සිදුවන බව නිරීක්ෂණය විය. සෝමාවතිය පුද බිම මහවැලි ගං මිටියාවතේ පිහිටීම නිසා වර්තමානයේ නිම්න ප්‍රදේශ ගොඩවීම හා ගොඩ කිරීමට කටයුතු කර තිබුණු හෙයින් පුරාණ ප්‍රාකාර බැම්ම මතුපිට පෘෂ්ඨයට ගැඹුරට යටින් පිහිටා තිබීම නිසා පැවති තත්ත්වයට වඩා උසින් ප්‍රාකාර බැම්ම ඉදිකර දෙපස පස් පිරවීමට කටයුතු කිරීම පුරාණ කාලයේ පැවති තත්ත්වය විකෘති වන බැවින් එසේ කිරීම පුරාවිද්‍යාත්මක වටිනාකමට හානියක් වන බව නිරීක්ෂණය විය.

### 3.4.7 චංචල පුරාවස්තු පිළිබඳව කටයුතු ක්‍රියාත්මක කිරීම

දෙපාර්තමේන්තුව ස්ථාපිත කර තිබුණු අවස්ථාවේ සිට මේ දක්වා දීර්ඝ කාලයක් තුළදී පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ කැණීම්, ගවේෂණ, ක්ෂේත්‍ර කටයුතු, පරිත්‍යාග යනාදීය මගින් ප්‍රාදේශීය කාර්යාලයට ලැබී තිබුණු චංචල පුරාවස්තු විශාල ප්‍රමාණයක් තමන්කඩුව කලාප කාර්යාල පරිශ්‍රයේ පරිභෝජ්‍ය ද්‍රව්‍ය ගබඩා කරන ගබඩා කාමරයක් තුළ ගොඩ ගැසීම හා එම ගබඩාවේ පිටත වේදිකාව තුළ "අනාරක්ෂිතව" තබා තිබුණි. ඒවා විධිමත් පරිදි ලේඛන ගත කිරීමට කටයුතු කර නොතිබුණු අතර චංචල පුරාවස්තු සටහන් කළ ඉන්වෙන්ටරි ලේඛනයක් පවතින බව හිටපු කාලපහාර නිලධාරිණිය දක්වා සිටියද ලේඛනය විගණනයට ඉදිරිපත් නොකෙරිණි. මේ සම්බන්ධයෙන් තවදුරටත් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) එක් එක් කැණීම් කාර්යයන් මගින් හමු වූ පුරාවස්තු හඳුනාගත හැකිවන පරිදි ආරක්ෂිතව ගබඩා කර නොතිබුණි.

(ආ) පුරාවස්තු ඇසුරුම් කිරීම සඳහා නිර්මිත අසුරුම් ද්‍රව්‍ය භාවිතා කර නොතිබුණි.

(ඇ) හදිසි අවස්ථාවකදී හෝ අධ්‍යනයකදී හෝ පුරාවස්තුව පහසුවෙන් තෝරාගත හැකිවන පරිදි ගබඩා කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) දීර්ඝ කාලයක් ඉකුත් වී තිබුණද එම පුරාවස්තු කෞතුකාගාර අංශය වෙත විධිමත් පරිදි භාරදීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) මේ ආකාරයෙන් පරිභෝජ්‍ය ද්‍රව්‍ය ගබඩාවක ගොඩගසා තැබීම හේතුවෙන් එම පුරාවස්තු විනාශ වීමත්, විකෘති වීමත් හේතුවෙන් පුරාවිද්‍යාත්මක වටිනාකම හීන වන බවත් වාණිජමය වටිනාකමක් පවතින පුරාවස්තු නැතිවීම් හෝ අස්ථාන ගතවීම් වලට හේතුවන බවත් නිරීක්ෂණය විය.

### 3.4.8 අම්පාර හා මඩකලපුව දිස්ත්‍රික්ක

ශ්‍රී ලංකාව තුළ පිහිටි සියළුම පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක වල අවශේෂයන් සංරක්ෂණය කිරීමත්, ඒවායේ කල්පැවැත්ම තහවුරු කර මතුපරපුරට දැනගැනීම සඳහා දායාද කිරීම සංරක්ෂණයේ කාර්යයභාරය ලෙස, එම කටයුතු වාස්තු විද්‍යාත්මක හා රසායනික වශයෙන් ක්‍රියාත්මක කිරීම සිදුකරනු ලබන අතර අනුගමනය කළයුතු පිළිවෙත් හා කාර්යය පටිපාටි පහත පරිදි හඳුන්වා දී තිබුණි.

i. වාස්තු විද්‍යාත්මක අවශේෂයන් ලේඛන ගත කිරීම.
ii. පුරාවිද්‍යා ස්මාරකවල නෛතික ආරක්ෂාව වෙනුවෙන් ගවේෂණ හා ලේඛනගත කිරීම ගොනු කිරීම.
iii. තහනම්වලින් මතුකරගත් වාස්තු විද්‍යාත්මක අවශේෂයන් සංරක්ෂණ කිරීම.
iv. වාර්තාවන ස්මාරක සම්බන්ධයෙන් සංරක්ෂණය කළයුතු ස්මාරක පිළිබඳ ලේඛනයන් ප්‍රමුඛතාවය අනුව පෙළ ගැස්වීම හා පිළියෙළ කිරීම.
v. සංරක්ෂණය සඳහා වාර්ෂික වැඩසටහන් සකස් කිරීම.
vi. වැඩසටහනට අදාළ ස්මාරක පිළිබඳ නිරීක්ෂණ වාර්තා සහ සංරක්ෂණ යෝජනාවලින් සකස් කිරීම.
vii. සංරක්ෂණය සඳහා යෝජිත ස්මාරකවල සැලසුම් සකස්කිරීම හා සංරක්ෂණ සැලසුම් සකස් කිරීම.
viii. පිරිවැය ඇස්තමේන්තු සකස්කිරීම හා ප්‍රතිපාදන වෙන්කර ගැනීම.
ix. බාහිර ආයතන/ පුද්ගලයින්ගේ ආධාර මත සිදුකරන සංරක්ෂණ කටයුතු පිළිබඳ වැඩසටහන් සකස් කිරීම.
x. සංරක්ෂණය සඳහා සුදුසු ද්‍රව්‍ය නියමිත ප්‍රමිතයෙන් යුතුව සපයා ගැනීමට කටයුතු කිරීම.
xi. සංරක්ෂණය ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු පළපුරුදු නිලධාරීන් අධීක්ෂණය සඳහා පත්කිරීම, සංරක්ෂණ ව්‍යාපෘති නිරන්තරව අධීක්ෂණය හා අවශ්‍ය කාලීන උපදෙස් ලබා දීම.
xii. සංරක්ෂණයෙන් අනතුරුව එය නඩත්තු කර පවත්වාගෙන යාම සඳහා පාර්ශවකරුවන්ට/ භාරකරුවන්ට හෝ නඩත්තු අංශය වෙත භාර දීම.
xiii. ඉටුකරනලද සංරක්ෂණ කාර්යය පිළිබඳ පූර්ණ වාර්තාවක් සකස් කිරීම.

අම්පාර හා මඩකලපුව දිස්ත්‍රික්කයන්හි සංරක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීමේදී ඉහත පියවරයන් යටතේ සංරක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීම කළ යුතුව තිබුණි. එහෙත් සංරක්ෂණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පහත තත්ත්වයන් නිරීක්ෂණය විය.

(අ) **අනුපිළිවෙලකට අනුවම ඉටුවිය යුතු කාර්යයන් ඉටුකිරීම**

අම්පාර හා මඩකලපුව දිස්ත්‍රික්කයන්හි පුරාවිද්‍යා ස්මාරකවල වාස්තු විද්‍යාත්මක සංරක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීමේදී වාස්තු විද්‍යාත්මක අවශේෂ හඳුනාගෙන ලේඛනගත කිරීම, ප්‍රමුඛතාවය මත සංරක්ෂණය කළ යුතු පුරාවිද්‍යාත්මක ස්මාරක හඳුනා ගැනීම, සංරක්ෂණය සඳහා වාර්ෂික වැඩසටහන් සකස් කිරීම, සංරක්ෂණය සඳහා යෝජිත ස්මාරකවල සැලසුම් හා සංරක්ෂණ සැලසුම් සකස්කිරීම යනාදී සංරක්ෂණයේදී අනුගමනය කළ යුතු මූලික කටයුතු ක්‍රියාත්මක කිරීම පිළිබඳ අවධානය යොමු වී නොතිබුණු අතර ක්‍රමවත් සැලසුමකින් තොරව සංරක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීමට පියවරගෙන තිබුණි.

(ආ) **සංරක්ෂණ කටයුතුවල ප්‍රගතිය**

2001 වර්ෂයේදී කැණීම් කටයුතු ආරම්භ කිරීමෙන් අනතුරුව සංරක්ෂණ කටයුතු ක්‍රියාත්මක කරනු ලැබූ දීඝවාපිය දාගැබ හා නීලගිරි දාගැබ සංරක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීමේදී අදාළ කටයුතුවල ඉතා දුර්වල ප්‍රගතියක් පවතින බව නිරීක්ෂණය විය. එහිදී කළමනාකරණ ආකර්යක්ෂමතා මෙන්ම අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීමේදී පැවති ප්‍රමාදයන් හා නියමිත ප්‍රමිතීන්ට හා පිරිවිතරයන්ට අනුව සැපයීම් කටයුතු සිදුනොවූ තත්ත්වයක්ද පැවතුණි.

## 3.5 ඛනිජ හා පාෂාණ නිස්සාරණ කටයුතු සඳහා නිර්දේශ ලබා දීම

### 3.5.1 පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ බලතල

(අ) 1940 අංක 9 දරණ පුරාවස්තු ආඥාපනතේ 24 වගන්තියේ විධිවිධාන පරිදි රජයේ ඉඩමක පිහිටි යම් පැරණි ස්මාරකයක් හෝ යම් ආරක්ෂිත ස්මාරයකින් ඔබ්බෙහි නියමිත දුර ප්‍රමාණයක් ඇතුළත යම් ඉඩමක ගොඩනැගිලි ඉදිකිරීමේ, පතල් කැණීමේ, ගල් කැඩීමේ හෝ පිපිරවීමේ කටයුතු පවත්වාගෙන යාම තහනම් කරමින් හෝ නියමිත කොන්දේසි වලට යටත්ව සීමා කරමින් හෝ නියෝග පැනවීමේ නීතිමය ප්‍රතිපාදන යටතේ පුරාවිද්‍යාත්මක සාධක නොමැති හෝ එම සාධක වලට හානියක් නොවන බව තහවුරු කර ගැනීමෙන් අනතුරුව ඛනිජ හා පාෂාණ නිස්සාරණ කටයුතු සඳහා පුරාවිද්‍යා නිර්දේශය ලබා දීමේ බලය පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාට පැවරී තිබුණි.

(ආ) එම බලතල අනුව පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය කාර්යාලය ස්ථාපිත කිරීමෙන් අනතුරුව පුරාවිද්‍යා ප්‍රාදේශීය බලප්‍රදේශය තුළ 2016 වර්ෂයේ සිට 2019 ජුනි 30 දක්වා කාලයට අදාළව ඛණිජ හා පාෂාණ නිස්සාරණ බලපත්‍ර සඳහා කළුගල් බිදුම් වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 7 ක් යටතේ ලබා දී තිබුණු නිර්දේශ සංඛ්‍යාව 84 ක් විය.

**3.5.2 දිඹුලාගල, සිරිපුර, මීවත්පුර, පළුදෙනිය ග්‍රාමයේ ගල්තලාවේ කළුගල් බිදීම**

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

**(අ) කැණීම් බලපත්‍ර ලබාගැනීම**

මහවැලි කලාපයට අයත් ඉඩමක් වන මෙම ගල්තලාවේ කළුගල් බිදීම් සඳහා 2004 වර්ෂයට පෙර කාලයේදී පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිර්දේශ ලබා නොගෙන හා අවසරයකින් තොරව අවිධිමත් ලෙස ලබාගත් කැණීම් බලපත්‍ර මත පුද්ගලයන් 04 දෙනෙකු විසින් කළුගල් කැඩීමේ ව්‍යාපාර 04 ක් පවත්වා තිබුණි. මෙම කළුගල් බිදුම් බලපත්‍ර අත්හිටුවන ලෙස සිරිපුර ග්‍රාම නිලධාරීවරයා වෙත නියෝග කර තිබූ බව දිඹුලාගල ප්‍රාදේශීය ලේකම්වරයාගේ 2004 පෙබරවාරි 25 දිනැති අංක NCP/TB/E/1/8/1 දරන ලිපියෙන් තහවුරු වේ.

**(ආ) අනවසර කැණීම් නතර කිරීම**

ප්‍රාදේශීය ලේකම්වරයා එසේ පෙන්වා දී තිබියදීත් එම අවිධිමත් පාෂාණ කැණීම් බලපත්‍ර අවලංගු කිරීමට හා 1940 අංක 9 දරන පුරාවස්තු ආඥාපනතේ විධිවිධාන පරිදි නෛතික කටයුතු ක්‍රියාත්මක කිරීමට උතුරු මැද ප්‍රාදේශීකයේ හිටපු ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂවරයා හා හිටපු පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා පියවර ගෙන නොතිබුණි. ඒ අනුව තවදුරටත් ගල් බිදුම් කටයුතු පැවැත්වීමට තිබුණු අවකාශය තුළින් ගල් බිදුම් කටයුතු කළ පුද්ගලයන් 04 දෙනා නොකඩවා මහා පරිමාණයෙන් කළු ගල් බිදුම් කටයුතු කර තිබුණි.

**(ඇ) පුරාවස්තු විනාශවීම සම්බන්ධ ගවේෂණ වාර්තාව**

"පළුදෙනිය මූලික ගවේෂණය" මැයෙන් ගල්තලාවේ ගවේෂණ කටයුතු 2004 වර්ෂයේදී සිදුකර තිබුණු අතර, ගවේෂණ වාර්තාව අනුව ස්ථූප ගොඩනැගිල්ලක්, කේතු කවාටයක් පස් සලකුණු, ශිලා අවශේෂ, ශිලාමය කණු පාදම්, ගොඩනැගිලි නටඹුන් යනාදී ස්මාරක හා පබළු, මැටි මෙවලම්, යබොර, පාෂාණ යනාදී සංස්කෘතික අවශේෂ ගල්තලාවේ උතුරු අන්තයේ උස්ම ස්ථානයේ පිහිටා තිබුණි. එම කොටසේ ගල් කැඩීමේ කටයුතු එක් පුද්ගලයකු විසින් සිදුකරන බවත්, එහි ගල් කැඩීම් සඳහා තැනින් තැන යන්ත්‍රානුසාරයෙන් මතුපිට පස්කැණීම් කටයුතු හේතුවෙන්

පුරාවස්තු විනාශකර ඇති බවත්, විනාශ වූ එම නටඹුන් පොළොව මත විසිරී පවතින බවත් දැක්වුණි. මේ හේතුවෙන් ගල්බිදීම් කටයුතු අප්‍රමාදව අත්හිටුවා එම පුද්ගලයාට එරෙහිව නෛතික කටයුතු ක්‍රියාත්මක කිරීම, ස්ථානයේ දැනට විනාශ නොවී පවතින පුරාවිද්‍යා අවශේෂ ආරක්ෂා කිරීම, ප්‍රදේශය පුරාවිද්‍යා රක්ෂිතයක් ලෙස ප්‍රකාශ කිරීම, විධිමත් ගවේෂණයක් සිදුකර පුරාවිද්‍යාත්මක ස්මාරක පුරාවස්තු ලේඛන ගත කිරීම හා මෙම ස්ථානයේ පැවති දැනට ගම් වැසියන් සන්තකයේ පවතින පුරාවස්තු සම්බන්ධයෙන් උචිත ක්‍රියාමාර්ග ගැනීම යනාදී නිර්දේශ ගවේෂණ වාර්තාවෙන් ඉදිරිපත් කර තිබූ නමුත් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් එවකට හිටපු පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා කටයුතු කර නොතිබුණි.

**(ඇ) තවදුරටත් නිස්සාරණ බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කිරීම**

තත්ත්වය එසේ තිබියදී ගල් තලාවේ කළුගල් බිදීම් සඳහා පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය මත සහකාර අධ්‍යක්ෂ (චංචල හා නිශ්චල දේපල) විසින් 2005 මාර්තු 18 දින ලබාදුන් නිර්දේශය පරිදි ප්‍රාදේශීය ලේකම්වරයා විසින් එක් පුද්ගලයෙකු වෙනුවෙන් ගල් බිදීම් පාෂාණ නිස්සාරණ බලපත්‍රයක් නිකුත්කර තිබුණි.

**(ඉ) අවලංගු කල බලපත්‍ර නැවත බලාත්මක කිරීම**

අනතුරුව පොළොන්නරුව පුරාවිද්‍යා කාර්යාලයේ ගවේෂණ නිලාධාරීවරයෙකු එම ප්‍රදේශයේ සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂණයේදී පුරාවිද්‍යා සාධක පවතින ගල්තලාවේ උතුරු අන්තයේ පෙර සඳහන් කල පුද්ගලයා විසින් විධිමත් අනුමැතියකින් තොරව සිදුකර ඇති ගල්බිදුම් කටයුතු හේතුවෙන් මතුපිට පෘෂ්ඨයේ පුරාවිද්‍යාත්මක සාධක විනාශ වෙමින් පවතින බව, ගල්තලාව මතුපිට හෝ ඒ ආශ්‍රිතව කිසිඳු පුරාවිද්‍යාත්මක සාධකයක් මතුපිටින් හඳුනාගැනීමට නොහැකිවන තරමට විනාශ වී ඇති බව නිරීක්ෂණය කර තිබුණි. ඒ බව තම ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාව මගින් උතුරු මැද පළාත් භාර ප්‍රාදේශීය පුරාවිද්‍යා සහකාර අධ්‍යක්ෂවරයා වෙත 2006 දෙසැම්බර් 01 දින දැනුම් දී තිබුණි. ඒ අනුව ගල් බිඳුම් කටයුතු අත්හිටුවා බලපත්‍ර අවලංගු කිරීමට කටයුතු කර තිබූ නමුත් ඔහු විසින් 2006 දෙසැම්බර් 22 දින පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ අභියාචනය අනුව තහනම් කළ ගල් බිඳුම් කටයුතු නැවත පවත්වා ගෙන යාමට හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයා හා හිටපු සහකාර අධ්‍යක්ෂ (චංචල හා නිශ්චල දේපල) නිලධාරීන් විසින් 2007 ජනවාරි 31 දින අනුමැතිය ලබා දී තිබුණි.

**(ඊ) බලපත්‍ර ලබාදීම සාධාරණීයකරණය කිරීම**

අදාළ ලිපිගොනුවේ දැක්වුණු වාර්තා සටහනක් අනුව එම අනුමැතිය ලබාදීමට හේතු ලෙස හිටපු සහකාර අධ්‍යක්ෂ (වංචල හා නිශ්චල දේපල) නිලධාරීවරයා 2007 ජනවාරි 24 දින වාර්තාකර තිබුණේ අදාළ කොන්ත්‍රාත්කරු සමඟ ස්ථානීය පරීක්ෂාවේදී එම ගල මත ආරක්ෂා කළයුතු යැයි හැගෙන පුරාවස්තු ඉතිරි වී නොමැති බව නිරීක්ෂණය වීමත් එම ගල්තලාවේ කොටසක ගල් බිදුම් කටයුතු පවත්වා ගෙන යාමට තවත් අයෙකුට අවසර දී ඇති බැවින් ඔහුට පමණක් අවසර ලබා දීම මත පළමු පුද්ගලයාට අසාධාරණයක් සිදු වන බවත්ය.

**(උ) නීත්‍යානුකූල පියවර ගැනීම**

නැවත බලපත්‍ර ලබා කළුගල් බිදුම් කරන අවස්ථාවේදී මහවැලි අධිකාරිය සිදුකළ පසුවිපරම් කිරීමේදී පළමු පුද්ගලයාට ලබාදුන් ගල් බිදුම් ස්ථානයේ පුරා සාධක පවතින බව නිරීක්ෂණය කර තිබුණි. එය තහවුරු කර ගැනීම සඳහා "පුරා සාධක තිබේද යන්න පිළිබඳව වාර්තා කරන ලෙස" ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරු විසින් 2008 නොවැම්බර් 06 දින පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දැනුම් දී තිබුණි. ඒ අය ප්‍රාදේශීය ගවේෂණ නිලධාරී විසින් ඒ පිලිබඳ සිදුකල ස්ථානීය පරීක්ෂාවේදී අනාවරණය කරගත් ආකාරයට එම ස්ථාන මහා පරිමාණ ගල් බඳුම් ස්ථාන ලෙස පත් කරගෙන පුරාවස්තු විනාශ කර ඇති බැවින්, නැවත එවන් බලපත්‍ර නොදීමට නිර්දේශ කිරීම සුදුසු බවට වාර්තා කර තිබුණි. එහිදී නීත්‍යානුකූල පියවර ගැනීමට යෝජනා කර තිබුණි.

**(ඌ) තරයේ අවවාද කිරීමට පමණක් සීමා වීම**

ඉහත තත්ත්වය මත බලපත්‍ර ලබා ගත් පළමු පුද්ගලයා විසින් කළුගල් බිදුම් කටයුතු 2009 වර්ෂයේදී අත්හැර දමා තිබුණි. තවද ඛනිජ හා පාෂාණ බලපත්‍රය නිකුත් කිරීම සඳහා පුරාවිද්‍යා නිර්දේශය ලබාදීම හේතුවෙන් පුරාවිද්‍යාත්මක සාධක විනාශ කළ බවට දක්වා පොළොන්නරුව ප්‍රාදේශීය ගවේෂණ නිලධාරීන් දෙදෙනෙකුට එරෙහිව විනය කටයුතු ක්‍රියාත්මන කර එම නිලධාරීන්ට තරයේ අවවාද කිරීමට හිටපු පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා කටයුතු කර තිබුණි.

**(එ) පැවති පුරාවස්තු සම්බන්ධයෙන් කටයුතු කිරීම**

තවද මෙම ගල්තලාව ආශ්‍රිතව පැවති පුරාවස්තු ප්‍රදේශවාසීන් රැගෙන ගොස් ඒවා ඔවුන් භාරයේ තබාගෙන ඇති බව විගණනයේදී අනාවරණය වූ අතර එම පුරාවස්තු පිළිබඳව සොයා බලා වාර්තා කර ලේඛනගත කිරීම හෝ ඒවා දෙපාර්තමේන්තුවේ සන්තකයට ලබා ගැනීමට මේ දක්වාම පියවර ගෙන නොතිබුණි.

### 3.5.3 මැදිරිගිරිය - දිග්ගල්පුර ග්‍රාමයේ ගලතලාවේ කළුගල් බිඳීම

මේ සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

**(අ) විගණනයේදී අනාවරණය වූ මූලික නිරීක්ෂණයන්**

i. ගල්තලාව අක්කර 20 ක පමණ භූමියක පැතිරී තිබුණු අතර ප්‍රදේශය හා ගල්තලාව රජයට අයත් රක්ෂිතයක් බව නිරීක්ෂණය විය.

ii. 2004 වර්ෂයට පෙර කාලයක සිට කළුගල් බිඳුම් කටයුතු සිදුකර තිබුණු අතර එම කාලයේදී ඛනිජ හා පාෂාණ නිස්සාරණ බලපත්‍ර නිකුත් කිරීම සඳහා පුරාවිද්‍යා නිර්දේශ ලබාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

iii. දීර්ඝ කාලයක සිට පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවසරයකින් තොරව කළුගල් බිඳුම් කටයුතු මහා පරිමාණ වශයෙන් සිදුකර තිබුණු අතර එම අනවසර කළුගල් බිඳුම් කටයුතු සිදුකිරීම සම්බන්ධයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට හෝ කළුගල් බිඳුම් කටයුතු අත්හිටුවා අවිධිමත් ලෙස ලබාගත් බලපත්‍ර අවලංගු කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

iv. 2004 වර්ෂයේදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ ගවේෂණ අංශය මගින් ස්ථානීය පරීක්ෂණයක් කර ඇති බවට අදාළ ලිපිගොනුවල ඇතුළත් ලිඛිත සාක්ෂි මත අනාවරණය විය. එම සාක්ෂි මත ගල්තලාවේ පුරාවිද්‍යාත්මක සාධක පැවති බව නිරීක්ෂණය විය.

v. දිග්ගල්පුර රක්ෂිත ප්‍රදේශයේ පුරාවිද්‍යා සාධක, පුරා ස්මාරක, පුරාවස්තු පිළිබඳව විධිමත් ගවේෂණයක් සිදුකර පුරාසාධක හඳුනා ගැනීම හා ඒවා ආරක්ෂා කිරීම වෙනුවෙන් එම කාලයේදී කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

vi. මේ අනුව කළුගල් බිඳුම් කටයුතු සිදු කිරීමෙන් දිග්ගල්පුර ගල්තලාවේ පැවති පුරාසාධක මේ වන විට සම්පූර්ණයෙන් ම විනාශ කර තිබුණු බව නිරීක්ෂණය විය.

**(ආ) ක්ෂේත්‍ර පරීක්ෂාවේදී වූ අනාවරණය වීම්**

ගල්තලාවේ කළුගල් බිඳුම් කර අත්හැර තිබුණු හා දැනට කළුගල් බිඳුම් කරන ස්ථාන ආශ්‍රිතව කළුගල් බිඳුම් කටයුතු පිළිබඳව ක්ෂේත්‍ර විගණන පරීක්ෂාවක් සිදු කෙරිණි. එහිදී නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

i. පුරාසාධක පැවති බවට ස්ථානීය පරීක්ෂණ වලින් හඳුනාගෙන තිබුණු ගල්තලාවේ මධ්‍යයේ භූමි කොටසක් ගල් කුලක් ලෙස පොලොව මට්ටමේ සිට මීටර් 30 ක පමණ උසකින් නග්නව පැවතුණි.

ii. එම බිම් කොටස වටා ගල් බිඳුම් කටයුතු පොලොව මට්ටමෙන් මීටර් 05 ක පමණ ගැඹුරට සිදු කිරීම නිසා එම බිම් කොටස ගල් කුලක් ලෙස නග්නව පැවතීමට හේතු වී තිබුණි. පුරාසාධක පවතින ගල්තලාවක් ආශ්‍රිතව නියමිත දුර (මීටර් 100,150,250,400 යන ආදී වශයෙන්) ප්‍රදේශයක් අත්හැර, එම අත්හැරි බිම් කොටස වටා ගල්තලාවේ අනිත් ස්ථාන සඳහා කළුගල් බිඳීම් බලපත්‍ර වෙනුවෙන් නිර්දේශයන් ලබා දීම තුළින් මෙම තත්ත්වය උද්ගත වී අති බව නිරීක්ෂණය විය. ඒ අනුව පුරාසාධක පවතින ස්ථානය අවට නිශ්චිත දුර ප්‍රමාණයක බාහිර ප්‍රදේශ සඳහා කළුගල් බිඳුම් බලපත්‍ර නිර්දේශයන් ලබා දීම වෙනුවට පුරාසාධක පවතින මුළු ගල් තලාවේම ගල් බිඳුම් කටයුතු බලපත්‍ර ලබා දී තිබීම මේ සඳහා හේතු පාදක වී තිබූ බව නිරීක්ෂණය විය.

iii. මෙම ගල් කුලෙහි මතුපිට පස් ස්ථර බොහෝ ප්‍රමාණයක් ඊට යාබද ගල් බිඳුම් කටයුතු අවස්ථාවලදී ඉවත් කර මතුපිට පුරාසාධක හඳුනාගැනීමට නොහැකි වන පරිදි විනාශ කර තිබුණු බව නිරීක්ෂණ විය.

iv. විගණන පරීක්ෂණ සඳහා ක්ෂේත්‍රයට යන අවස්ථාව වන විටත් එම බිම් කොටසේ අනවසර කළුගල් බිඳුම් කටයුතු කෙරෙමින් පැවති බවත් එම ස්ථානයට ළඟා වෙත්ම කළුගල් බිඳුම් කළ පුද්ගලයන් ඉවත්ව ගොස් තිබුණු බවත් නිරීක්ෂණය විය.

v. එම ගල්තලාව ආශ්‍රිතව බලපත්‍ර ලබාගෙන කළුගල් බිඳුම් කටයුතු කරන පුද්ගලයන් තිදෙනා කැඳවා සිදු කළ විගණන පරීක්ෂාවේදී ඔවුන් විසින් විගණනයට ප්‍රකාශ කරන ලද්දේ අනවසර කළුගල් බිඳීම් කටයුතු සිදුකරනුයේ තම ඥාතීන් බවත්, ජීවනෝපාය සකසා ගැනීම වෙනුවෙන් සිදු කරන බවත්ය.

vi. නමුත් විගණනයේදී නිරීක්ෂණය වූයේ බලපත්‍ර ලබාගෙන කළුගල් බිඳීම් කටයුතු සිදු කරන අයගේ යන්ත්‍ර සූත්‍ර, බරවාහන යොදාගෙන අනවසර කළුගල් බිඳීම් සිදුකරන බවත් බිඳීම් කරන කළුගල් ඔවුන්ගේ යන්ත්‍රාගාර තුළ ඇඹරීමට කටයුතු කරන බවත්, ඔවුන්ගේ යන්ත්‍රාගාර වලට අවශ්‍ය කළුගල් කුට්ටි සපයන සැපයුම්කරුවන් බවත්ය.

vii. මේ ආකාරයෙන් බලපත්‍ර ලබා හෝ අනවසරයෙන් කළුගල් බිඳීම් කර එම ප්‍රදේශ ආශ්‍රිතව පැවති පුරාවිද්‍යාත්මක සාධක විනාශ කර ශ්‍රී ලංකාවේ සංස්කෘතියට දැඩි අගතියක් හා විශාල පරිසර හානියක්ද සිදුකර තිබුණු බව නිරීක්ෂණය විය.

**(ඇ) බලපත්‍ර ලබාදීමට පෙර සිදුවිය යුතු තහවුරු කර ගැනීම්**

වැඩි වශයෙන්ම ගල්තලාවන් සහිත උස් බිම් ආශ්‍රිතව පොළොන්නරුව යුගයේ ඉපැරණි සංස්කෘතික ලක්ෂණ ශේෂ වී පවතින බව ක්ෂේත්‍රයේ විගණන පරීක්ෂණ වලින් අනාවරණය වූ බැවින් ඛනිජ හා පාෂාණ නිස්සාරණ බලපත්‍ර සඳහා පුරාවිද්‍යා නිර්දේශයන් ලබාදීමේදී ඒ ආශ්‍රිතව ගවේෂණයක් සිදුකර පුරාසාධක නොමැති බවට නිශ්චිතව තහවුරු කර ගැනීමෙන් අනතුරුව සිදු කල යුතු වූ නමුත් එසේ සිදුකර නොතිබුණි.

**(ඇ) බලපත්‍ර ලබාදීමේදී අනුගමනය කරන වැරදි ක්‍රමවේදයන්**

ගල්තලාව මත මතුපිට පෘෂ්ඨයේ පස් ස්ථර යන්ත්‍රානුසාරයෙන් ඉවත් කර, මතුපිට පෘෂ්ඨයේ පුරාසාධක නොපවතින ලෙසට පරිසරය නිර්මාණය කර, ඉන් අනතුරුව කළුගල් බිඳීමේ බලපත්‍ර සඳහා පුරාවිද්‍යා නිර්දේශයක් ලබා ගැනීමට බොහෝ කළුගල් බිඳුම්කරුවන් පෙළඹී සිටින බව විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය වූයෙන්, එම අවස්ථාවේදී මතුපිට පුරාසාධක නොමැති ලෙස සලකා බලපත්‍ර සඳහා නිර්දේශ ලබා දී තිබුණි.

**(ඉ) බලපත්‍ර ලබාදීමෙන් පසු සිදුවිය යුතු පසුවිපරම් කටයුතු**

ඛනිජ හා පාෂාණ නිස්සරාණ බලපත්‍ර සඳහා පුරාවිද්‍යා නිර්දේශය ලබාදීමෙන් අනතුරුව එම නිර්දේශ ලබා දීමට පැනවූ කොන්දේසි විධිවිධාන පරිදි කළුගල් බිඳුම් කටයුතු ක්‍රියාත්මක කෙරේද යන්න පිළිබඳව ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂවරයාගේ අධීක්ෂණය හා පාලනය සිදු විය යුතුය. එසේම කලාපභාර නිලධාරීවරයාගේ පරීක්ෂාව හා පසුවිපරම් කටයුතු ද සිදු කළ යුතුය. නමුත් එම නිලධාරීන් විසින් මෙම කටයුතු නිරන්තරයෙන් සිදු කර නොතිබුණි. මේ හේතුවෙන් අනවසර කළුගල් බිඳුම් කටයුතු කිරීමට අවකාශ සැලසී තිබුණි. එය පුරාවස්තු විනාශයට ඉවහල් වී තිබුණු බව නිරීක්ෂණය විය.

**3.6 අනාරක්ෂිත හා විනාශවීමේ අවධානමට මුහුණ දී ඇති පුරාවිද්‍යා ස්ථාන**

උතුරු නැගෙනහිර ප්‍රදේශයේ නියැදි පරීක්ෂාවට ලක්වූ එවැනි පුරාවිද්‍යා ස්ථාන කිහිපයක් සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත පරිදි වේ.

**3.6.1 අම්පාර දිස්ත්‍රික්කය**

අම්පාර දිස්ත්‍රික්කය තුල සිදුකළ ක්ෂේත්‍ර විගණන පරීක්ෂාවේදී භෞතිකව පරීක්ෂාවට ලක්කළ, පුරාවිද්‍යා ස්ථානවල තත්ත්වය පහත පරිදි නිරීක්ෂණය විය.

**(අ) මානික්ක මඩු පුරාවිද්‍යා ස්ථානය**

i. අම්පාර දිස්ත්‍රික්කයේ එරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටා ඇති පුරාවිද්‍යාත්මක වටිනාකම්වලින් අනූන මෙම ස්ථානය දීඝවාපී පරිවාර චෛත්‍යයක් වන අතර විනාශකර ඇති චෛත්‍යයේ විසිරී ගිය නටඹුන් කොටස් ගල් පර්වතය මුදුනේ හා පහළ කොටස්වල දක්නට ලැබුණි.

ii. පැරණි ගල්බැම්මක ලක්ෂණ සහිත ස්ථානයන්, කෝ වලක් භූමිය පුරා විසිරුණු මැටිබඳුන්වල කොටස්, උළු කොටස්, ගල්ලෙනක් ආදී පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් සාක්ෂි රාශියක් පවතින මෙම ස්ථානය විනාශ වීමේ අවදානමක් පවතී.

iii. මෙම ස්ථානයේ ගල්තලාවේ ඇති සෙල්ලිපියක මැකී ගිය අක්ෂර කිහිපයක් දක්නට ලැබුණු අතර ඒවා පිළිබඳ ශාස්ත්‍රීය ගවේෂණයක් සිදුකර නොමැති අතර ස්ථානීය පරීක්ෂාවක්ද කර නොතිබුණි.

iv. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මායිම් ගල් යොදා දෙපාර්තමේන්තුවට අයත් භූමිය දළ වශයෙන් වෙන්කර තිබුණද මැනුම් කටයුතු කිරීමක් කර නොතිබුණි. ඒ අනුව දක්වා ඇති සීමාවෙන් පිටතද පුරාවිද්‍යාත්මක සාධක පවතින බව නිරීක්ෂණය වූ අතර එම තත්ත්වය යටතේ භූමිය දක්වා ඇති මායිම් වෙනස්කර පුරාවිද්‍යාත්මක සාධක සහිත මුළු භූමියට අයත්වන ආකාරයට නැවත මායිම් කණු ඇමීම කළයුතු බවට ප්‍රාදේශීය පුරාවිද්‍යා නිලධාරීන් හඳුනාගෙන තිබුණද මේ දක්වාම එම කටයුතු ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන නොතිබුණි.

v. ප්‍රදේශයේ පැවති ත්‍රස්තවාදී ක්‍රියා හේතු කොට ගෙන වැඩවාසය කළ ස්වාමීන් වහන්සේලා ඇතුළු මුල් පදිංචිකරුවන් නිවාස ඇතුළු ඉඩම් අතහැර ආරක්ෂිත ස්ථාන කරා ගොස් තිබුණු අතර, වර්තමානය වන විට විවිධ පුද්ගලයන් විසින් ව්‍යාජ බලපත්‍ර ලබාගෙන අයිතිවාසිකම් දක්වමින් ඉකුත් ආසන්න වර්ෂ දෙකක කාලය තුළදී හා 2019 වර්ෂයේ ඉඩම් කොටුකර ගැනීම් හා තාවකාලික

ඉදිකිරීම් සිදුකරමින් පුරාවිද්‍යා සාධක පවතින භූමියද අත්පත් කර ගැනීමට කටයුතු කර තිබුණි. එහිදී පුරාවිද්‍යා මායිම් කණු ගලවා ඉවත් කිරීම්, මායිම් කණු සිටුවා ඇති ස්ථාන වෙනස් කිරීම් සිදුකර තිබුණි.

vi. විනාශ වී පවතින මෙම ස්ථානය ආරක්ෂා කර ගැනීම සම්බන්ධයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබු අතර විනාශ වී පවතින පුරාවස්තු හා මෙම භූමිය ආරක්ෂා කර ගැනීම සඳහා ස්ථානීය පරීක්ෂාවක් සිදුකර මෙම භූමිය සඳහා බිම් සැලසුම් ඇඳ විනාශ වී ඇති දාගැබ ඇතුළු අනෙකුත් ස්මාරක ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය කැණීම් කටයුතු හා සංරක්ෂණ කටයුතු නොපමාව සිදුකළ යුතු තත්ත්වයක පැවතුණි.



**(විනාශ වීමේ අවධානමට ලක්ව ඇති මාණික්මඩුව පුරාවිද්‍යා ස්ථාන සහ සංරක්ෂණ කටයුතු කඩිනම් කළයුතු ස්ථාන)**

(ආ) **විනාශකරමින් පවතින මෙට්ටයාල පුරාවිද්‍යා ස්ථානය**

අම්පාර අක්කරෙයිපත්තු අලයාඩිවෙම්බු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් අක්කරෙයිපත්තුව සාගම මාර්ගයේ ඇති මෙට්ටයාල පුරාවිද්‍යා ස්ථානය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ බුද්ධි අංශය 2019 අගෝස්තු 16 දාතමින් යුතුව පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකර ඇති කරුණු අනාවරණයට අනුව එම ස්ථානය හා පවතින පුරාවස්තු සංරක්ෂණය කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

i. මෙම පුරාවිද්‍යා ස්ථානය 2012 වර්ෂයේ අගෝස්තු 31 දින සිට මාස 03 ක කාලයක් තුළ අදාළ ප්‍රදේශයේ පදිංචිකරුවන්, ඔවුන්ගේ කුඹුරු ඉඩම් විශාල කිරීමේ අරමුණින් සංවිධානාත්මක ලෙස ඩෝසර් කර විනාශ කර තිබුණි.

ii. ඉහත විනාශ කිරීමට එරෙහිව නැගෙනහිර පළාතේ භික්ෂූන් වහන්සේලා ඇතුළු සංවිධාන විසින් කරනු ලැබූ විරෝධතා මත එම ස්ථානය ඩෝසර් කරන ලද පුද්ගලයන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රු.25,000 ක දඩ මුදලක් අයකර මුදාහැර තිබුණි. ඉන් අනතුරුවද මෙම පුරාවිද්‍යා ස්ථානය ආරක්ෂා කර ගැනීම සඳහා ප්‍රමාණවත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර වර්තමානය වන විට එම ස්ථානයේ සවිකර තිබුණු පුරාවිද්‍යා නාමපුවරුද විනාශ කරමින් එම භූමිය කුඹුරු ගොවිතැන් සඳහා ට්‍රැක්ටර් යොදා විනාශ කරමින් පවතින බවත් වාර්තාකර තිබුණි.

(ඇ) **ඩෝසර් දාගැබ**

අම්පාර දීඝවාපිය පුරාවිද්‍යා කලාප කාර්යාලයට අයත් අඩ්ඩාලච්චේන පල්ලේකාඩු ග්‍රාමයේ පිහිටා ඇති මෙම පුරාවිද්‍යා ස්ථානය වර්ෂ කිහිපයකට පෙර මෙම භූමියේ පැවති චෛත්‍ය ඇතුළු පුරාවිද්‍යා ස්මාරක සම්පූර්ණයෙන්ම ඩෝසර් යොදා විනාශ කර තිබුණි. එම ස්ථානය 2019 වර්ෂයේ සැප්තැම්බර් 18 දින සිදුකළ භෞතික පරීක්ෂාවේදී පහත තත්ත්වයන් නිරීක්ෂණය විය.

i. මෙම ස්ථානයේ පැවති දාගැබ සම්පූර්ණයෙන්ම පොළව මට්ටමට සමතලා කර තිබුණු අතර, වර්ෂ කිහිපයකට පෙර මෙම භූමියෙහි අනවසර පස්කැපීම් සිදුකර ඇති බවට තහවුරු කිරීම් සාක්ෂි පැවතුණි.

ii. චෛත්‍ය විනාශ කිරීම සිදුකර ඇති කාලවකවානුවේම අනවසර ඉදිරිකිරීම් හා අනවසර පදිංචිකිරීම් සිදුකර තිබුණි.

iii. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මෙම භූමිය සඳහා මායිම්කණු යොදා තිබුණද මැණුම් කටයුතු කර මැණුම් සැලැස්මක් සකස්කර ඒ අනුව එම කටයුතු සිදුකර නොතිබුණි.

iv. මායිම්කණු යොදා ඇති මෙම භූමිය හරහා අනවසර මාර්ග සකස්කරගෙන පාවිච්චි කරන තත්ත්වයක් නිරීක්ෂණය විය. මෙම භූමියේ ආරක්ෂාව සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් පත්කර ඇති දෙදෙනෙකු යොදවා ඇති බව සඳහන් කළද මෙම පුරාවිද්‍යා ස්ථානයට ප්‍රමාණවත් ආරක්ෂාවක් සලසා නොතිබුණි.

v. මෙම ස්ථානයේ වර්තමානය දක්වාම ශාස්ත්‍රීය ගවේෂණයක් සිදුකර නොමැති අතර කැණීම්, සංරක්ෂණ කටයුතු කිසිවක් සිදුකර නොතිබුණි. ඊට අවශ්‍ය සැලසුම් කිරීමක් පවා සිදුකර නොතිබුණි.

vi. චෛත්‍යය පැවති ස්ථානයේ භූමිය අනවසර හැරීම්වලට ලක්කර ඇති බවට තහවුරු කිරීම් පැවතුණි.

**ඩෝසර් දැගැබ**





**(ඇ) මඟුල් මහා විහාරය**

අම්පාර ලාහුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටි මඟුල් මහා විහාර පුරාවිද්‍යා ස්ථානය 2019 සැප්තැම්බර් 19 දින පරීක්ෂා කිරීමේදී පහත තත්ත්වයන් නිරීක්ෂණය විය.

i. පුරාවිද්‍යා කෞතුකාගාරයක් පවත්වාගෙන යාම සඳහා 2010 වර්ෂයේදී ඉදිකිරීම් කටයුතු කරමින් පැවති ගොඩනැගිල්ල 2013 වර්ෂයේ වැඩනිම කිරීමෙන් පසුවද ප්‍රයෝජනයට ගැනීමකින් තොරව වසාදමා තිබුණි.

ii. 2018 වර්ෂයේ ජුනි මාසයේදී මෙම ගොඩනැගිල්ලේ CCTV කැමරා පද්ධතියක් සවිකර තිබුණද කෞතුකාගාරයක් ආරම්භ නොකිරීම නිසා ඒවා ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවයක් ඇති වී නොතිබීම නිසා විගණන පරීක්ෂාව කරන දිනය වන විටත් නිෂ්ක්‍රීය තත්ත්වයේ පැවතුණි.

iii. මහුල් මහා විහාරයේ පිළිමගෙය, බෝධිගරය, ප්‍රාකාර බැම්ම, චෛත්‍ය කැණීම් කටයුතු 1980 දශකයේ දී සිදුකර ඇති බව අනාවරණය වුවද එම කැණීම් වලදී සොයාගනු ලැබූ පුරාවස්තු අංක කිරීම් කර ලේඛන ගත කිරීම් කටයුතු නිමකර නොතිබුණි.

iv. කෞතුකාගාර ගොඩනැගිල්ලට යාබදව ඇති කලාප කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලක් තුළ මගුල් මහා විහාරයේ කැණීම්වලින් සොයාගනු ලැබූ කෞතුක භාණ්ඩ මෙන්ම නීලගිරි චෛත්‍යයේ කැණීම් මගින් සොයාගත් කෞතුක භාණ්ඩද ගබඩා කර තිබුණි. ඒ අතුරින් අංක කිරීම් සිදුකර ලේඛනගත කර ඇති සංඛ්‍යාව 270 ක් පවතින කෞතුක භාණ්ඩ වලින් වැඩි ප්‍රමාණයක් ලේඛනගත කිරීමකින් තොරව පවතින බව හෙළිදරව් විය. ඒ අතුරින්ද මහුල් මහා විහාරයේ කැණීම් වලදී සොයාගනු ලැබූ කෞතුක භාණ්ඩ වැඩි සංඛ්‍යාවක් ඒ අතර පැවති බව අනාවරණය විය.

v. මෙම ස්ථානයේ පවතින පෞරාණික ස්මාරක අතුරින් ඇතුල් මළුව තුළ පවතින චෛත්‍යය 1978 දී පමණ සංරක්ෂණය කර තිබුණු අතර සඳකඩ පහනක් සහිත නටඹුන් වූ ගොඩනැගිල්ල පිළිමගෙය, බෝධිගරය සංරක්ෂණය කර ආරක්ෂාකර ගැනීම කෙරෙහි විශේෂ අවධානයක් යොමුකළ යුතු තත්ත්වයේ පැවතුණි.

vi. ඇතුල් මළුව තුළ පෙර කැණීම් වලින් ඉවත් කරණු ලැබූ පස් ඉතා අවිධිමත් ලෙස බැහැර කිරීම නිසා පස් ගොඩනැගිලි වශයෙන් පැවති අතර, ඒ තුළින් භූමියේ අලංකරණයට හානි සිදුවීමක් මෙන්ම ස්මාරක නරඹන්නන්ට ද බාධාකාරී තත්ත්වයක් ඇති වී තිබුණි. වැසි ජලය බැස යාමටද පස් ගොඩැලි වශයෙන් පැවතීම බාධාවක් වී තිබුණි.

vii. ඇතුල් මළුවේ පවතින සඳකඩ පහන සහිත නටඹුන් වූ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් පහත තත්ත්වයන් නිරීක්ෂණය විය.

- ශ්‍රී ලංකාවේ පවතින අනෙකුත් පෞරාණික ස්ථානවලින් හමු වී ඇති සඳකඩ පහන්වල රූප වල පවතින ලක්ෂණ මෙන්ම ඒවායේ නොමැති විශේෂ කැටයම් රටාවන්ගෙන් යුක්ත මෙවැනි සඳකඩ පහනක් හමුවී ඇති එකම ස්ථානය ලෙස මෙම සඳකඩ පහන හඳුනාගෙන තිබුණි. එහෙත් වැසි දින වලදී එක් රැස්වන ජලයෙන් සම්පූර්ණයෙන්ම සඳකඩ පහන වැසී යන අතර

අනතුරුව සේවකයින් යොදවා එම ජලය ඉවත් කිරීමට සිදුවන තත්වයක් ඇති වී තිබුණි.

- වැසි ජලයත් සමඟ රොන් මඩ තැන්පත් වීම නිසා මෙහි ඇති සියුම් ලියවැල්, සත්ත්ව රූප, කැටයම් රටාවන් වැසී යාමට ලක්වන අතර ඒවා නිරන්තරව ශුද්ධ පවිත්‍ර කිරීමේදී ද සඳකඩ පහනට හානි වීමේ අවදානමක් පැවතුණි.
- සඳකඩපහණ සහිත මෙම ගොඩනැගිල්ල අවශ්‍ය කැණීම් කටයුතු සිදුකර ප්‍රදර්ශන මට්ටමට සුදුසු පරිදි සංරක්ෂණය කිරීම කඩිනමින් සිදුකළ යුතු කටයුත්තක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

viii. මෙහි පවතින පිට මළුවේ තත්ත්වය පරීක්ෂා කිරීමේදී පහත තත්ත්වයක් නිරීක්ෂණය විය.

- ප්‍රකාර බැම්ම විනාශ වීමට ලක්ව නටඹුන් තත්ත්වයේ පැවති අතර මේ දක්වාම එහි සංරක්ෂණය කිරීම සිදුකර නොතිබුණි.
- මෙම පුරාවිද්‍යා භූමිය සඳහා මායිම් කණු යොදා තිබුණද මැණුම් කටයුතු සිදුකර සැලැස්මක් සකස් කර නොතිබුණි.
- මෙහි සෙල්ලිපි 02 ක් හා පාපිසි ගලක් පැවති අතර සෙල්ලිපිවලට හායනයෙන් සිදුවිය හැකි හානි වලක්වා ගැනීම සඳහා සංරක්ෂණය කළ යුතුව පැවතුණි.
- පිටමළුව තුළ විශාල පොකුණු කීපයක් පැවති අතර එක් පොකුණක සංරක්ෂණ කටයුතු මධ්‍යම සංස්කෘතික අරමුදලේ කාර්යය මණ්ඩලය විසින් සිදුකරමින් සිටි අතර එම පොකුණේ කැණීම් හා සංරක්ෂණ කටයුතුවලට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ අධීක්ෂණයක් හෝ සහභාගීත්වයක් දක්නට නොලැබුණි. එහිදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කැණීම් හා සංරක්ෂණ කාර්යය නියමයන්ට අනුව සිදුකරන බවක් නිරීක්ෂණය නොවුණි. එහිදී මධ්‍යම සංස්කෘතික අරමුදලේ ස්ථානභාර නිලධාරියෙකු ලෙස කටයුතු කරනු ලබන අයගේ අධීක්ෂණය යටතේ එම සංරක්ෂණ කටයුත්ත සිදු කළ අතර ඔහු තාක්ෂණික නිලධාරියකුද නොවන තැනැත්තෙකු බව ඔහුගෙන් කරණු විමසීමේදී අනාවරණය විය.

ix. ඉහත තත්ත්වයන් මහල් මහා විහාරය නැරඹීමට පැමිණෙන දේශීය හා විදේශිකයන්ගෙන් මුදල් අයකිරීම සඳහා ටිකට්පත් නිකුත් කිරීමට 2019 වර්ෂයේ ජූලි මාසයේ සිට කටයුතු කර තිබුණි.

මඟුල් මහා විහාරය



කෞතුකාගාරයක් ඉදිකිරීම සඳහා පවත්වා ගෙන යාම සඳහා වැඩ නිම කළ ගොඩනැගිල්ල



කෞතුකාගාරයක් ඉදිකිරීම සඳහා පවත්වා ගෙන යාම සඳහා වැඩ නිම කළ ගොඩනැගිල්ලේ සීසීටීවී පද්ධතිය









**(ඉ) ශාස්ත්‍රවෙල පුරාවිද්‍යා ස්ථානය**

අම්පාර නගරයේ සිට කි.මී.90 ක් පමණ දුරින් පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටා ඇති මෙම විහාරස්ථානය මණිනාග පබ්බත බෝධිගිරි විහාරය වශයෙන් හඳුන්වන අතර, වර්තමානයේ මෙම විහාරස්ථානයේ පිරිවෙනක් පවත්වාගෙන යාමද සිදුකරනු ලබයි. මෙම පුරාවිද්‍යා ස්ථානය 2019 සැප්තැම්බර් 18 දින පරීක්ෂාවේදී පහත තත්ත්වයන් නිරීක්ෂණය විය.

i. අක්කර විස්සකට (20 ) ආසන්න භූමි ප්‍රමාණයකින් යුත් මෙම පුරාවිද්‍යා ස්ථානය 2014 වර්ෂයේදී මූලික ගවේෂණයක් සිදුකර තිබුණි. ඒ අනුව මෙම භූමියට මායිම්කණු යොදා තිබුණද මිණුම් කටයුතු සිදුකර මිණුම් සැලැස්මක් සකස්කර නොතිබුණි.

ii. මෙම ස්ථානයේ කටාරම් කෙටූ පිළිමගෙයක් පැවති අතර පිළිමය විනාශවීමට ලක්ව පැරණි ගඩොල් බැම්මද විනාශ වී තිබුණි.

iii. මෙම පුරාවිද්‍යා භූමියෙහි උස් බිමෙහි පිහිටා ඇති කුඩා චෛත්‍ය තුනක් නිදන් සෙවීමේ අරමුණින් විනාශ කර තිබුණු අතර ඉන් එක් චෛත්‍යයක් 2019 වර්ෂයේ අගෝස්තු මාසයේදී සංරක්ෂණ කටයුතු ආරම්භ කර තිබුණි. එම ස්ථානයේ කැණීම් කිරීමක් සිදුකර නොතිබුණි. ඉතිරි චෛත්‍ය දෙකෙහි ද නිදන් සෙවීමේ අරමුණින් හාරණු ලැබූ වලවල් දෙකක් දක්නට ලැබුණි.

iv. ඉහත චෛත්‍ය තුනට වඩා විශාලත්වයෙන් යුත් තවත් චෛත්‍යයක් මෙම විහාරස්ථානයේ පහළ කොටසේ තිබී විනාශ කිරීමට ලක්කර තිබුණි. නටඹුන් ලෙස පැවති එම චෛත්‍යයේ ගඩොල් අවට විසිරී පැවති අතර විනාශ කර ඇති කාල වකවානුව හඳුනාගෙන නොතිබුණි. මෙම භූමිය අවට කඳුගැටවලද විනාශයට ලක්කර ඇති තවත් චෛත්‍ය ගොඩැලි පවතින බව අනාවරණය විය.

v. මෙම භූමියෙහි පවතින ලෙන් පහක භාවනා යෝගීව වැඩවාසය කරන භික්ෂූන් වහන්සේලා සිටින අතර පුරාවිද්‍යා භූමියක් ලෙස ශාස්ත්‍රීය ගවේෂණයක් සිදුකර කැණීම් කටයුතු හා සංරක්ෂණ කටයුතු කඩිනමින් සිදුකළ යුතු ස්ථානයක් ලෙස නිරීක්ෂණය විය.

vi. මෙම භූමිය තුළ සෙල්ලිපියක්ද පැවති අතර, ඒ තුළින් කාවන්තිස්ස රජතුමා ගැන ලියවී ඇතැයි ප්‍රකාශ කලද අභිලේඛන හා නාණක විද්‍යා අංශයේ පර්යේෂණයට භාජනය වූ සෙල්ලිපියක් බවට විගණනයට ඉදිරිපත් කර ඇති තොරතුරු අනුව තහවුරු නොවුණි.

ශාස්ත්‍රවෙල පුරාවිද්‍යා ස්ථානය



### 3.6.2 මඩකලපුව දිස්ත්‍රික්කය

මඩකලපුව දිස්ත්‍රික්කය තුල සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී අනාවරණය වූ අනාරක්ෂිත හා විනාශවීමේ අවධානමට මුහුණ දී ඇති පුරාවිද්‍යා ස්ථානවල විස්තර පහත පරිදි විය.

**(අ) විහාර තෝට්ටම් පුරාවිද්‍යා ස්ථානය**

නිරීක්ෂණ පහත පරිදි විය.

i. මෙම පුරාවිද්‍යා ස්ථානය මඩකලපුව දිස්ත්‍රික්කයේ එරාවූර්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් මාවඩිවෙම්බු ග්‍රාමයේ 02 ග්‍රාම නිලධාරී වසමේ අක්කර 08 කට අධික භූමි ප්‍රමාණයකින් යුක්ත පුරාවිද්‍යා ස්මාරක හා පුරාවස්තු පැතුරුණු භූමි භාගයකි. එරාවූර් නගරයේ සිට ත්‍රිකුණාමලය මඩකලපුව ප්‍රධාන මාර්ගයේ කි.මී.13 ක් පමණ ගමන්කළ පසු දකුණු පසින් හමුවන මාවඩි වෙම්බු මාවතේ කි.මී.2 ක පමණ දුරින් පිහිටා ඇත.

ii. ඓතිහාසික වශයෙන් ගත්විට අනුරාධපුර යුගයට අයත් යැයි සලකන පුරාවිද්‍යා සාධක රාශියක් දක්නට ලැබෙන අතර භික්ෂූන් වහන්සේලා භාවිතා කරනු ලැබූ බෞද්ධාගමික විහාරස්ථානයක් ලෙස සැලකේ. ස්තූපය ප්‍රධාන කොටගත් ගල්කණු සහිත ගොඩනැගිලි වලින් යුක්තව පැවති මෙම ස්ථානය සම්පූර්ණයෙන්ම ඩෝසර් යොදා විනාශ කර තිබුණි. 2018 වර්ෂයේදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මූලික හඳුනා ගැනීමේ ගවේෂණයක් සිදුකර තිබුණි. එහෙත් 2019 සැප්තැම්බර් 20 දින විගණිත පරීක්ෂාව සිදුකරන දිනය වන විටත් ශාස්ත්‍රීය ගවේෂණයක් සිදුකිරීම, කැණීම් කටයුතු හෝ සංරක්ෂණ කටයුතු සඳහා සැලසුමක් හෝ සකස් කර නොතිබුණි.

iii. විනාශ කරන ලද ස්තූපයේ ගඩොල් කොටස් අවට විසිරී පැවති අතර, බොරදම් ගඩොල්, ස්තූප නිර්මාණයට ගන්නා හිරිගල් කොටස්, ස්තූපයට නැගෙනහිරින් හා බටහිරින් ගොඩනැගිලි පිහිටි බවට හඳුනාගත හැකි ගොඩනැගිලි වල ගල්කණු කොටස්, ශිලා පාදම් සහිත ගොඩනැගිල්ලක සාධක, කුඩුම්බි ගල් හා කැටයම් රහිත සඳකඩ පහනක් පැවති බවට හඳුනාගෙන තිබුණි. ස්තූපය පැවති ස්ථානයේ මීටර් හතරක පමණ දිගකින් හා පළලකින් යුත් මීටර් එකක් පමණ ගැඹුරට හෑරූ අනවසර කැණීමක් පිළිබඳ වාර්තා කිරීමක්ද සිදුකර තිබුණු අතර එය එම ස්ථානයේ පුරාවස්තු ඇතැයි සලකා ඒවා ලබා ගැනීමේ අරමුණින් සිදුකරනු ලැබූවක් බව තහවුරු වේ.

iv. මානව මැදිහත්වීමට ලක්ව ඇති රජය සතු මෙම භූමියෙන් කොටසක් 2018 වර්ෂයේදී පුද්ගලයින් තිදෙනෙකු විසින් ඉඩම් කට්ටි තුනක් යටතේ වෙන්කර ගෙන තාවකාලික ඉදිකිරීම් සිදුකරමින් වගා කටයුතුවල නිරත වී තිබුණි. එම තාවකාලික ඉදිකිරීම් පසුව ස්ථිර ඉදිකිරීම් බවට පත්වීමට ඉඩ තිබුණි. ඔවුන් විසින් කොටුකරගෙන ඇති ඉඩම් තුනෙහිම පැවති පුරාවස්තු විනාශ කර තිබුණු අතර එක් පුද්ගලයෙකු මෙම ස්ථානයේ වැලි බහුල භූමියක් බැවින් ඔහුගේ ඉඩම් කොටසේ චෛත්‍යයේ විනාශකර ඇති පස් යොදාගෙන වගා කටයුතු යුතු සිදුකර ගෙන තිබුණි.

v. බෞද්ධ පුරාණ දාගැබක් සහිත පුරාවස්තු ඇති ඉඩමක් එළිපෙහෙලි කිරීම සම්බන්ධයෙන් 2019 ජුනි 26 දින එක්තරා භික්ෂූන් වහන්සේ නමක් විසින් කරණු ලැබූ පැමිණිල්ලකට අනුව එක් පදිංචිකරුවෙකු පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන 2019 ජුලි 10 දක්වා රක්ෂිත බන්ධනාගාරගත කර තිබුණු අතර, නිදහස්ව පැමිණීමෙන් අනතුරුවද එම ඉඩමේ තාවකාලික ඉදිකිරීමක් සිදුකර වගා කටයුතු වල යෙදී සිටින බව 2019 සැප්තැම්බර් 20 දින සිදුකළ විගණන පරීක්ෂාවේදී ද

තහවුරු විය. මෙම අනවසර පදිංචිකරුවන් විසින් සිදුකර ඇති පුරාවස්තු විනාශ කිරීම් කිහිපයක් පහත ඡායාරූප මගින් දක්වා ඇත.

**විහාරතෝට්ටම් පුරාවිද්‍යා ස්ථානයේ අනවසර පදිංචි වීම් හා විනාශ වීම්**



vi. මෙම පුරාවිද්‍යා භූමිය සඳහා මායිම් කණු යෙදීමද 2019 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ සිදුකරමින් පැවති අතර මායිම් කණු සිටුවීම අවසන් කර නොතිබුණි.

**(ආ) පන්කුඩාවේලි පුරාවිද්‍යා ස්ථානය**

මඩකලපුව දිස්ත්‍රික්කයේ වෙන්කලඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශය තුළ පිහිටා ඇති මෙම පුරාවිද්‍යා ස්ථානය 2019 අගෝස්තු 22 දින සිදුකළ පරීක්ෂාවේදී පහත තත්ත්වය නිරීක්ෂණය විය.

i. බදුල්ල, මඩකලපුව ප්‍රධාන මාර්ගයට මායිම්ව පිහිටි මෙම පුරාවිද්‍යා භූමිය 2018 වර්ෂයේදී එම මාර්ගය සංවර්ධනය කර පුළුල් කිරීමේදී ද පැවති චෛත්‍යයේ ප්‍රකාර බැම්ම ප්‍රධාන මාර්ගයට යට වී තිබුණි. වර්තමානය වන විට මෙම පුරාවිද්‍යා භූමිය ප්‍රධාන මාර්ගය නිසා දෙකඩ වී පවතින අතර, මාර්ගය සංවර්ධන කර නව ඉදිකිරීම් ආරම්භ කිරීමටත් පෙර මෙම ස්ථානයේ 2017 වර්ෂයේ සිදුකර ඇති කැණීම් මගින් පැවති චෛත්‍යයේ ප්‍රකාර බැම්ම මාර්ග යටින් පවතින බව හඳුනාගෙන තිබුණි. ඒ අනුව ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලයට හා පුරාවිද්‍යා ප්‍රධාන කාර්යාලය වෙත ඒ බව වාර්තා කර තිබුණද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් එම තත්ත්වය වෙනස් කිරීම සඳහා ක්‍රියාකාරී ලෙස මැදිහත් වී නොතිබුණි. අම්පාර ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය විසින් පුරාවිද්‍යා ප්‍රධාන කාර්යාලය දැනුවත් කිරීම් කර තිබුණේ 2019 වර්ෂයේදී බව නිරීක්ෂණය වේ.

ii. මෙම පුරාවිද්‍යා ස්ථානයට ජනශූන්‍ය විශාල තැනිතලා භූමියක් අවට පැවතීමත් නිසා මාර්ගයේ ඉදිකිරීම් සැලසුම් සකස් කිරීමේදී පුරාවිද්‍යා භූමිය ආරක්ෂා වන පරිදි එම සැලසුම් සකස්කර මාර්ගය ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීමට හැකියාවක් පැවතියේද යන්න පිළිබඳව මාර්ගය ඉදිකිරීමේදී සැලකිල්ලට ගෙන නොතිබුණු අතර ඒ පිළිබඳව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ද ඉල්ලීමක් කර නොතිබුණි.

iii. විනාශකර පැවති මෙම චෛත්‍යයේ කැණීම් කටයුතු 2017 වර්ෂයේදී අවස්ථා තුනක් යටතේ සිදුකර තිබුණු අතර, කැණීම් වලින් හඳුනාගනු ලැබූ වලං කැබලි, මැටි මෙවලම් වලට අමතරව කැණීම් සිදුකළ දෙවන අවස්ථාවේදී ගල්වලින් කරන ලද කරඬු, කාසි වැනි පුරාවස්තු 21 ක් අම්පාර පුරාවිද්‍යා

කාර්යාලයට භාර දී තිබුණි. සොයා ගනු ලැබූ එම පුරාවස්තු රසායන සංරක්ෂණයක් සිදුකර නොතිබුණු අතර අම්පාර පුරාවිද්‍යා කාර්යාලයේ ගබඩාකර තිබුණි. එම තත්ත්වය යටතේ ලැබුණු පුරාවස්තු පොළව අභ්‍යන්තරයේ පවතිනවාටත් වඩා අනාරක්ෂිත තත්ත්වයක පැවතුණි.

iv. මෙම පුරාවිද්‍යා භූමිය සඳහා මායිම් කණු සිටුවීමට මායිම් ගල් රැගෙන විත් තිබුණද ඒවා සිටුවීම සිදුකර නොතිබුණි. මෙම භූමියේ ද මැනුම් කටයුතු කිරීමක් සිදුකර නොතිබුණු අතර මැණුම් සැලැස්මක්ද නොතිබුණි.

v. මඩකපුව දිස්ත්‍රික්කයට අයත් වෙන්කලඩි කලාප කාර්යාලය මෙම ස්ථානයේ පවත්වා ගෙන යනු ලබන අතර එය ටකරන් තහඩු යොදා තාවකාලිකව ඉදිකරනු ලැබූ ස්ථානය ලෙස පැවතුණි. එම ස්ථානයට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සංවර්ධන නිලධාරියෙකු, පුරාවිද්‍යා කම්කරු දෙදෙනෙකු හා මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ පුරාවිද්‍යා සහායකයින් පස් දෙනෙකු අනුයුක්ත කර තිබුණි.

**(ඇ) උෂලාන මලේ පුරාවිද්‍යා ස්ථානය**

මඩකලපුව දිස්ත්‍රික්කයේ වෙන්කලඩි කලාපයට අයත් මෙම පුරාවිද්‍යා භූමියද 2019 සැප්තැම්බර් 22 දින භෞතික පරීක්ෂාවට ලක් කිරීමේදී පහත තත්ත්වයන් නිරීක්ෂණය විය.

i. මෙම පුරාවිද්‍යා ස්ථානයේද මැණුම් කටයුතු සිදුකර මැණුම් සැලැස්මක් සකස් කර නොතිබුණු අතර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මායිම් කණු යෙදීමට කණු රැගෙන විත් තිබුණද ඒවා සිටුවීම සිදුකර නොතිබුණි. ගවේෂණ නිලධාරීන්ගේ තීරණ හා මායිම් නිසි පරිදි පෙන්වා නොදීම එම තත්ත්වයට හේතු වී තිබුණි.

ii. 2018 වර්ෂයේදී මූලික ගවේෂණයක් සිදුකළ බව සඳහන් කළද, ශාස්ත්‍රීය ගවේෂණ සිදුකර නොතිබුණි.

iii. මෙම භූමියේ කැණීම් කිසිවක් සිදුකර නොතිබුණු අතර කිසිදු සංරක්ෂණ කටයුත්තක්ද සිදුකර නොතිබුණි.

iv. ගල්තලාවන් බහුලව පවතින උස්බිමක පවතින මෙම පුරාවිද්‍යා ස්ථානයට යාබදව පහත් බිමෙහි කුඹුරු යායක් හා වැවක් පිහිටා ඇති අතර පුරාවිද්‍යා භූමියේ අනවසර ඉදිකිරීම් 03 ක් සිදු කර තිබුණි. එම ඉදිකිරීම් 2019 වර්ෂයේ හෝ ඊට ආසන්න වර්ෂයකදී අළුතින් ඉදිකරනු ලැබූවක් බව නිරීක්ෂණය විය. ඒ අතර අළුතින් ඉදිකරනු ලැබූ පාළුවට ගිය කෝවිලක් පැවති අතර, එම ඉඩම් කොටුකර ගැනීම මෑතකදී සිදුකර තිබුණු අතර අළුතින් යොදා ඇති කොන්ක්‍රීට් කණු අනුවද ඒ බව තහවුරු විය. ඒ අනුව මෙම පුරාවිද්‍යා භූමිය

ආරක්ෂාකර ගැනීමට ප්‍රමාණවත් ආරක්ෂාවක් සැපයීමට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව අසමත් වී තිබුණි.

v. මෙම පුරාවිද්‍යා භූමියෙහි පැවති චෛත්‍යය විනාශ කිරීමට ලක්ව ඇති බවත්, පුරාවිද්‍යා භූමියට අයත් කඳු මුදුනේද කෝවිලක් ඉදිකර ඇති බවත්, ගල් ලෙන් 20 ට අධික ප්‍රමාණයෙන් පැවති බවටත් කලාප නිලධාරී විසින් විගණනය වෙත හෙලිදරව් කර තිබුණි.

**(ඇ) කරඳගහ ඇල පුරාවිද්‍යා ස්ථානය**

මඩකලපුව දිස්ත්‍රික්කයේ වෙන්කලඩි (එරාවූර්පත්තු) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වෙන්කලඩි කලාප කාර්යාලය තුළ පිහිටා ඇත. එම ස්ථාන කරඳගහ ඇල - 01 හා 02 වශයෙන් හඳුනාගෙන තිබුණි. 2019 සැප්තැම්බර් 22 දින එම ස්ථාන පරීක්ෂාවට ලක්කිරීමේදී කරඳගහ ඇල - 01 ස්ථානයට අදාලව පහත තත්ත්වයන් නිරීක්ෂණය විය.

i. ගල්තලාවක ඉදිකර තිබූ විනාශ වී ඇති චෛත්‍ය දෙකක නටඹුන් පැවතුණු අතර, ප්‍රදේශයේ අවට චෛත්‍යයේ ගඩොල් කොටස් විසිරී පැවතුණි.

ii. මෙම ස්ථානයේ ශාස්ත්‍රීය ගවේෂණයක් සිදුකර නොතිබුණු අතර කැණීම්, සංරක්ෂණ කටයුතු කිසිවක් සිදුකර නොතිබුණි.

iii. 2017 වර්ෂයේදී මෙම ස්ථානයේ මූලික ගවේෂණයක් සිදුකර මායිම් කණු රැගෙනවිත් තිබුණද ඒවා සිටුවීම සිදුකර නොතිබුණි. මූලික ගවේෂණයට සහභාගී වූවන්ගේ සහභාගීත්වය ලැබෙනතෙක් මායිම් කණු සිටුවීම ප්‍රමාද වී ඇති බව විගණනයේදී අනාවරණය විය.

කරඳගහ ඇල - 02 ස්ථානයට අදාලව පහත තත්ත්වයන් නිරීක්ෂණය විය.

i. මෙම ස්ථානයේ අනවසර කැණීම් නිසා විනාශයට පත් වූ චෛත්‍ය 05 ක නටඹුන් පවතින අතර හාරනු ලැබූ වලවල්ද දක්නට ලැබේ.

ii. පාදම්ගල් පැරණි ගොඩනැගිල්ලක නටඹුන් දක්නට ලැබුණු අතර ගලේම තනා ඇති ගල්පඩි, ගල්කණු කොටස් වැනි දෑ යොදා සාදන ලද පඩි පේළියක ලක්ෂණ හා සඳකඩ පහනක හැඩැති චක්‍රගල් 02 දක්නට ලැබුණද ඒවා සංරක්ෂණය කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

iii. උස් ගල්තලාවකින් යුක්ත මෙම භූමියේ ගල්තලාව විශාල ප්‍රදේශයකට ව්‍යාප්ත ව පැවති අතර ඒ මත පොකුණක්ද පිහිටා තිබුණි.

iv. පුරාවිද්‍යා ස්මාරක අවශේෂ බහුලව පවතින මෙම ස්ථානයේ මායිම් කණු යෙදීම සඳහා මායිම් කණු ගෙනවිත් දමා තිබුණද ඒවා සිටුවීමට පියවර ගෙන නොතිබුණි.

**(ඉ) මොක්කරකල පුරාවිද්‍යා ස්ථානය**

මඩකලපුව දිස්ත්‍රික්කයේ කිරාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බහනේරි ග්‍රාම නිලධාරී වසමේ පිහිටා ඇති මෙම පුරාවිද්‍යා ස්ථානයේ 2019 සැප්තැම්බර් 22 දින සිදුකළ භෞතික පරීක්ෂාවේදී පහත තත්ත්වයන් නිරීක්ෂණය විය.

i. මෙම පුරාවිද්‍යා භූමිය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් රක්ෂිතයකටද මායිම්ව කුඩා ප්‍රමාණයේ වැවක් හා කුඹුරකට යාබදව පිහිටා ඇති ලඳු කැලෑවලින් යුක්ත ස්ථානයක් වන අතර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් හඳුනා ගැනීමේ ගවේෂණයක් පමණක් සිදුකර තිබුණි.

ii. පුරාවිද්‍යා මායිම් යෙදීම සඳහා මායිම් කණු රැගෙනවිත් තිබුණද මායිම් කණු සිටුවීමක් සිදුකර නොතිබුණි. මෙම ස්ථානයේ මැණුම් කටයුතු සිදුකර සැලැස්මක් සකස් කර නොතිබුණු අතර පුරාවිද්‍යා ස්ථානයක් වශයෙන් ගැසට් කිරීමක්ද කර නොතිබුණි.

iii. මෙම භූමිය තුළ පැවති චෛත්‍යය හාරා විනාශ කිරීමට ලක්කර තිබුණි. එහි අඩි පහළවකටත් වඩා විශාලත්වයකින් යුත් වට ප්‍රමාණයකින් හා අඩි තිහකටත් වැඩි ගැඹුරට හාරණු ලැබූ වලක් දක්නට ලැබුණු අතර නටඹුන් වූ චෛත්‍යය කැලෑවෙන් වැසී ගොස් විශාල ගසක් ඒමත වැවී තිබුණි.

iv. මෙම ස්ථානයේ පැවති ගොඩනැගිල්ලක් විනාශ වීමකට ලක්ව ඇති බව තහවුරු කළ හැකි සාක්ෂි හා පොළව මතුපිටට අඩි 02, අඩි 1 ½ හා අඩි 01 ප්‍රමාණ වලින් යුතු ගල්කණුවල කොටස් මෙම භූමිය තුළ පැවතුණි. ඊට අමතරව පාදන් ගල් වල කොටස්ද විසිරී පැවතුණි.

v. මායිම් හඳුනාගෙන නොමැති මෙම භූමියෙහි තාවකාලික ඉදිකිරීමක් කර බ්ලොක්ගල් (සිමෙන්තිගල්) සකස්කරන ස්ථානයක් ආරම්භකර තිබුණු අතර විගණන පරීක්ෂාව සිදුකළ අවස්ථාව කිසිවකු එහි රැඳී නොසිටි බව තහවුරු විය.

**(ඊ) කායන්කේනී**

මඩකලපුව දිස්ත්‍රික්කයේ වාකරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටා ඇති මෙම පුරාවිද්‍යා ස්ථානය 2019 සැප්තැම්බර් 22 දින සිදුකරනු ලැබූ භෞතික පරීක්ෂාවේ දී පහත තත්ත්වයන් නිරීක්ෂණය විය.

i. මධ්‍යම සංස්කෘතික අරමුදලේ කාර්ය මණ්ඩලයේ සහභාගීත්වය යටතේ මෙම ස්ථානයේ පැරණි ගල්කණු සහිත ගොඩනැගිල්ලක් සංරක්ෂණය කරමින් පැවති අතර, අදාළ සංරක්ෂණ කටයුතු සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහභාගීත්වයක් නොමැතිව එම කටයුතු සිදුකරමින් පැවතුණි.

ii. මෙම සංරක්ෂණ කටයුත්ත සඳහා පැරණි ක්‍රමයට සැකසූ ගඩොල් භාවිතා කර තිබුණු අතර ඒවායේ පැවතිය යුතු ප්‍රමිතිය හා පවතින ප්‍රමිතිය ඇගයීම් කිරීමකින් තොරව භාවිතා කර තිබුණි. විගණන පරීක්ෂාව සිදුකරන අවස්ථාව වන විටත් එම ගඩොල් යොදා බැමි බැඳීම සිදුකරමින් පැවතුණි.

iii. එම සංරක්ෂණ කටයුත්තට අදාළ සැලසුම් හා ඇස්තමේන්තු කිසිවක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ සිදුකරන බවට විගණනය සඳහා ඉදිරිපත් කළ තොරතුරු අනුව තහවුරු නොවුණි.

## 3.7 ප්‍රශස්ත කාර්ය මණ්ඩලයක අවශ්‍යතාවය

ඉහත සඳහන් නිරීක්ෂණයන් යටතේ දක්වා ඇති පරිදි පුරාවිද්‍යා උරුමයන් කළමනාකරණය සම්බන්ධයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති වගකීම් හා කාර්යභාරයන් නිසි පරිදි ඉටු වීම පිණිස ඒ සඳහා ප්‍රමාණවත් ඵලදායී කාර්යක්ෂම මානව සම්පතක දායකත්වය අනිවාර්යය වන නමුත් මෙම නිරීක්ෂණවල සඳහන් වන ආකාරයට විශේෂයෙන් ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර ප්‍රදේශ වල පුරාවිද්‍යා උරුමයන් වලට එල්ල වී ඇති තර්ජනය හමුවේ එම තත්ත්වය පාලනය කිරීම පිණිස ප්‍රමාණවත් මානව සම්පතක් යොදවා නොතිබීම මෙහිදී කැපී පෙනේ.

පුරාවිද්‍යා ස්ථානවලට  දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව මත පොළොන්නරුව ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය අනුමත කාර්ය මණ්ඩලයක් බෙදා වෙන්කර දී තිබුණු අතර එම අනුමත කාර්ය මණ්ඩලයේ බොහෝ පුරප්පාඩු ප්‍රමාණයක් 2019 ජුනි 30 දිනට පැවතුණි. මේ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| තනතුරු නාමය | අනුමත සංඛ්‍යාව | 2019 ජුනි 30 දිනට | | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | තත්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | |
| ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂ | 01 | - | 01 | - |
| ප්‍රාදේශීය නඩත්තු කළමනාකරු | - | 01 | - | 01 |
| ගවේෂණ නිලධාරී | 01 | - | 01 | - |
| වැඩබිම් කළමනාකරු | 01 | - | 01 | - |
| පුරාවිද්‍යා පර්යේෂණ නිලධාරී | 07 | 01 | 06 | - |
| සංවර්ධන නිලධාරී | 14 | 03 | 01 | - |
| කාර්මික නිලධාරී (සංරක්ෂණ සහකාර) | 02 | 01 | 01 | - |
| සැලසුම් ශිල්පී | 01 | - | 01 | - |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 03 | 02 | 01 | - |
| ගවේෂණ සහකාර | 01 | - | 01 | - |
| කාර්මික සහකාර | 04 | - | 04 | - |
| කැණීම් සහකාර | 01 | - | 01 | - |
| කැණීම් කෞතුකාගාර සහකාර | 02 | - | 02 | - |
| රසායනික සංරක්ෂණ සහකාර | 01 | | - | - |
| රියදුරු | 01 | 01 | - | - |
| කාර්මික ශිල්පී (ජලනල) | 01 | - | 01 | - |
| කාර්මික ශිල්පී (විදුලි) | - | 02 | | 02 |
| කැණීම් හා කෞතුකාගාර ශිල්පී | 06 | 03 | - | - |
| පෙදෙරේරු | 15 | 08 | 07 | - |
| වඩු කාර්මික | 06 | 01 | 05 | - |
| රැකවල්කරු | 04 | - | 04 | - |
| මුරකරු | 160 | 10 | 150 | - |
| පුරාවිද්‍යා සහායක | 160 | 36 | 124 | - |
| එකතුව | 392 | 68 | 317 | 63 |

මේ සම්බන්ධයෙන් වූ නිරීක්ෂණයන් පහත දැක්වේ.

(අ) පුරාවිද්‍යාත්මක උරුමය කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් වූ කාර්ය මණ්ඩල වල පුරප්පාඩු වැඩි වශයෙන් පැවති බව හා දීර්ඝ කාලයක සිට පුරප්පාඩු වූ එම තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දීර්ඝ කාලයක් තිස්සේ පුරප්පාඩු පැවතීම හේතුවෙන් පුරාවිද්‍යාත්මක උරුමය කළමනාකරණ කටයුතු කාර්යක්ෂමව ක්‍රියාත්මක තිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) පුරාවිද්‍යා සහායක හා මුරකරු අනුමත තනතුරු 320 න් තනතුරු 274 ක පැවති පුරප්පාඩු සඳහා අවස්ථා 03 කදී මධ්‍යම සංස්කෘතික අරමුදලින් කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 208 දෙනෙකු බඳවා ගෙන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පොළොන්නරුව ප්‍රාදේශිය කාර්යාලයේ සේවයට අනුයුක්ත කර තිබුණි.

(ඈ) අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන වලින් බැහැරව ඉහත සේවකයන් බඳවා ගැනීමට කටයුතු කිරීම විධිමත් නොවන බව නිරීක්ෂණය කරනු ලැබේ.

## 4. නිර්දේශ

**4.1** පුරාවිද්‍යා උරුමයන් මනා ලෙස කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය වන සංශෝධනයන් ඇතුලත් කරමින් 1940 අංක 09 දරන පුරාවස්තු ආඥාපනත හා ජාතික පුරාවිද්‍යා ප්‍රතිපත්තිය සංශෝධනය කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

**4.2** 2011 ජනවාරි 18 දිනැති හා අංක 11/0169/555/004 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව නියමිත පරිදි පුරාවිද්‍යා උරුම කළමනාකරණ භාර අරමුදල පිහිටුවා මධ්‍යම සංස්කෘතික අරමුදලින් ලැබිය යුතු සියයට 25 ක මුදල ලබා ගැනීම හා එය නිවැරදිව පුරාවිද්‍යා උරුමයන් කළමනාකරණ කටයුතු සඳහා පමණක් උපයෝගී කර ගැනීම.

**4.3** පුරාවිද්‍යාත්මක සාධක පවතින ස්ථාන හා ප්‍රදේශ ගවේෂණය කිරීම මගින් හඳුනාගෙන රක්ෂිත කිරීම පුරාවස්තු කළමනාරකණයේ ප්‍රධානතම හා මූලික සාධකයක් හෙයින් අඛණ්ඩව හා ක්‍රමවත් සැලැස්මක් අනුව ගවේෂණ කටයුතු ක්‍රියාත්මක කිරීමට ප්‍රමුඛ ලෙස පියවර ගැනීම. එහිදී මූලික ගවේෂණයෙන් අනතුරුව ශාස්ත්‍රීය ගවේෂණයන් සිදුකර අවශ්‍ය මායිම් යෙදීම හා හඳුනාගන්නා ලද පුරාවිද්‍යාත්මක උරුමයන් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ කැණීම් කර සංරක්ෂණ කටයුතු සිදුකිරීමට අවශ්‍ය පියවර ගැනීම.

**4.4** හඳුනාගත් පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරක, පැරණි ස්මාරක, පුරාවිද්‍යා රක්ෂිත රජයේ ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීමට අවශ්‍ය කඩිනම් පියවර ගැනීම.

**4.5** පුරාවිද්‍යාත්මක සම්පත් කළමනාකරණය සහ පර්යේෂණ සඳහා ඊට ප්‍රවීනතාවයක් ඇති පුද්ගලයන් යොදවා ගැනීම මෙන්ම දෙපාර්තමේන්තුවේ සේවක පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය කඩිනම් පියවර ගැනීම.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති
2020 අගෝස්තු 18 දින

ඇමුණුම 01

**මායිම් කණු යෙදීමට හඳුනාගෙන තිබුණු පුරාවිද්‍යා ස්ථාන**

1. ලුණු බොක්ක නාගිරි ආරණ්‍ය සේනාසනය
2. වහව චෛත්‍ය ගොඩැල්ල
3. හෝලිකේ රජමහා විහාරය
4. පදියදොර පුරාවිද්‍යා ස්ථානය
5. සේරංකඩ පුරාණ විහාරය
6. නාවින්න පුරාණ විහාරය
7. වෙහෙරගොඩ නටබුන් ස්ථානය
8. මාණික්කමඩුව පුරාවිද්‍යා ස්ථානය
9. සාගම දාගැබ
10. උදයගිරි රජමහා විහාරය
11. බණ්ඩාරදූව වෙහෙරගල නටබුන්
12. අභයපුර පුරාවිද්‍යා ස්ථානය
13. බැරවානිවෙල නටබුන් ස්ථානය
14. කුඩාකල්ලි පුරාවිද්‍යා ස්ථානය
15. මණිනාසපබ්බත බෝධිසර විහාරය
16. කුඩුම්බිගල පුරාවිද්‍යා ස්ථානය
17. මහුල් මහා විහාර පුරාවිද්‍යා ස්ථානය
18. තරුලෙන්ගල පුරාවිද්‍යා ස්ථානය
19. ඔත්ගමුව පුරාවිද්‍යා ස්ථානය
20. බක්මීදෙණිය පුරාණ විහාරය
21. හුංගලමාලගම ජයසුමනාරාමය
22. සේරුපිටිය චන්දිමාරාමය
23. සමනල තැන්න ආරණ්‍ය සේනාසනය
24. සමනල තැන්න පුරාවිද්‍යා ස්ථානය
25. මුවපැටිගේ වෙල පන්සල්වත්ත
26. හෙනානිගල විහාරස්ථානය
27. පාදාගොඩ රජමහා විහාරය
28. රතුපස්උහන පුරාණ විහාරය
29. වෙහෙරගල ආරණ්‍ය සේනාසනය
30. අතුරුගිරිය පුරාණ විහාරය
31. ඇල්ලේ ගොඩ පුරාවිද්‍යා ස්ථානය
32. අකුල්ඔබ පුරාවිද්‍යා ස්ථානය
33. කුඩාගල පුරාවිද්‍යා ස්ථානය
34. පන්සල් යාය පුරාවිද්‍යා ස්ථානය
35. ඌරණිය සුද්දගේ වත්ත
36. හිඟුරාණ උත්තර රජමහා විහාරය
37. ලාහුගල මුඩගල කන්ද
38. ගිරිකුම්බිල විහාරය
39. පදියතලාව මෙවුළුගල ආරණ්‍ය සේනාසනය
40. ඒත්තම බැලුම් නිවාස

**හඳුනාගෙන තිබුණු නමුත් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු නොකළ පුරාවිද්‍යාත්මක ස්ථාන ස්මාරක හා රක්ෂිත**

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව | ගවේෂණය කළ ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව | වාර්තාගත කළ පුරාවිද්‍යා ස්ථාන සංඛ්‍යාව | ප්‍රකාශයට පත් කිරීමට යෝජිත | |
|---|---|---|---|---|---|
| | | | | රක්ෂිත ස්ථාන සංඛ්‍යාව | ස්මාරක ස්ථාන සංඛ්‍යාව |
| අඩ්ඩාලච්චෙන | 32 | 32 | 22 | 02 | 06 |
| අක්කරපත්තුව | 27 | 27 | 12 | - | - |
| ආලයාඩිවෙම්බු | 23 | 23 | 09 | 05 | 09 |
| පොතුවිල් | 27 | 27 | 12 | 02 | 09 |
| තිරුක්කොවිල් | 22 | 22 | 44 | 24 | 20 |
| එරගම | 12 | 12 | 17 | 01 | 17 |
| උහන | 53 | 15 | 21 | 04 | 10 |
| පදියතලාව | 20 | 20 | 37 | 11 | 26 |
| සමන්තුරේ | 51 | 14 | 18 | 03 | 13 |
| දමන | 33 | 33 | 44 | 01 | 42 |
| කල්මුණෙෙ | 58 | 58 | 05 | 00 | 02 |
| අම්පාර | 22 | 11 | 10 | 01 | 09 |
| ලාහුගල | 12 | 06 | 06 | 00 | 06 |
| කාර්තිවු | 17 | 17 | 02 | 00 | 01 |
| | 503 | 317 | 259 | 54 | 170 |

## ශිලාලේඛන සහිත පුරාවිද්‍යා ස්ථාන ලේඛනය

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | | ග්‍රාම නිලධාරී වසම | ගම | ශිලා ලේඛන සහිත පුරාවිද්‍යා ස්ථානය පිළිබඳ විස්තර |
|---|---|---|---|---|
| 1. අඩ්ඩාලච්චෙන | 1. | 17 අඩ්ඩාලච්චෙන | ආලංකුලම් | කොච්චිකාවේනෙයි- වෙල්ලුපාට්ටුමලෙයි ගල්තලාව |
| | 2. | දීඝවාපි 02 | අංක 234 | 234 ග්‍රාමයේ ඇති ගල්තලා |
| | 3. | දීඝවාපි 01 | දීඝවාපි ජනපදය | දීඝවාපි සිංහල විදුහල අසල - කටාරම් ලෙන් සංකීර්ණය |
| | 4. | දීඝවාපි 01 | දීඝවාපි බෞද්ධ ජනපදය | වෙහෙරගල පුරාවිද්‍යා ස්ථානය |
| | 5. | පාලමුනේ | මොල්ලිකුලම් | මුහන්දිරම් ගල |
| | 6. | ඔලුවිල් | පල්ලේකාඩු | පටාර්කුලම් ගල් පර්වතය |
| 2. එරගම | 7. | අංක 5-2-34-050-04 ඉරක්කාමම් 2 | සපානගර් | චෛත්‍ය ගොඩැල්ල |
| | 8. | අංක 5 – 2- 34- 050 – 01 ඉරක්කමම් 05 | නියුගුණ | නියුගුණ රජමහා විහාරය |
| | 9. | මාණික්කමඩු | කුඩුවිල් | මාණික්කමඩු කන්ද |
| | 10. | අංකSP–84C–005 ඉරක්කාමම් 7 | පොන්නන්වෙලි | කොටිගල |
| 3. දමන | 11. | අංක W/26/B පල්ලම්ඔය | පල්ලම්ඔය | පන්නක්ගොඩ පුරාණ විහාරය |
| | 12. | අංක W/27/E කීනවත්ත | ග්‍රාම 09 කීනවත්ත | 35 A ඉඩම - කටාරම් ලෙන් |
| | 13. | අංක W/27/A පැරණිගම | පැරණිගම | ඉලුක්පිටිය රජමහා විහාරය |
| | 14. | අංක W/25 තොට්ටම | පැරණිගම | ආරියකඩ රජමහා විහාරය - වෙහෙර පුදාමය ගල් පර්වතය |
| | 15. | අංකW/25/A පන්නල්ගම | පන්නල්ගම | රුවන්මළුව ආරණ්‍ය සේනාසනය |
| | 16. | අංක W/27/B මුවන්ගල | මුවන්ගල | මුවන්ගල රජමහා විහාරය |
| | 17. | අංක W/27/E/ කරලෑව | හිඟුරාණ | උත්තර ජයමහා විහාරය |
| | 18. | අංකW/25/C වෙහෙරගල | 19/A ජනපදය | වෙහෙරගල පුරාවිද්‍යාත්මක නටබුන් පිහිටි ගල් පර්වතය |
| | 19. | අංකW/26/Cකෙත්සිරිගම | කෙත්සිරිගම | කෙත්සිරිගම කටාරම් සහිත ලෙන |
| | 20. | අංක W/24/A/ මඩවල ලන්ද | මඩවල ලන්ද | මට්ටයාගල රක්ෂිතය - කටාරම් ලෙන් |
| | 21. | අංක W/24/A/ මඩවල ලන්ද | මඩවල ලන්ද | මලයාඩි වැවට ඉහළින් (මලයාඩි කන්ද) |

| | | | | |
|---|---|---|---|---|
| | 22. | අංකW/25/A පන්නල්ගම | පන්නල්ගම | නිදන්ගල - දේවාලගම |
| | 23. | ගල් කන්ද | ගල්කන්ද | ගල් කන්ද කටාරම් ලෙන |
| 4. පොතුවිල් | 24. | P 22 සංගමන්කන්ද | සංගමන්කන්ද | සංගමන් කන්ද රක්ෂිතය |
| | 25. | හිජ්රානගර් | දාරම්පනාව | දාරම්පනාව |
| 5. පදියතලාව | 26. | 139 / E කෝමාණ | මාරාව | ලුණුබොක්ක නාගිරි ආරන්‍ය සේනාසනය |
| | 27. | 140/B තලාපිටඔය දකුණ | තලාපිටිඔය දකුණ | වෙහෙරගොඩ නටබුන් |
| | 28. | 140/B තලාපිටඔය දකුණ | තලාපිටඔය දකුණ | පිහිටි ගලේ අක්ෂර |
| | 29. | 141/ C හාගම්වෙල | හාගම්වෙල | කටාරම් සහිත පැරණි ගල්ලෙන් සහ පැරණි පියගැටපෙළ සහිත කෙමිය |
| 6. ආලයාඩිවෙම්බු | 30. | පන්නකාඩු | පන්නකාඩු | මොට්ටයාගල පර්වතය |
| | 31. | පන්නකාඩු AV 13 | පන්නකාඩු | මොට්ටයාගල ගල්තලාව (අංක 22) |
| 7. ලාහුගල | 32. | PP /07 පන්සල්ගොඩ | පන්සල්ගොඩ | මහුල් මහා විහාරය |
| | 33. | PP/12 හුලංනුගේ බටහිර | හුලංනුගේ | බත්ගමුව පුරාවිද්‍යා නටබුන් සහිත භූමිය |
| | 34. | හුලංනුගේ | හුලංනුගේ | තරුලෙන්ගල ආරණ්‍යය සේනාසනය - හබුතගල විහාරය |
| | 35. | PP /10 පැරණි ලාහුගල | පැරණි ලාහුගල | නීලගිරි පුරාවිද්‍යා රක්ෂිතය |
| | 36. | පන්සල්ගොඩ | පරණ ගොවිපල | අත්ථානි කණුව |
| | 37. | පන්සල්ගොඩ | බෝගහලන්ද | ගල්කටු ලක්ෂණ සහිත ගල |
| | 38. | පානම දකුණ | මංගලගම | වැවේ වෙහෙර |
| | 39. | PP /06 පානම ශාස්ත්‍රවෙල | ශාස්ත්‍රවෙල | මණිනාග පබ්බත බෝධිගිරි පුරාණ රජමහා විහාර |
| | 40. | PP /02 පානම දකුණ | කුණුකොළ | ගණදෙවි කෝවිල් ගල්කුළ |
| | 41. | PP /02 පානම දකුණ | පානම | කුඩුම්බිගල |
| 8. තිරුක්කෝවිල් | 42. | සාගමම් 11 /C | තෝනිකල් කණ්ඩම් | තොනිකල් කණ්ඩම් රක්ෂිතය |
| | 43. | සාගමම් 11 /C | සාගමම් | සාගම වැවේ සොරොව්ව |
| | 44. | කන්ච්රන්කුඩා | රූපස්කුලම් | ලෙන් ලිපි සහිත කටාරම් කෙටු |
| | 45. | කණ්චිකුඩිආරු | රූපස්කුලම් | රූපස්කුලම් වැව් රක්ෂිතයේ ඊශාන දිශාව |
| | 46. | කණ්චිකුඩිආරු | කණ්චිකුඩිආරු | යුධ හමුදා කඳවුරට ඉදිරිපසින් නටබුන් සහිත ස්ථානය |
| | 47. | තන්ගවේලාව්පුරම් | තන්ගවේලාව්පුරම් | තන්ගවේලාව්පුරම් රක්ෂිතය |

**සේරුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හඳුනාගත් පුරාවිද්‍යා ස්ථාන, ස්මාරක හා චංචල පුරාවස්තු**

| | ග්‍රාම නිලධාරී වසම / ගම | පුරාවිද්‍යා ස්ථාන, පුරාවිද්‍යා ස්මාරක හා පුරාවස්තු පිළිබඳ විස්තර |
|---|---|---|
| 1. | සිරිමංගලපුර | ශ්‍රී බෝධිරාජාරාම විහාරය - විහාර භූමිය තුළ පවතින පැරණි ඉදිකිරීම් |
| 2. | | දෙමලයාපිටිය - සෝමාවතී වන රක්ෂිතය - දාගැබ සහිත ගොඩනැගිලි නටබුන් |
| 3. | | කුම්බනාච්චි - 1 සේරුවිල වන රක්ෂිතය ගල් පර්වතය - පැරණි ඉදිකිරීම් පියගැට පෙළක් ස්වභාවික පොකුණු |
| 4. | | කුම්බනාච්චි 2 - සේරුවිල වන රක්ෂිතය - චෛත්‍ය ගොඩැල්ලක් ගොඩනැගිලි නටබුන් |
| 5. | | කුම්බනාච්චි 3 - සෝමාවතීය වන රක්ෂිත - චෛත්‍ය ගොඩැල්ල ගොඩනැගිල නටබුන් |
| 6. | | කුම්බනාච්චි 4 - සෝමාවතිය වන රක්ෂිතය - දාගැබ් ගොඩැල්ල කටාරම් සහිත ලෙන් , බ්‍රාහ්මීය අක්ෂර සහිත ශිලා ලේඛන, ගඩොල් උළු සහ මැටි බඳුන් කොටස් |
| 7. | | සෝමාවතී වන රක්ෂිතය - ගෙඩි ගෙය සම්ප්‍රදායට අයත් ගඩොලින් ඉදි කළ ගොඩනැගිල්ල |
| 8. | | එස්ටීවන් කන්ද - සෝමාවතී වන රක්ෂිතය - චෛත්‍ය ගොඩැල්ල පැරණි ගොඩනැගිලි නටබුන් |
| 9. | | නිධන් කනද - සෝමාවතී වන රක්ෂිතය - ගොඩනැගිලි නටබුන් |
| 10. | | සුනේත්‍රා වැව අසල සෝමාවතී වන රක්ෂිතය - මැටි බඳුන්, හරණී මැටි නල කොටස් ජනාවාස කරන පුරා සාධක |
| 11. | | ගල්කුලම පර්වත ලිපි සහිත ස්ථානය - සෝමාවතිය වන රක්ෂිතය - පර්වත ලිපිය පැරණි ගඩොලින් කළ ඉදිකිරීම. |
| 12. | | සින්නවිල්ලුව පුරාවිද්‍යාත්මක සාධක සහිත ගල්තලාව - පැරණි ජනාවාස හා ගොඩනැගිලි සාධක, කුඩුම්බි සහ කේතුකාවට |
| 13. | | කෝම්පිට්ටුගල සෝමාවතියේ ජාතික උද්‍යානය - ලෙන් ලිපි සහ කටාරම් සහිත ගල්ලෙන් සංකීර්ණය |
| 14. | | එරණියමලේ සෝමාවතී වන රක්ෂිතය - බෞද්ධ සිද්ධාස්ථානයක නටබුන් |
| 15. | | දාගැබ සහිත නටබුන් සංකීර්ණය - මහවැලි ගඟ කළුපාලම අසල කැලෑව - අනුරාධපුර මුල් යුගයේ ඉදිකරන ලද බෞද්ධ විහාරස්ථානයක නටබුන් |
| 16. | | මහවැලි ගඟ කළුපාලම කැලෑව - අනුරාධපුර මුල් යුගයේ ඉදිකිරීම් ලක්ෂණ සහිත ගොඩනැගිල නටබුන් |
| 17. | | නිධන්කන්ද (මහවැලි ගඟ ඉවුර ) අනුරාධපුර මුල් යුගයේ ඉදිකිරීම් ලක්ෂණ සහිත ගොඩනැගිලි |

| | | |
|---|---|---|
| 18. | කාවන්තිස්සපුර | කාවන්තිස්සපුර කුඹුරුයාය අසළ කටාරම් සහිත ලෙන - පූර්ව බ්‍රාහ්මී අක්ෂර සහිත ලිපි |
| 19. | | ආරාමකන්ද - කඳු මුදුනත පිහිටි ගොඩනැගිලි නටබුන්වලින්ද සනාථ වේ. |
| 20. | | කටාරම් සහිත ලෙන - පූර්ව බ්‍රාහ්මී අක්ෂර සහිත ලෙන් ලිපියක් සහිත කටාරම් සහිත ලෙන |
| 21. | | කටාරම් ලෙන් - සුමේධංකර වන සෙනසුන - කටාරම් සහ ලෙන් ලිපි ගල්ලෙන් |
| 22. | | කාවන්තිස්සපුර යබොර නිස්සාරණ ස්ථානය - යකඩ කර්මාන්තය |
| 23. | | කාවන්තිස්සපුර යබොර නිස්සාරණ ස්ථානය - යකඩ කර්මාන්තය |
| 24. | | තඹ නිධිය - සේරුවිල - තඹ භාවිතා කර අනුරාධපුර යුගයේ බුද්ධ ප්‍රතිමා |
| 25. | | මයිලවැව - පැරණි වැව් බැම්ම |
| 26. | මහින්දපුර | මෙගලිතික සුසාන සහිත ස්ථානය - සුසානයන්ට අයිති ගල් පතුරු හා පැරණි ගල් බිඳුම් සාධක |
| 27. | | මහින්දපුර - පැරණි ගල් බිඳුම් සාධක සහිත ස්ථාන ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා පාවිච්චි කළ ගල් ආයුධ, ශිලා ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා පැරණි ගල් බිඳුම් සාධක |
| 28. | | ගැමුණුපුර - තපස්සර පුරාණ රජමහා විහාරය - කටාරම් කෙටු ගල් ලෙන් පැරණි ගඩොල් නිර්මාණයන් පර්වතය මත ස්ථූප ගොඩැලි ඇඹරුම් ස්ථාන, ස්වාභාවික පොකුණු |
| 29. | සේරුනුවර | සේරුවිල මංගල මහා විහාරය, මංගල මහා ස්ථූපය,ලෙන් ලිපි, පැරණි ගොඩනැගිලි නටබුන් ,පාදම්ගල්,වැසිකිළි කැසිකිළි පාදම් ගල් , ගල් බේසම්, පියගැට, පර්වත ලිපි,ශිලා පුවරු |
| 30. | | මංගල වැව මධ්‍යයෙහි පිහිටි ගල්තලාව - ප්‍රාග් ඓතිහාසික ගල් ආයුධ , පැරණි ගඩොල් ඉදිකිරීම් නෂ්ටාවශේෂ ආශ්‍රිත තඹ නිෂ්පාදිත ස්ථාන |
| 31. | | කටාරම් කෙටු ලෙන් - සේරුවිල මංගල මහා සෑයට ආසන්න - කටාරම් කෙටු ලෙන් ගල් ආසන |
| 32. | | ශිලා කුළුණු සහිත නටබුන් සහිත ස්ථාන - ශිලා කුළුණු, ශිලා පුවරු ශිලා ලේඛන |
| 33. | | ශ්‍රී පූර්වාරාම විහාරය -ගොඩනැගිලි අවශේෂ මල් ආසන පාදම් ගල්,පාදොවනයන්, ශිලා කුළුණු |
| 34. | | මෙගලිතික සුසාන ස්ථානය -තක්ෂාල්වත්ත - සුසාන ශිලා පුවරු |
| 35. | නාවක්කර්නිකාඩු | සෙල්වනාගර්- නාග දේව කෝවිල් භූමිය - ගල් පුවරු, විල්ගම්වෙහෙර දාගැබ, පැරණි පිවිසුම හා ප්‍රාකාර |
| 36. | තාංගනගර් | දාගැබ් ගොඩැල්ල ගොඩනැගිලි නටබුන් , පැරණි ගොඩනැගිලි හා පාදම් ගල්, පාදොවන ගල්, සිරිපතුල් ගල්, ශිලා පුවරු, |
| 37. | සුමේධංකර | සුමේධංකර පුර, 2015/ ඩී, ශිලාලේඛන සහිත ගල් ලෙන්, බ්‍රාහ්මීය අක්ෂර සහිත ලෙන් ලිපි, ආරාම කන්ද ගල් පර්වතය ආශ්‍රිතව පැරණි නටබුන් |
| 38. | | සුමේධංකර නව වැව ඉස්මත්ත - ගල් කොරි ලක්ෂණ , ගඩොල් මැටි බඳුන් අවශේෂ |
| 39. | | 56/ ආර්, නටබුන් ස්ථානය - මැටි බඳුන් අවශේෂ , යබොර කොටස් , ශිලා කුළුණු කොටස්, ගඩොල් ඇතුරුම් හා විසිරුම් ස්ථාන |
| 40. | | පුලියන්කුලම වැව - පැරණි වැව හා පැරණි ජනාවාස |

| | | |
|---|---|---|
| 41. | | ප්‍රාග් ඓතිහාසික සාධක සහිත භූමිය - ගල් කණු කීපයක්,මැටි බඳුන් කැබලි, මැටි කෙමියක්, යබොර කොටස් |
| 42. | 217/ ඊ ලිංගපුරම් | පර්වත ලිපිය සහ දාගැබ සහිත පුරාවිද්‍යා ස්ථානය- චෛත්‍ය ගොඩැල්ල පැරණි ඉදි කිරීම් අවශේෂ, බොරදම් ගඩොල්, ශිලා පුවරු,පාදම් ගල්,පර්වත ලිපි |
| 43. | | පැරණි වැව I - පෞරාණික වැව |
| 44. | | පැරණි වැව II – පෞරාණික වැව |
| 45. | 217/බී නීලපොල | නීල රජමහා විහාරය - පැරණි චෛත්‍ය ශිලා කුළුණු පාදම් ගල්, ශිලා පුවරු,බෞද්ධ ප්‍රතිමා, සිරිපතුල් ගල්, යන්ත්‍ර ගල් |
| 46. | | ගොඩනැගිලි නටබුන් - වරාලන්ද - උපරිභාගය විනාශයට පත් වූ ශිලා කුළුණු සහිත ගොඩැනැගිලි |
| 47. | | දාගැබ් සහිත නටබුන් ස්ථානය - නිලපොල - චෛත්‍ය ගොඩැල්ල ශිලා කුළුණු යන්ත්‍ර ගල ගඩොල් හා මැටි බඳුන් අවශේෂ |
| 48. | | පුරාවිද්‍යාත්මක ගොඩනැගිලි ,ශිලා කුළුණු |
| 49. | | පැරණි දාගැබ සහිත නටබුන් ස්ථානය - ට්‍රැක් 14 කුඹුරු ඉඩම - පැරණි ඉදිකිරීම්, චෛත්‍ය ගොඩැලි, මැටි බඳුන් අවශේෂ, පැරණි ටැම්පිට ගොඩනැගිලි නටබුන් |
| 50. | අරියමන්කර්නි | ගොඩනැගිලි නටබුන් ස්ථානය - අරියමන්කර්නි කැළය<br>ස්තූප ගොඩැලි පැරණි ගඩොල් බැමි ශිලා පුවරු |
| 51. | | අරියමන්කර්නි කැළෑව - බෝධි වෘක්ෂය අසල වූ කොරවක්ගල් ඇඹරුම් ගල් පුවරු<br>චෛත්‍ය ගොඩැලි ශිලා පුවරු, කණු පාදම් ගල් |
| 52. | | පන්සල් ගොඩැල්ල - අරියමන්කර්නි වන රක්ෂිතය<br>ශිලා කුළුණු, පැරණි ගොඩනැගිලි නටබුන්,ටැම්පිට ගොඩනැගිලි නටබුන් |
| 53. | | පැරණි වැව - අරියමන්කර්නි කැළෑව<br>ශිලා පුවරු, ගඩොල් ඇතුරුම්, |
| 54. | 217 / සී සමගිපුර | පුරාවිද්‍යා ස්ථානය - කෝවිල්තිරිමාඩු<br>පැරණි ගොඩනැගිලි අවශේෂ , ශිලා කුළුණු , පාදම් ගල්, මල් ආසන, සිරි පතුල් ගල්, සඳකඩ පහන,කොරවක්ගල් |
| 55. | | ගොඩනැගිලි නටබුන් ස්ථානය - සමගිපුර<br>පැරණි ගොඩනැගිල නටබුන්, ශිලා කුළුණු |
| 56. | | මණ්ඩලගිරි රජමහා විහාරය - චෛත්‍ය ශිලා කුළුණු සඳකඩ පහන්, පාදම් ගල්, ප්‍රතිමා පාදම් ගල් |
| 57. | 217/ඒ -සෝමපුර | පශ්චිමාරාම විහාරය - ප්‍රතිමා ගෘහය, ශිලා කුළුණු සහිත ගොඩනැගිලි, යන්ත්‍ර ගල්, පාදම් ගල්, ශිලා කුළුණු,කොරවක් ගල්, හිටි බුද්ධ ප්‍රතිමා, පද්මාසන පාදම,බෝධිසත්ව ප්‍රතිමා,ගල් බේසම්, ශිලා පුවරු |
| 58. | 217 - දෙහිවත්ත | ශ්‍රී වර්ධන රජමහා විහාරය - පැරණි චෛත්‍ය, ශිලා පුවරු, බෝධි සත්ව රූප, බාහිරව රූප, සත්ත්ව රූප සහිත මැටි පුවරු, ශිලා පුවර, ගඩොල් ඇතුරුම් |

ඇමුණුම 05

**හඳුනාගත් ස්ථාන විනාශයට පත්වීම**

**(අ) බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**

**1. හඳුනාගත් පුරාවිද්‍යා ස්ථාන -35**

i. නාගල රජමහා විහාරය
ii. පියංගල රජමහා විහාරය
iii. බොකාගොන්න පුරාණ විහාරය
iv. නීලගිරි පුරාණ විහාරය (කටාරම් සහිත ලෙන)
v. මාළිගාතැන්න පුරාණ විහාරයේ සෙල්ලිපිය
vi. ගල්ඔය අමුණ
vii. බඳුළුගම්මන පුරාණ විහාරය ( පැරණි දාගැබ හා පිළිමගෙය)
viii. කොටසර පියංගල රජමහා විහාරය (ටැම්පිට විහාරය හා ආවාසගෙය)
ix. නාගල රජමහා විහාරය (ටැම්ලිපි, ගල් කණු, කොරවක්ගල්,ආවාස ගෘහය)
x. වලව්වත්ත පැරණි ගොඩනැගිල්ල
xi. නාගල රජමහා විහාරය (පර්වත ලිපි 02 ආවාස ගෘහය
xii. කොකුන්නැව පුරාණ විහාරය (ටැම්පිට විහාරය)
xiii. යහටිපහන නටබුන්
xiv. විලැතිගොඩ රජමහා විහාරය (ප්‍රතිමාගෘහය,ආවාසගෙය)
xv. කොටසර පියංගල රජමහා විහාරය (ළිඳ, නටබුන්)
xvi. හමනව පුරාණ විහාරය(නටබුන් ගොඩනැගිල්ල, දාගැබ)
xvii. බුළුපිටියහෙළ පැරණි දාගැබ
xviii. නිල්ගල රක්ෂිතයට අයත් කහටඅත්තාහෙළ (පැරණි ස්තූපය, පිළිමගෙය, නටබුන් ගොඩනැගිලි හා කටාරම් හා සෙල්ලිපි සහිත ලෙන් 02)
xix. හත්තාපත්තා වැව අසල පර්වල ලිපිය
xx. වෙහෙරගොඩවත්ත ශ්‍රී මහා ප්‍රාකාරව පැරණි ස්තූපය, නටබුන් ගොඩනැගිල්ල
xxi. මහාවෙල කටාරම් සහිත ලෙන් 02
xxii. පොරකද ගල්ලෙන (කටාරම් සහිත ලෙන)
xxiii. පුරේකදුර පුරාවිද්‍යාත්මක ගල්ලෙන
xxiv. යකුන්ගේ හෙළ (කටාරම් සහිත ගල් ලෙන)
xxv. ගල්ගෝට්ට (කටාරම් , ලෙන් ලිපි සහිත ලෙන් සංකීර්ණය)
xxvi. කහඳගල මාළිගාතැන්න (නටබුන් ගොඩනැගිල්ල, ගරාවැටී ඇති ප්‍රාකාරය)
xxvii. කහඳගල මාලිගාතැන්න පුරාවිද්‍යාත්මක භූමිය
xxviii. කොටසර පියංගල ටැම්පිට විහාරය (පැරණි ආවාස ගෘහය)
xxix. පිටකුඹුර වෙහෙරගොඩ පුරාණ විහාරය
xxx. නෙල්ලියද්ද මල්ලව පැරණි විහාරයේ නටබුන්
xxxi. ඊතණවත්ත පත්තිනි දේවාලය
xxxii. ඊතණවත්ත ටැංගොඩ පුරාණ විහාරය
xxxiii. බිබිල මැදපිටිය ගල්පිහිල්ල
xxxiv. බිබිල යල්කුඹුර පනාවිල
xxxv. දූම්මලතැන්න විහාරය

**2. පුරාවිද්‍යා කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක නොකරන ලද හඳුනාගත් පුරාවිද්‍යා ස්ථාන - 25**

- i. නාගල රජමහා විහාරය
- ii. පියංගල රජමහා විහාරය
- iii. බොකාගොන්න පුරාණ විහාරය
- iv. නීලගිරි පුරාණ විහාරය (කටාරම් සහිත ලෙන)
- v. මාළිගාතැන්න පුරාණ විහාරයේ සෙල්ලිපිය
- vi. ගල්ඔය අමුණ
- vii. බඳුළුගම්මන පුරාණ විහාරය (පැරණි දාගැබ හා ආවාසගෙය)
- viii. කොටසර පියංගල රජමහා විහාරය (ටැම්පිට විහාරය හා ආවාසගෙය)
- ix. නාගල රජමහා විහාරය ( ටැම්ලිප, ගල්කණු, කොරවක්ගල්,ආවාසගෙය)
- x. වලව්වත්ත පැරණි ගොඩනැගිල්ල
- xi. නාගල රජමහා විහාරය (පර්වත ලිපි 02 ආවාස ගෘහය)
- xii. කොකුන්නෑව පුරාණ විහාරය (ටැම්පිට විහාරය)
- xiii. යහටිපහන නටඹුන්
- xiv. විලැතිගොඩ රජමහා විහාරය ( ප්‍රතිමාගෘහය, ආවාසගෙය)
- xv. කොටසර පියංගල රජමහා විහාරය (ළිඳ, නටඹුන්)
- xvi. හමනව පුරාණ විහාරය (නටඹුන් ගොඩනැගිල්ල, දාගැබ)
- xvii. බුළුපිටියහෙළ පැරණි දාගැබ
- xviii. නිල්ගල රක්ෂිතයට අයත් කහටඅත්තාහෙළ (පැරණි ස්තූපය, පිළිමගෙය, නටඹුන් ගොඩනැගිලි හා කටාරම් හා සෙල්ලිපි සහිත ලෙන් 02)
- xix. හත්තාපත්තා වැව අසල පර්වල ලිපිය
- xx. වෙහෙරගොඩවත්ත ශ්‍රී මහා ප්‍රාකාරය පැරණි ස්තූපය නටඹුන් ගොඩනැගිල්ල
- xxi. මහවෙල කටාරම් සහිත ලෙන් 02
- xxii. පොරකද ගල්ලෙන (කටාරම් සහිත ලෙන)
- xxiii. පුරේකඳුර පුරාවිද්‍යාත්මක ගල්ලෙන
- xxiv. යකුන්ගේ හෙළ (කටාරම් සහිත ගල් ලෙන)
- xxv. ගල්ගෝට්ට (කටාරම් ලෙන්ලිපි සහිත ලෙන් සංකීර්ණය)

**(ආ) මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨශය**

----------------------------------------

**1. හඳුනාගනෙ ඇති පුරාවිද්‍යා ස්ථාන - 13**

- i. බිංගාඩ පුරාණ විහාරය (කටාරම් සහිත ගල් ලෙන් 02 හා පර්වත ලිපිය )
- ii. රිටිගහවත්ත කදාලා විහාරය
- iii. දැලිව ථේරපුත්තාරාමය(කටාරම් ලෙන් 02, පර්වත ලිපිය හා පොකුණ )
- iv. මුල්ගිරි පුරාණ විහාරය (විහාර භූමියේ නටඹුන් හා අනෙකුත් පුරාවස්තු)
- v. කෙහෙල්ලන්ද බිංගාඩ පුරාණ රජමහා විහාරය (කටාරම් ශිලාලේඛන සහිත ලෙන් 02)
- vi. ඉහාව පුරාණ විහාරය
- vii. ඇල්පිටිය මීගහපිටිය පුරාණ විහාරය
- viii. අළුගල්ගේ වසමේ සෙල්ලිපිය
- ix. උඩුමුල්ල ග්‍රාමසේවා වසමේ කහටපිටිය වැව අසල සෙල්ලිපිය හා ගල් ආසනය
- x. අළුගල්ගේ වසමේ සෙල්ලිපිය
- xi. දැලිව පාර පිටතලාව සෙල්ලිපිය
- xii. හැන්තියාව,මකුල්ල වසම සෙල්ලිපිය
- xiii. තැරැල පිරිවෙනේ බෝමළුවේ ඇති සෙල්ලිපිය

**2. පුරාවිද්‍යා කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක**

i. බිංගොඩ පුරාණ විහාරය (කටාරම් සහිත ගල් ලෙන් 02 හා පර්වත ලිපිය)
ii. රිටිගහවත්ත කදාලා විහාරය
iii. දැලිව ථේරපුත්තාරාමය (කටාරම් ලෙන් 02, පර්වත ලිපිය හා පොකුණ)
iv. මුල්ගිරි පුරාණ විහාරය (විහාර භූමියේ නටඹුන් හා අනෙකුත් පුරාවස්තු)
v. කෙහෙල්ලන්ද බිංගාඩ පුරාණ රජමහා විහාරය ( කටාරම් ශිලා ලේඛන සහිත ලෙන් 02)
vi. ඉහාව පුරාණ විහාරය
vii. ඇල්පිටිය මීගහපිටිය පුරාණ විහාරය
viii. අළුගල්ගේ මීමින්නාගොකඩ කන්ද
ix. උඩුමුල්ල ග්‍රාමසේවා වසමේ කහට පිටිය වැව අසල සෙල් ලිපිය හා ගල් ආසනය
x. අළුගල්ලේ වසමේ සෙල් ලිපිය
xi. දැලිව පාර පිටතලාව සෙල්ලිපිය
xii. හැන්තියාව මකුල්ල වසම සෙල්ලිපිය

**(ඈ) මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**
**----------------------------------------**

**1. හඳුනාගෙන ඇති පුරාවිද්‍යා ස්ථාන - 07**

i. අහුගොඩ පුරාණ රජමහා විහාරය (කටාරම් කොටන ලද ලෙන් 03)
ii. දේවගිරි විහාරය පැරණි දාගැබ
iii. තිඹිරිය පුරාණ විහාරය (ප්‍රතිමා ගෘහය, ගල්කණු හා ගොඩනැගිල නටඹුන්)
iv. තිඹිරිය පුරාණ විහාරය (ප්‍රතිමා ගෘහය , නටඹුන්)
v. බිබිලමුල්ල විහාරය (ධර්මශාලාව සීමාව)
vi. කොටබෝව කුඩා කතරගම දේවාලය (දේවාල භූමිය,පැරණි ගොඩනැගිලි හා වෙනත් පුරාවස්තු)
vii. අයිවෙල පොතු බද්ධන රජමහා විහාරය

**2. පුරාවිද්‍යා කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක**

i. අහුගොඩ පුරාණ රජමහා විහාරය ( කටාරම් කොටන ලද ගල් ලෙන්,
ii. දේවගිරි විහාරය පැරණි දාගැබ
iii. තිඹිරිය පුරාණ විහාරය (ප්‍රතිමා ගෘහය, ගල් කණු හා ගොඩනැගිලි නටඹුන්)
iv. තිඹිරිය පුරාණ විහාරය (ප්‍රතිමා ගෘහය, නටඹුන්)
v. බිබිලමුල්ල විහාරය (ධර්මාශාලාව සීමාව)
vi. කොටබෝව කුඩා කතරගම දේවාලය (දේවාල භූමිය, පැරණි ගොඩනැගිලි හා වෙනත් පුරාවස්තු)
vii. අයිවෙල , පොතු බන්ධන රජමහා විහාරය

ඇමුණුම 06

කැණීම් බලපත්‍ර කාලය පෙර දාතම් කර නිකුත් කිරීම

| No. | Applicent Name | Year | Institute | Site | Entent | License Period | Date Licence Issued |
|---|---|---|---|---|---|---|---|
| 01 | Prof. Nimal De silva | 2009 | PGIAR | Nikawalamulla in Ruwanwella (4m*4m) | 4m*4m | 2009-12-05<br>2010-01-05 | 2009-12-08 |
| 02 | Prof. Nimal De silva | 2010 | PGIAR | Nikawalamulla in Ruwanwella (4m*4m) | 4m*4m | 2010-01-05<br>2010-03-31 | 2010-01-19 |
| 03 | Prof. Sudarshan Senevirathna | 2010 | CCF | Puwakgollewaththa Udadulwala. Haleluwa (2m*2m) | - | 2010-03-01<br>2010-11-01 | 2010-03-03 |
| 04 | Prof. Sudarshan Senevirathna | 2010 | CCF | Adayagiriya,Jetawanaya, Mahaviharaya, Polonnaruwa,Sigiriya,Kandy, Rambahaviharaya, Galle, Tissamaharamaya | - | 2010-01-01<br>2010-12-31 | 2010-05-24 |
| 05 | Prof.Raj Somadeva | 2011 | PGIAR | Haldummulla | 3m*3m | 2011-08-01<br>2011-09-15 | 2011-09-04 |
| 06 | Prof.D.P.Gamalath | 2011 | PGIAR | Makulawa and Jayasundararamaya in Anuraghapura | - | 2011-10-01<br>2011-11-30 | 2011-12-06 |
| 07 | Prof.D.P.Gamalath | 2011 | PGIAR | Telulla and Dewramvehera in Hambanthota (1m*2m) | - | 2011-10-01<br>2011-11-30 | 2011-12-06 |
| 08 | Prof. Nimal De silva | 2012 | CCF | Fisheries Harbor, Ambalangoda. | - | 2012-03-15<br>2012-04-15 | 2012-03-20 |
| 10 | Prof. Raj Somadewa | 2012 | PGIAR | Manabarana Viharaya in Siyambalanduwa. | 3m*3m | 2012-05-28<br>2012-07-28 | 2012-05-30 |
| 11 | Prof.Pushparathnam | 2015 | Univarsity | Kopay sankilian fort Excavation | 6m*4m | 2015-05-01 | 2015-05-07 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | of Jaffna | | | 2015-05-25 | |
| 12 | Prof.Prishantha Gunawardhana | 2015 | CCF | Shiva Dewala in Polonnaruwa. | 2m*4m<br>2m*6m | 2015-08-26<br>2015-09-15 | 2015-08-31 |
| 13 | Prof. Raj Somadewa | 2016 | PGIAR | Yatawala Dagaba Premises Tissamaharama | (26'*26') | 2016-03-02<br>2016-11-02 | 2016-05-06 |
| 14 | Prof.Prishantha Gunawardhana | 2017 | CCF | Kiribathwehera | 15m*4m Trench | 2017-01-01<br>2017-12-31 | 2017-03-08 |
| 15 | Prof.Prishantha Gunawardhana | 2017 | CCF | Pankuliya Pabbatha vihara | 8m*8m | 2017-01-01<br>2017-12-31 | 2017-03-08 |
| 16 | Prof.Prishantha Gunawardhana | 2017 | CCF | Wijeyarama in Abhayagiri Project Galpalama. | 80m*10m | 2017-01-01<br>2017-12-31 | 2017-03-08 |
| 17 | Prof.Prishantha Gunawardhana | 2017 | CCF | Shiva Devala No.2 | 5m*2m | 2017-01-01<br>2017-06-30 | 2017-02-16 |
| 18 | Prof.Prishantha Gunawardhana | 2017 | CCF | Shiva Devala No 1 | 1.0*20.75*1.5m | 2017-02-01<br>2017-05-31 | 2017-02-16 |
| 29 | Prof.Prishantha Gunawardhana | 2017 | CCF | Kandegama Dhananjaya raja Maha vihara Aralagamvila Maha oya rd | 1m*18m<br>26m*26m | 2017-02-01<br>2017-05-31 | 2017-02-16 |
| 20 | Prof.Prishantha Gunawardhana | 2017 | CCF | Mahathalakolawewa,Purana raja maha vihara, medirigiriya | 1m*20m | 2017-01-01<br>2017-03-31 | 2017-02-16 |
| 21 | Prof.Prishantha Gunawardhana | 2017 | CCF | Demala Mahseya in Polonnaruwa. | 10m*4m*4m<br>60m*3m*1m | 2017-01-01<br>2017-12-31 | 2017-02-16 |
| 22 | Prof.Prishantha Gunawardhana | 2017 | CCF | East West Ancient Street Polonnaruwa | 1m*24m<br>510*45m | 2017-01-01<br>2017-10-31 | 2017-02-16 |
| 23 | Prof.Prishantha Gunawardhana | 2017 | CCF | Readout Bastisn of fedrick fort in Trincomalee | $30m^2*40m^2$<br>$1200m^2$ | 2017-03-01<br>2017-08-01 | 2017-03-16 |
| 24 | Prof.Prishantha | 2017 | CCF | Moar in fronmt of thefedrick fort in Trincomalee | $2m*30m*120m^3$ | 2017-01-01 | 2017-03-16 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | Gunawardhana | | | East to Kaneshwar kavil west to Redrich ford | | 2017-05-30 | |
| 25 | Prof.Prishantha unawardhana | 2017 | CCF | Thissawa Raja Maha viharaya Panduwasnuwara | 18.5m*18.5m | 2017-01-01<br>2017-12-31 | 2017-03-24 |
| 26 | Prof.Prishantha Gunawardhana | 2017 | CCF | Yapahuwa Bangalapitiya Monastry | 2*30m<br>2*2m | 2017-04-06<br>2017-12-31 | 2017-04-24 |
| 27 | Prof.Prishantha Gunawardhana | 2017 | CCF | Yapahuwa Archeological and Site Staircase | 100m*4m | 2017-04-06<br>2017-12-31 | 2017-04-24 |
| 28 | Prof.Prishantha Gunawardhana | 2017 | CCF | Yatala Raja maha viharaya, Thissamaharama | | 2017-01-01<br>2017-09-01 | 2017-03-08 |
| 29 | Prof.Prishantha Gunawardhana | 2017 | CCF | | 1*100M | 2017-04-06<br>2017-12-31 | 2017-04-24 |
| 30 | Prof.Prishantha Gunawardhana | 2017 | CCF | | 30*60*2m | 2017-04-06<br>2017-12-31 | 2017-04-24 |
| 31 | Prof.Pushparathnam | 2017 | University of Jaffna | Nagabaduvan kilinochchi distric | 6*4*3m | 2017-03-27<br>2017-10-31 | 2017-04-04 |
| 32 | Prof.Prishantha Gunawardhana | 2017 | CCF | Vattaram Raja Maha viharaya | 15*10*25m | 2017-06-08<br>2017-12-31 | 2017-06-19 |
| 33 | Prof.Prishantha Gunawardhana | 2018 | CCF | Vilgamvehera Stupa in Trincomalee | $360m^2$ | 2017-01-01<br>2018-04-30 | 2017-04-24 |
| 34 | Prof.Prishantha Gunawardhana | 2018 | CCF | Gal viharaya in Polonnaruwa | $100*2*0.5m^3$ | 2018-01-01<br>2018-06-30 | 2018-01-10 |

**පුරාවස්තු පිළිබඳ වාර්තා නොපැවැත්වීම, වාර්තා නොකිරීම හා භාර නොදීම**

| | කැණීම් බලපත්‍ර ලාභියාගේ නම | වර්ෂය | | | | | | | | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | |
| 01 | කුසුම්සිරි කොඩිතුවක්කු මහතා | 02 | 02 | - | - | - | - | - | - | - | - | - | - | - | 04 |
| 02 | මහාචාර්ය ගාමිණී අධිකාරි මහතා | 01 | - | - | - | - | - | - | 03 | 02 | - | - | - | - | 06 |
| 03 | මහාචාර්ය සුදර්ශන් සෙනෙවිරත්න මහතා | 01 | - | - | 01 | 02 | 01 | - | - | - | - | - | - | - | 05 |
| 04 | ආචාර්ය ප්‍රිශාන්ත ගුණවර්ධන මහතා | 01 | 02 | 01 | - | 01 | - | - | - | - | 02 | - | 35 | - | 42 |
| 05 | මහාචාර්ය නිමල් ද සිල්වා මහතා | - | 01 | 03 | 03 | 01 | - | 01 | 01 | - | - | - | - | - | 10 |
| 06 | සී.ආර්.විතානාච්චි මහතා | - | 01 | - | - | - | - | - | 01 | - | - | - | - | - | 02 |
| 07 | මහාචාර්ය ජගත් වීරසිංහ මහතා | - | - | - | - | - | | 02 | 02 | 06 | - | 01 | - | - | 11 |
| 08 | මහාචාර්ය සුමනසිරි වච්චගේ මහතා | - | - | - | 01 | - | - | - | - | - | - | - | - | - | 01 |
| 09 | මහාචාර්ය අනුර මනතුංග මහතා | - | - | - | 01 | - | - | - | - | - | - | - | - | - | 01 |
| 10 | මහාචාර්ය රාජ් සෝමදේව මහතා | - | - | - | - | 02 | 02 | 03 | 01 | 01 | 02 | 05 | 03 | - | 19 |
| 11 | ආචාර්ය ආර්.එම්.චන්ද්‍රරත්න මහතා | - | - | - | - | 01 | - | - | - | 01 | - | 01 | - | - | 03 |
| 12 | ආචාර්ය ඩී.කේ.ජයරත්න මහතා | - | - | - | - | - | 01 | - | - | - | - | - | - | - | 01 |
| 13 | ඩී.පී.ගම්ලත් මහතා | - | - | - | - | - | 02 | - | - | - | - | - | 01 | - | 03 |

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 14 | ආචාර්ය රෝසි සෝලංගආරච්චි මිය | - | - | - | - | | 01 | - | - | - | - | - | - | - | 01 |
| 15 | ආචාර්ය පියතිස්ස සේනානායක මහතා | - | - | - | - | | | | | 01 | | | | | 01 |
| 16 | මහාචාර්ය පුෂ්පරත්නම් මහතා | - | - | - | | | | | | | 01 | 01 | 01 | - | 03 |
| 17 | ආචාර්ය තුසිත මෙන්ඩිස් මහතා | - | - | - | | | | | | | 01 | | 01 | | 02 |
| 18 | ශ්‍රියානි හතුරුසිංහ මිය | - | - | - | | | | | | | | 02 | | | 02 |
| 19 | ආචාර්ය මංගල කටුගම්පල මහතා | - | - | - | | | | | | | | 01 | | | 01 |
| 20 | මහාචාර්ය ආරිය ලගමුව මහතා | - | - | - | | | | | | | | | 01 | | 01 |
| 21 | ආචාර්ය එස්.යූ.දැරණියගල මහතා | - | - | - | | | | | | | | | 01 | | 01 |
| 22 | ඩබ්.එම්.ටී.බී.විජේපාල මහතා | - | - | - | | | | | | | | | 01 | | 01 |
| | එකතුව | | | | | | | | | | | | | | -------<br>121<br>==== |